ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 ශුද්ධාසන කොමිසමේ වෙසක් දින පණිවුඩය


08 යහපත් එඬේරා භාවනාශීලි සොහොයුරියෝ


12 පිබිදෙව් කිතුනුවනි පිබිදෙව්



# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07


ශුද්ධාත්මාගමන මංගලෝත්සවය



"එකම ආත්මයාණන් තුළ එකම ශරීරයක් වන ලෙස ප්‍රසාද ස්නාපනය ලැබීමු."

ක්‍රි.ව. 2013 ක් වූ මැයි 19 ඉරිදා 147 වෙළුම 49 කලඹ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# ධර්මදානයට නව මෙහෙයුමක් !

**කොළඹ අගරදගුරු වසමේ 2013 වර්ෂය සඳහා පැවැති මුල්ම පූජක හමුව ඉකුත් සඳුදා හා අඟහරුවාදා දිනවල කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.**

- ධර්මදාන කටයුතු වඩාත් සවිමත් කරන්නට 'සදහම් පෝෂණ මෙහෙවර' නමින් නව මෙහෙයුම් කමිටුවක් !
- අවශ්‍යතා මත විවාහක තේවාචාර්යවරුන්ටත් ඉඩකඩ
- නිවාස බැහැදැකීමට මීසම් සේවයේදී ප්‍රමුඛස්ථානය
- පැවිදි නිකායන්ට ධර්මදානයේදී වැඩි වගකීමක්

**ස්වෙච්ඡාවෙන් මීසම්වල පූර්ණකාලීනව ධර්මදානයේ නියැලෙන්නට ගිහි ධර්මදූත සේවාවක් !**

- දෙව්මැදුරු ජුබිලි හා මංගල්‍යවල උත්සවශ්‍රීය වෙනුවට සරල, චාම් හා ආධ්‍යාත්මික බවින් පිරුණු බවක්
- දරුවන් හා තරුණයන් සඳහා ධර්මෝපදේශ, සුබාරංචි අධ්‍යයන නිවාඩු කඳවුරු
- දුෂ්කර ආර්ථික තත්ත්වයන්ගෙන් පෙළෙන මීසම්වාසීන් කෙරේ සංවේදී අවධානයක්



## වෙසක් සමයේ උත්සව සැරසිලි හිතුමතේ එපා!

අන්‍ය ආගමික උත්සව පවත්වන මේ මාසය තුළ හිතුමතේ එම දහම් කොඩි ප්‍රදර්ශනයත්, දන්සැල් පැවැත්වීමත් යනාදියේදී ඔවුනට සිත් තැවුල් නොවන අයුරෙන් හා ඔවුනගේ ආමිස පූජා වලට හානියක් නොවන පරිද්දෙන් කටයුතු කරන ලෙස හා අදාළවුවොත් එකී වගකිවයුත්තන්ගෙන් අවසර ගන්නා ලෙස කතෝලිකයනට සසුන් අංශ අවවාද කරයි.

**දේව සේවක අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ 25 වන අනුස්මරණය අළලා අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන් විසින් කැරෙන දැනුම්වත් කිරීම ලබන සතියේ**

## කෝච්චියේ මඩු ගමනට දසතින් පැසසුම්

විසිපස් වසරකට පසු උතුරත් - දකුණත් යා කරමින් මැදවච්චියේ සිට මඩුපාර දක්වා ඉදි වූ දුම්රිය මාර්ගය ඉකුත් සඳුදා විවෘත විය.

කතෝලික ජනතාවගේ අති පූජනීය පුදබිමක් වන මරුද මඩු දේවස්ථානය කරා ඇදී එන දහස් සංඛ්‍යාත බැතිමතුන්ට මෙය පහසුවක් වන අතර මැයි 24 සිට 26 දක්වා දකුණු කොළඹ කලාපීය ධර්ම විවේකයට එක්වන සැදැහැවතුන්ටද ප්‍රවාහන පහසුකම් ලබාගැනීමේදී මෙය පහසුවක් වනු ඇත.




## ගරු බොනිපස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා සගසුව දිනයි

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා



රක්වාන මීසම් සේවක ලෙස 2008 සිට සේවය කළ ගරු බොනිපස් පැට්‍රික් බැස්ටියන් නි.ම.නි. පියතුමා මැයි 10 දින සගසුව දිනීය.

1947 ජූනි 05 අම්පිටියේ උපත ලද එතුමා 1978 ජූලි 19 පූජකවරය ලැබීය. සමාජය හා සාමයික කේන්ද්‍රය, රෝහල් උපාධ්‍ය ලෙස කටයුතු කර නිලාවැලි හා කොච්චිකඩේ, තෝප්පුව මීසම් සේවක ලෙස සේවය කළේය. මැයි 13 වැනිදා මරදාන පාතිමා දෙව්මැඳුරේ පැවති දිව්‍ය යාගයෙන් පසු අවසන් කටයුතු බොරැල්ල කනත්තේදී සිදුකැරිණ. එතුමාට සග සුව පතමු.

## සෑම සිකුරාදාම දේව මෙහෙයක්

මාරවිල සිරිකුරුස ජාතික සිද්ධස්ථානයේ සෑම මසකම පළමු සිකුරාදා දින පැවැත්වෙන දේව මෙහෙයන්ට අමතරව සෑම සිකුරාදා දිනකම පෙ.ව. 11.00 ට සහ සවස 4.00 ට දේව මෙහෙයන් පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි සිද්ධස්ථාන පාලක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා ප්‍රදීපයට පැවසීය.

**"පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි" (ශු. ජුවාම් 20:19-23)**

## ජෝශප් වාස් ආදි සිසු හමුව අදයි

වෙන්නප්පුව ජෝශප් වාස් ආදි සිසුන්ගේ 'වාසියන්ස් සුහ සාධක සංගමයේ' සංවත්සර උත්සවය 19 ඉරිදා (අද) වෙන්නප්පුව සන් පාවුලෝ ශාලාවේදී පැවැත්වේ.

**රෙක්ස් හැරිසන්**

## සුබාසිංසන






අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ උපන් දිනය මැයි 20 දාටද, මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය මැයි 21 වැනිදාටද, මඩකලපුව රදගුරු අතිඋතුම් පොන්නයියා ජෝශප් හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය හා ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අතිඋතුම් ජෝශප් ස්පිටේරි අගරදගුරු හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය මැයි 24 වැනිදාටද යෙදේ. එතුමන්ට සමිඳු ආසිරි බහුලව ලැබෙන ලෙස ප්‍රදීපය සුබාසිංසන පුදකරයි.

## ළ.ක්‍රි.වී. ජාතික අනුශාසක සම්මේලනය

ශ්‍රී ලංකා ළ.ක්‍රි.වී. ව්‍යාපාරයේ වාර්ෂික අනුශාසක සම්මේලනය මෙවරද නව තේමාව වන 'ගමට රටට එළිය මමයි මෙමට එළිය ළ.ක්‍රි.වී. යයි' යන තේමාව ඔස්සේ වසරේ ක්‍රියාකාරකම් පෙළගස්වන්නට හඳුනා ගන්නට සියලුම අනුශාසිකාවන් එක්විය.

මග්ගොන සා. විසෙන්ති නිවාසයේ දී සුබෝධි ආයතනයේ අධ්‍යක්‍ෂ ගරු මර්වින් ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් හා විවිධ ආගමික නායකයින් පූජකවරුන් හා පැවිදි සොයුරු සොයුරියන්ගේ සහභාගිත්වයෙන් සාර්ථක ලෙස පැවැත්විණි.

මේ සඳහා ලංකාව පුරා විසිරි සිටින අනුශාසක අනුශාසිකාවන්ගෙන් 145 ක් සහභාගී වූහ. වාර්ෂික අනුශාසක සම්මේලනයේ සියලු කටයුතු ළ.ක්‍රි.වී. ජාතික අධ්‍යක්‍ෂ ගරු නිලුෂන් ප්‍රනාන්දු නි.ම.නි පියතුමාගේ අධීක්‍ෂණයෙන් විශාල පිරිසකගේ සහයෝගයෙන් සිදුකැරිණ.

**ගරු ලක්මාලි පැවිදි ඩියුරිය**



හාල්දඩුවන සා. මරියා දහම් පාසලේ දහම් ගුරු භවතුන් දහම් සේවය සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේට කැප කිරීම මීසම් සේවක ගරු ප්‍රැන්සිස්ලාවුස් පියතුමන් විසින් පසුගියදා දිව්‍ය පූජා යාගයේදී සිදුකරන ලදි. ඉන් අනතුරුව දහම් ගුරු භවතුන් සැමදෙන ගරු පියතුමන් සමග මෙසේ කැමරාවට මුහුණ දුන්හ.

**ටෙක්ලා කල්දේරා**

# අන් අයට ආලෝකයක් විය යුතුයි

## වත්තල සා. ජෝශප් විදුහල් දිනදී විශ්‍රාමික අගරදගුරු හිමි පවසයි

**මේ පාසලට ඇතුලු වීමට වරම් ලැබීම සිසුවකු වශයෙන් ජීවිතයේ ලැබූ උතුම් වරමක්. ඔබගේ හැසිරීම, කාරුණික වදන්, අන් අයව හඳුනා ගැනීම තුළින් අන් අයට ආලෝකයක් විය යුතු යැයි විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ, වත්තල සා. ජෝශප් විදුහලේ විදුහල් දිනය හා ජුසේ මුනි මංගල දිව්‍ය යාගයේදී පැවසූහ.**



විදුහල්පති ගරු රංජිත් අන්ද්‍රාදි පියතුමා, මෙම උත්සවය සාර්ථක ලෙස සංවිධානය කිරීම ගැන උප විදුහල්පති ගරු තමල් කුමාර පියතුමා, ආචාර මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුලු දෙමාපියන් වෙත සිය කෘතඥතාවය පළ කළේය. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක සහ එඬේරමුල්ල මීසම් සේවක ගරු ප්‍රසන්න රොහාන් පියතුමන් ආරාධිතයන් අතර වූහ.

**පද්මිණි නානායක්කාර**

## ක්‍රිස්තු අනුගාමිකයින් ලෙස සාමය බෙදන්න

සැමට සාමය බෙදන්න. ක්‍රිස්තුන් වහන්සේ සැමට ප්‍රේම කරමින් සාමය බෙදා දුන්නා. උන්වහන්සේගේ ශ්‍රාවකයින් සාමය බෙදා දුන්නා. ප්‍රේමයෙන් උපදින්නෙ සාමය. අපටත් පුළුවන් උන්වහන්සේගේ ශ්‍රාවකයින් වන්නට. ඒ නිසා ක්‍රිස්තු ශ්‍රාවකයින් ලෙස සාමය උදෙසා කැප වෙමු.' යයි තලවිල මීසම් සේවක ගරු පයස් නිහාල් ප්‍රනාන්දු පියතුමා පැවසීය.

ගරු පියතුමාගේ උපන් දිනදා නාච්චිකල්ලිය කරව ගම්මානයේ පැවති උත්සවයේ දී එතුමා එසේ පැවසීය. හලාවත පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමා ද තලවිල සහයක පියවරුන් ද මේ අවස්ථාවට සහභාගි වූ අතර නාච්චිකල්ලිය ග්‍රාමයේ දරුවන් පිරිසකට අධ්‍යාපන කටයුතු වෙනුවෙන් රු. 1000/- බැගින් මාසික ශිෂ්‍යාධාර වැඩ සටහනක් පවත්වාගෙන යන ආධාර කණ්ඩායමක ක්ලින්ටන් ප්‍රනාන්දු මහතාද සහභාගි විය.

ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ හලාවත පදවි නියෝජිත ජූඩ් ශාන්ත තිසේරා මහතා මෙම කටයුතු සාර්ථක කර ගැනීමට දායකත්වය ලබාදුනි. මෙහි දැනට අර්ධ දෙව්මැඳුරක් තනා වේලක්කන්නි දේවමාතාවට කැප කර ඇත. ගම්මානයේ පවුල් 40 ක් පමණ ජීවත් වෙති. තලවිල මීසම් සේවක පියතුමන් විසින් ගම්මානයේ සියලුම දෙනා සඳහා දිවා ආහාරය ලබාදෙන ලදී.

**ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු**



ගල්කිස්ස සා. අන්තෝනි මීසමට නව සහයක ගරු ප්‍රියාන් සුභාෂ්ණ තිසේරා පියතුමාව ගල්කිස්ස සා. අන්තෝනි මීසම් සේවක ගරු ලියෝ පෙරේරා පියතුමා සහ මීසම් සභාවේ ලේකම් ටෝනි ඔබේසේකර මහතා ඇතුලු මීසම් ජනතාව පිළිගෙන දේවස්ථානය කරා කැඳවා ගෙන ගිය අයුරු.

**රොහාන් ඩැනියල්**

## නව කිතුනු දූත සේවා සභාවට පුහුණුවක්

මල්කඩුවාව පාතිමා දේවස්ථානයේ නව කිතුනු දූත සේවා සභාව සඳහා පුහුණු වැඩසටහනක් ඉකුත් දා කුරුණෑගල මීසම් සේවක ගරු ජෙරම් පෙරේරා පියතුමාගේ ආරාධනයෙන් කුරුණෑගල පදවි කිතුනු ඒකක පෝෂණ කමිටුවේ අධ්‍යක්‍ෂ ගරු රුෆස් තැලිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සහ කිතුනු ඒකක පෝෂණ කමිටුවේ සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් මල්කඩුවාව පාතිමා දේවස්ථානයේදී පැවැත්විණි.

**ශානක මුහන්දිරම්**

## ජුසේ මුනි චරිතය හඳුනා ගැනීම වැදගත්



ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ ජීවිතාදර්ශය හරිහැටි හඳුනාගෙන ඒවා අනුසාර කරන්නැයි මීගමුව මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා කෙරවලපිටිය සා. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල උලෙළේදී පැවසීය.

මංගල කටයුතු මීසම් සභාව ප්‍රමුඛ මීසම් සේවක ගරු රෝෂන් ප්‍රසාද් පියතුමන් විසින් සංවිධානය කරන ලදි.

**සිසිල් පෙරේරා**

## වාරියපොල සා. ජුසේ මුනිඳුන්ගේ මංගල්ලෙට නව දෙව්මැඳුරක් හා නව පූජාසනයක්

ශු. ජුසේ තුමා ශුද්ධවූ පවුලේ සුරැකි පියා පමණක් නොව අප සැමගේ සුරැකි පියා ලෙස පිළි ගනිමු යැයි කුරුණෑගල අනුනායක අතිගරු ඔස්ටින් මාකස් පියතුමා පැවසීය.

කටුපොත මීසමේ වාරියපොල දෙව් මැඳුරේ ශු. ජුසේ මුනිඳුන්ගේ මංගල්‍යය මෙවර මහත් අභිමානයෙන් පැවත්විය. නවීකරණය කරන ලද නව දෙව්මැඳුර සහ නව පුදසුන එදින ආසිරි ගැන්විණ. සන්ධ්‍යා මෙහෙය මිල්ලව කණිටු දෙව්සත්හල් අධ්‍යක්‍ෂ ගරු නිහාල් ඕබ්‍රිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ.

කටුපොත මීසම් සේවක ගරු මාකස් අනිල් කුමාර් පියතුමා මංගල්‍යයට සූදානමක් ලෙස පැවැත්වූ නුවාන පහක් කිතුනු ඒකකයන්හි ජන සහභාගිත්වයෙන් සංවිධානය කෙරුනි. පැවිදි සොයුරියන්ගේ දායකත්වයෙන් වාරියපොල කිතුනු ජනතාවගේ සහභාගිත්වයෙන් මංගල කටයුතු සාර්ථකව සිදුකැරිණ.

**මියුරියල් බර්නදෙත් ඩයස්**



වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය මෙවරද මහත් උත්සවශ්‍රිනේ පසුගියදා පැවැත්විණි. මෙවර මංගල්‍ය දින පැවැති මංගල්‍යය දිව්‍ය පූජාව සිදුකරනු ලැබුවේ වෙන්නප්පුව ග්‍රාමයේ උපත ලැබූ පූජාප්‍රසාදින් වහන්සේලාගේ සහභාගිත්වයෙන් එවීම විශේෂයෙනි. හලාවත පදවි අනුනායක අතිගරු පීටර් චාල්ස්, පදවි භාණ්ඩාගාරික අතිගරු ලූක් නෙල්සන් ඇතුළු පියතුමන් පහළොස් නමක් මේ සඳහා සහභාගි වූහ. වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමන්ගේ මූලිකත්වයෙන් ගරු සුජාන් නිශ්ශංඛ, ගරු ජානක නිශාන්ත යන සහයක පියතුමන්ලාගේ සහභාගිත්වයෙන් වෙන්නප්පුව මීසම් ජනතාව මංගල්‍යය කටයුතු මනාව සංවිධානය කොට තිබිණි. ඡායාරූපයෙන් දැක්වෙන්නේ පූජා ප්‍රසාදින් වහන්සේ පහළොස් දෙනාගේ සහභාගිත්වයෙන් මංගල්‍යය දිව්‍ය පූජාව සිදුවූ අයුරුයි.

**ප්‍රියන්ත පීටර්ස්**

## මැල්සිරිපුර අවමංගල්‍යාධාර සමිති සංවත්සරය

මැල්සිරිපුර සිරි හද අවමංගල්‍යාධාර සමිතියේ 9 වෙනි සංවත්සර මහා සභා වාරයේදී පත්වූ නිලධාරි මඬුල්ල මෙසේය.

අනුශාසක - ගරු මයිකල් කොස්තා පියතුමා, සභාපති - තුෂාර පෙරේරා, ලේකම් - කේ. පී. අයි. ඇලන් රෝස්. භාණ්ඩාගාරික - එන්. ඒ. අල්මේදා, උප ලේකම් - නිව්ටන් ස්ටැන්ලි, කාරක සභිකයින් - දමයන්ති, රෝමණි ගුණවිජය, ඇන්ටන් චමින්ද, ආර්. පියසේන, ඇනට්, මේරි මැටිල්ඩා, ක්‍රිස්ටි ප්‍රනාන්දු, ප්‍රියන්තා පෙරේරා, ගිණුම් පරීක්‍ෂක වරු - ටී. ඇම්. ලේකම්ගේ, ජී. ඇන්. ලාවුස් ප්‍රනාන්දු

**නිමල් අල්මේද**

## *පියතුමන්ගේ අකල් වියෝව දේවකැමැත්ත නොව, අතපසුවීමේ අභාග්‍යයයි*

හදිසි අනතුරක් හේතුවෙන් තම දේව සේවය අවසන් කොට අප අතරින් සමුගෙන ගිය ස්වර්ගස්ථ වු අතිගරු ලෙනාඩ් රණසිංහ පියතුමාගේ අකල් වියෝව දේව කැමැත්ත නොවන බව තම පුද්ගලික හැඟීම බවත්, එය මනුෂ්‍ය ජීවිතයේ සිදු වූ අතපසුවීමේ අභාග්‍ය සම්පන්න සිදුවීමක් බවත් මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණෝ පැවසූහ.

රාජගිරිය සිරිහද දේවස්ථානයේදී ස්වර්ගස්ථ වු පියතුමන් වෙනුවෙන් පැවති දේව මෙහෙයට එක්වෙමින් රදගුරු හිමි මෙලෙස පැවසීය.

**චින්තක ද මැල්**

## සුදතුම් මංගල්ලය හලාවතදී

ශුද්ධාත්මයාණෝ වැඩම කිරීමේ මංගල්‍යය, හලාවත කාර්මෙල් මාතා ආසන දෙව් මැඳුරේ 18 වන සෙනසුරාදා රාත්‍රී 9.00 සිට අළුයම 2.00 දක්වා පැවැත්වේ.

හලාවත මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් මෙය පැවැත්වේ.

**පර්සි ප්‍රනාන්දු**

## පැවිදි සොයුරියගේ සේවයට උපහාර පිදේ

ඉකුත්දා රත්නපුර ජේසු බිළිඳුගේ කන්‍යාරාම විදුහලේ සේවය කළ ගරු පැට්සි සොයුරිය විදුහල්පතිනිය ලෙස උසස්වීමක් ලැබ ගාල්ල ශ්‍රී හෘද කන්‍යාරාම විදුහලට මාරුවීමක් ලැබුවාය.

ඒ නිමිති කොට ගෙන රත්නපුර සා. පේදුරු, පාවුලු දහම් පාසල් ආචාර්ය මණ්ඩලය විසින් උපහාර පිදීමක් හා සිහිවටන ත්‍යාගයක් ද පිරි නමනු ලැබින. රත්නපුර මීසම් දියණියකවූ ඇයගේ සේවාව අගයමින් මීසම් සේවක ගරු රන්ජන්මාල් මොරායස් පියතුමා ඉදිරි ගමනට සුබ පැතීය.

ගරු පැට්සි සොයුරිය නීලාවේලි, යාපනය හා රත්නපුර දෙමළ මහා විද්‍යාලයේද සේවය කර ඇති අතර සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සේවය කිරීමේ හැකියාවක් ඇති දයාවේ නිකායේ පැවිදි සොයුරියකි.

**තියබොල්ඩ් සමරතුංග**

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2013 මැයි 19 ඉරිදා

# නොසැළකිලිමත් කම සහ නොදැනුවත්කම

නොසැළකිලිමත් ලෙස රිය පැදවීම අද ජාතික විපතක් බවට පත් වී තිබේ. මේ ප්‍රශ්නය ගැන විනිශ්චයකාරවරුන් උසාවි වලදී පළ කරන අදහස් ද නඩු වාර්තා හැටියට නිතර පුවත්පත් වලින් කියවීමට අවස්ථාව ලැබේ. ඒ පමණක් නොවේ. විද්‍යුත් මාධ්‍ය හරහා අලුයම දවසේ පත්තර පිළිබඳ සමාලෝචනයේ දී දවස අරඹන්නේ ද රිය අනතුරු දෙක තුනක වාර්තා සමඟිනි. පොලිස් මාධ්‍ය ප්‍රකාශක සම්බන්ධ කර ගන්නා මේ විද්‍යුත් මාධ්‍ය දිනපතා විමසන්නේ ද පෙරදින ඇති වූ රිය අනතුරු ගැනයි.

නොසැළකිලිමත් ලෙස රිය පැදවීම අතින් මුල් තැන ගන්නා අය කලින් කලට වෙනස් වන බව පෙනේ. කලකදී ටැක්සි රියදුරන්ද, තවත් කලකදී ලංගම රියැදුරන්ද අත්කරගෙන සිටි මෙම තැන දැන් පෞද්ගලික බස් සහ වෑන් රියැදුරන් මෙන්ම ත්‍රී රෝද රථ රියැදුරන් විසින් අත්පත් කරගෙන ඇත.

මේ අතර නොසැළකිලිමත් කමටත් වඩා නොදැනුවත්කමත්, නුසුදුසුකමත් නිසා විශාල වශයෙන් අනතුරු කර ගන්නා පිරිසක් හැටියට මෝටර් බයිසිකල්කරුවන් හඳුන්වා දිය හැකිය. මේ තත්ත්වය පොදුවේ මහාමාර්ගය ප්‍රයෝජනයට ගන්නා හැම දෙනාටම විපතක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මීට පිළියම කුමක්ද? වැඩි වැඩියෙන් පොලිස් නිලධාරීන් යොදවා වැරදි කරන රියැදුරන් අල්ලා දඬුවම් කිරීමද? එයත් අවශ්‍යය. එහෙත් ඊට වඩා තවත් පියවරක් ඉදිරියට තැබිය යුතු බව කාගේත් හැඟීමයි.

අද අලුතෙන් පාරට බසින රියදුරන් වැඩිහරියක් රිය පැදවීම සම්බන්ධ නීතිරීති හෝ සම්ප්‍රදායන් ගැන අවබෝධයක් නැති අය බව බොහෝ විට පෙනී යන දෙයකි. එමෙන්ම බලපත්‍ර තිබුණත් රිය පැදවීමට බැරි අයද එමට සිටින බව පෙනී ගොස් තිබේ. රියැදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන බොහෝ දෙනා සම්මුඛ පරීක්ෂණ වලට කැඳවූ විට වාහන පැදවීමට බැරිකම නිසාම අසමත්වන අවස්ථා ගැන නොයෙකුත් ආයතනවල ප්‍රවාහන කළමනාකරුවෝ සාක්ෂි දරති.

විනයානුකූල රියදුරන්ගේ මහත් හිඟයක් අද පවතී. විනයක් නොමැතිව රිය පැදවීම මරණයට අත වැනීමකි. ඇගේ හයිය හා හදිස්සිය රිය වේගයෙන් පැදවීමට සුදුසුකමක් නොවන බව සමහරුන් වටහා ගන්නේ කවදාද යන්න ප්‍රශ්නයකි. වේග ධාරිතාව වැඩි නවීන වාහන අද වැඩි වැඩියෙන් මහා මාර්ගයේ දක්නට ලැබේ. වේග ධාරිතාව වැඩි සුඛෝපභෝගී වාහන මාර්ගයට ආ පමණින් මාර්ගය ස්වයංක්‍රීයව පුළුල් වන්නේ නැත. අඳ බාල සමහර සෙල්ලක්කාර රියැදුරන් සිතන්නේ තමන්ගේ වේගය අඩු නොකරන්නට අන් අය විමසිලිමත් විය යුතු බවයි. රාත්‍රි කාලයේ අවප්‍රමාණයට විදුලි ආලෝකය පාලනය නොකර ඇස් කඩාගෙන යන සුදු පැහැති ආලෝකය විහිදා ඉදිරියෙන් එන අන් රියැදුරන්ට කරන පීඩනය කොතරම් ද යන්න නොතකා රිය පදවන රියැදුරෝ එමට වෙති. ඒ පරපීඩක මානසිකත්වයේ රියැදුරෝ ශ්‍රී ලංකාව තුළ නම් හිඟ නොවෙත්.

මහා මාර්ග හා අතුරු මාර්ග පිළිබඳව ද නොයෙක් චෝදනා ඇත. කාපට් ඇතිරූ මහා මාර්ගවල වාහන පැදවීම ඉතා පහසු වූවත් පදිකයන්ට කිසිදු මං තීරුවක් එම මහා මාර්ගවල නොමැතිකම විශාල අඩුවකි. පාපැදිකරුවන් හා මෝටර් බයිසිකල්කරුවන් තිබෙන පදික වේදිකා අයිතිකරගෙන ඇත. මේ දේශයේ මං මාවත් වලට පදිකයන් අමතක වූ සැටි අපූරුයි. ඒ නිසාම පදිකයන් අද මහා මාර්ගය මත ගමන් කරන්නට හා පාර මාරු වන්නට නොහික්මුණු ආශාවකින් පෙළෙන බව ද පෙනේ. අවිනීතකම සැම තැනින්ම දිස්වෙයි. විනයක් නොමැතිකම තුළ ඉස්මතු වන මමත්වය රියැදුරන් මොහොතේ වීරයන් කර ඇති නිසා යුද්ධයකින් මිය යන සංඛ්‍යාවටත් වඩා විශාල සංඛ්‍යාවක් අද රිය අනතුරු වලින් මිය යන බව මාධ්‍ය පුන පුනා පවසයි.

කුඩා දරුවන්ගේ ජීවිත අහිමි කරන මඟ මරුවන් එන්න එන්නම වැඩි වන සෙයකි. අනාරක්ෂිත දුම්රිය මාර්ග ඔස්සේ රිය ගමන් කරවන්නටත්, තවත් වාහනයක් පසුකර යෑමටත් තමන් තුළ නිවැරදි විනිශ්චයේ ඉලක්කයක් නොමැති නම් එවන් රියැදුරන් අත සුක්කානම රැඳවීම භයංකරය.

අතුරු මාර්ග පිළිබඳවද තත්ත්වය අති ශෝචනීයයි. පෙර කල පුළුල්ව පැවැති අතුරු මාර්ග නව සංකල්පයක් මත කොන්ක්‍රීට් කළ පසු ඉතා පටු වී ඇත. ඒ පමණක් ද? ඒ කොන්ක්‍රීට් පාර දෙපස තවත් අනතුරකි. කොන්ක්‍රීට් ගැට් එහෙම පිටින්ම දැකිය හැකිය. පාපැදිකරුවන් හා පයින් යන්නන්ට තවත් මර උගුලක් මුදල් වියදම් කර ලබා දී ඇති හැඩයි. ප්‍රමිතිය, නිවැරදිකම හා ඵලදායිතාව නොමැතිව කරන්නන් වාලේ මහා මාර්ග, අතුරු මාර්ග සංවර්ධනය නොකළ යුතුයි. වාහන ගැන මෙන්ම මඟී ජනතාව, පාරේ යන ජනතාව පිළිබඳව සිතා මහා මාර්ග, අතුරු මාර්ග සංවර්ධනය කළ යුතුයි. කොන්ක්‍රීට් මාවත් එක වාහනයකට පමණක් සීමා කළේ ඇයි? කලින් වාහන දෙකක් මාරු වුනු අතුරු පාරේ අද මෝටර් බයිසිකල් දෙකකටවත් මාරු විය හැකිද? මේ ප්‍රශ්න වලට ප්‍රමිතියේ පිළිතුරු ලැබිය යුතුමයි.

බර වාහන ගමන් කිරීමට ද නිශ්චිත වේලාවක් නොමැත. බහලුම් වාහන දැන් ගමන් කරන්නේ අධික තදබදය ඇති වේලාවන් වලමයි. ඒ පිළිබඳවද හිත යොමු කොට නිශ්චිත විසඳුමක් තිබිය යුතුමයි. ත්‍රිරෝද රථ රියැදුරන්ට ඉක්මන් ගමන් කොට බව වටහා ගැනීමට සමත් මනසක් ඇති කර ලිය යුතුයි. විනයකින් තොරව රිය පදවන බාල වයස්කාර අය පිළිබඳව දෙමාපියන් ද වගකීම ගත යුතුයි. අනතුරකින් පසු එකිනෙකාට ඇඟිලි දිගු කරනවාට වඩා ප්‍රවේශම් සහිත ප්‍රවේශයට එළඹීමට තරම් හික්මුණු ආධ්‍යාත්මයක් ඔවුන් සතු විය යුතුයි.

තත්ත්වය මෙසේ තිබියදී නොසැළකිලිමත්කම හා නොදැනුවත්කම යන දෙකටම ප්‍රතිකාර කළ යුතුව ඇත. එම නිසා මහ මඟ වාහන පැදවීම පිළිබඳ වැරදිවලට අසුවන අයට දඩ ගැසීම් ආදියෙන් කරන දඬුවම්වලට අතිරේකව නීතියත්, හරි වැරදිත් කියා දීමට පන්ති පැවැත්වීමේ ක්‍රමයක් පොලිස් නිලධාරීන් විසින් පාසල තුළම ආරම්භ කළ යුතු බව අපේ යෝජනාවයි.

**අන්තර් ආගමික සංවාදය සඳහා වන ශුද්ධාසන කොමිසමේ වෙසක් දින පණිවුඩය**

# මානව දිවියට ප්‍රේමකර, ආරක්ෂාකර නංවාලන්න

**සමයාන්තර සංවාදය පිළිබඳ අපෝස්තලික කොමිසම වෙනුවෙන් වෙසක් උත්සවය සමරන ඔබ සියලු දෙනා වෙත හදවතින් සුබ පතමින් අපගේ මිත්‍රශීලි සංවාදය අලුත් කර ගනිමින් ඔබ නියෝජනය කරන විවිධ සම්ප්‍රදායයන් හා සමීප සබඳතා ගොඩනගා ගන්නට මම කැමැත්තෙමි.**

අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සිය ධූරාවලියේ මුල්ම අවස්ථාවේදීම නැවතත් තහවුරු කළේ විවිධ ආගමිකයන් අතර මිත්‍රත්වයේ සංවාදයක පවතින අවශ්‍යතාවයයි. උන්වහන්සේ මෙසේ පැවසූ සේක. සභාව අප සැමට අපගේ ලෝකය හා සමස්ත මැවිල්ල උදෙසා වන වගකීම පිළිබඳවත්, අප ඊට ප්‍රේමකළ යුතු බව හා එය ආරක්ෂා කළ යුතු බවටත් දැනුවත් කරයි. දිළිඳුන් උදෙසා අපට බොහෝ දේ කළ හැකි අතර අවශ්‍යතා සහිත වූවන්ට පීඩිතයන්ට, යුක්තියට නතුවෙමින් ප්‍රතිසංධානය ප්‍රගුණ කරමින් සාමය ගොඩනැගිය හැකිය. (2013 මාර්තු 22 විවිධ ආගමික නියෝජිත හමුව) 2013 ලෝක සාම දින පණිවුඩයේ තේමාව වූයේ 'සාමය ඇතිකරන්නෝ භාග්‍යවන්තයෝය' යන්නයි. එහි මෙසේද සඳහන් විය. 'පොදු යහපත සහ සාමය උදාකර ගැනීමේ මග වන්නේ මිනිස් ජීවිතයට ගරු සරු දැක්වීමට සියලු තත්ත්වයන් යටතේ කටයුතු කිරීමයි. මේ සඳහා දරු පිළිසිඳ ගැනීමේදී පටන් කටයුතු කළ යුතු අතර ඒ සියලු වර්ධනයන් හරහා සොබාවික අවසානය දක්වා එය පැවතිය යුතුය. සැබෑ සාමය උදාකරන්නෝ සියලු බෙදීම් මැද මානව දිවියට ප්‍රේම කරති. එය ආරක්ෂා කරති. මිනිස් ජීවිතයේ පෞද්ගලික හා සාමූහික තත්ත්වයන් වලදී රැක ගනිති. ජීවිතයේ පූර්ණත්වය ළඟාකර ගැනීමට හැකි වන්නේ සාමයේ ඉඩකඩ අනුවය. යමකු සාමයට ප්‍රේමකරන්නේ නම් ප්‍රහාරයන් සහ අපරාධයන් මානව දිවියට එරෙහිව දියත් කරන්නේ නැත (2013 ලෝක සාම දින පණිවුඩය)

කතෝලික සභාව නිරන්තරයෙන් ඔබගේ උදාර ආගමික සම්ප්‍රදායයන්ට ගරුකරන බැව් හඬනගා ප්‍රකාශ කරන්නට මම කැමැත්තෙමි. ඔබගේ ආගමික පොත්පත් වල නිරන්තරව වටිනාකම් වලට අනුකූලතාවය දක්වා ඇති අන්දම අපි දැක ඇත්තෙමු. ජීවිතයට ගරු කිරීම, අවලෝකනය, නිහඬතාවය, අල්පේච්ඡතාවය (වෙබ්රුම්



ඩොමිනි අංක 119) අපගේ උත්තුංග සහෝදරාත්මක සංවාදය මගින් බෞද්ධයන් සහ කතෝලිකයන් ලෙස විශේෂයෙන් ජීවිතයට පොදු ගරුත්වයක් පළකිරීමට කැපවිය යුතුය.

දයාබර බුදුනු මිත්‍රවරුනි, ඔබගේ මුල්ම ශික්ෂා පදය මගින් උගන්වනු ලබන්නේ ප්‍රාණඝාතාවෙන් වැලකී සිටීම වන අතර එමගින් කිසිදු ප්‍රාණියකු මරා දැමීම තහනම් කර ඇත. ඔබේ ආචාර ධර්මයන්ගේ කොනේ ගලක් බඳුව ඇත්තේ සැම සියලු සත්වයන්ට මෛත්‍රී කරුණාව පෑමය. කතෝලිකයන් ලෙස අප විශ්වාස කරන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උගන්වා වදාළ සදාචාරාත්මක ඉගැන්වීම් පද්ධතියයි. දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සහ අසල්වැසියාට ප්‍රේමකිරීම ඒ දෙයාකාරයයි. ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක. 'පියාණන් ලෙස උන්වහන්සේ මට ප්‍රේමකළ සේක. මම ඔබට ප්‍රේම කළෙමි. මාගේ ප්‍රේමය තුළ ස්ථිරව සිටින්න.' නැවතත් මෙසේ දැක්වේ. 'මෙය මාගේ පනතයි. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේමකරන්න (කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 1823) පස්වැනි දේව පනතට අනුව 'මිනී නොමරන්න' යන්න ඔබගේ මුල් ශීක්ෂා පදයට අනුකූලව යෙදෙන්නකි. අති පූජ්‍ය දෙවන වතිකාන මන්ත්‍රණ සභා නිල ප්‍රකාශනයක් වන 'නොස්ත්‍රා ඒතාතෙ' උගන්වනුයේ 'කතෝලික සභාව මේ ආගම්වල සත්‍ය හා ශුද්ධ වූ දෑ කිසිවක් ප්‍රතික්ෂේප නොකරන බවයි (NA2) මට හැඟෙන පරිදි ඒ නිසා බෞද්ධයන් සහ කතෝලිකයන් අපගේ ආගමික සම්ප්‍රදායයන්ගේ උදාරවූ උරුමයන් පදනම් කරගෙන සාමකාමී වාතාවරණයක් තුළ ප්‍රේමය, මිනිස් ජීවිතයට ආරක්ෂාව හා නැංවීම කෙරේ යොමුවිය යුතුය.

අප කවුරුත් දන්නා පරිදි, මේ උත්තුංග ඉගැන්වීම් මිනිස් දිවියේ පූජනීය බව සුරකින අතරම එය විනාශයට පත්කරන ඛේදජනක තත්ත්වයක් කරා යක්ෂයා මගින් යොමුකරනු ලබයි. මිනිස් ජීවිතයට එල්ලවන සැඟවී ගත් විනාශයන් පරදවා අප අනුගාමිකයන් අවදි කරන්නට බෞද්ධයන් හා කතෝලිකයන් ලෙස අප අත්වැල් බැඳ කටයුතු කරමින් පුද්ගලයන් තුළ මෙන්ම සමාජයන් තුළද ආධ්‍යාත්මික සහ ශීලධාර්මික පුනරුත්ථානයක් ඔස්සේ සැබෑ සාමය උදාකරන්නන් ලෙස ප්‍රේමය, ආරක්ෂාව හා නංවාලීම මගින් මිනිස් ජීවිතයේ සියලු බෙදීම් වැලැක්වීමට කැපවෙමු.

දයාබර බෞද්ධ මිත්‍රවරුනි, මානව පවුල පීඩා විඳින දුක් කම්කටොළු නිවාරණය කර මිනිස් ජීවිතයේ පාරිශුද්ධත්වය උදෙසා දයා කරුණාව සහ සහෝදරත්වය අලුත් කර ගනිමින් අපි කටයුතු කරමු. මේ පහන් සිතුවිල්ල තුළ ඔබ සැමට සාමකාමී සහ ප්‍රීතිමත් වෙසක් මංගල්‍යයක් වෙනුවෙන් සුබ පතමු.

**අතිඋතුම් ජීන් ලුවිස් කාදිනල් ටවුරන් හිමි**
සභාපති

**අතිගරු මිගෙල් ආන්ජලෝ අයිසෝ හිසොත් පියතුමා**
ලේකම්

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



# ශ්‍රමය සැමරීමේ දිනය දේශපාලන හස්තයට ගොදුරු වීම අභාග්‍යයක්

## ගාල්ල රදගුරු හිමිපාණෝ පවසති

**අද ශ්‍රමය සැමරීමේ දිනය වුවත් එය දේශපාලන හස්තයට ගොදුරුවීම අභාග්‍යයකි කතෝලික සභාව ශුද්ධ වූ ජුසේතුමන්ව හඳුන්වන්නෙ කම්කරු ජුසේ මුනිඳුන් කියලයි. ඒ වැඩ කරන ජනතාවට සතුට හා සහෝදර ප්‍රේමය බෙදාගැනීම ප්‍රකාශ කරන්නටයි. අප ලද හැකියාව හා තලෙන්තු ගැන ස්වාමින් වහන්සේට ස්තුතිවන්ත විය යුතුයැ'යි ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

ගාල්ල කොටුව අපොස්තලික කාමෙල් පැවිදි සොහොයුරියන්ගේ නිවහනේ සා. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ මංගල්‍යයේ ප්‍රධානත්වය ගනිමින් උන්වහන්සේ එසේ පැවසූහ.

මංගල්‍ය දේව මෙහෙයට පදවි අනුනායක අතිගරු නිහාල් නානායක්කාර. කලාපීය නාහිමි අතිගරු චාල්ස් හේවාවසම් පියතුමන්ද පදවියේ පූජක පැවිදි සංඝයන් ද මීසම්වාසි ජනතාව ද සහභාගි වූහ. ගාල්ල මීසම් සේවක ගරු මයිකල් කොලින් පියතුමා හා කොට්ඨාශ නියෝජිත ෂෙල්ටන් පීරිස් මහතා මෙහෙය සංවිධානය කළහ.

මංගල ජයවර්ධන

## අගරදගුරු හිමි මිරිස් වත්ත බැහැදකී

මැයි 17-19 දක්වා අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මිරිස්වත්ත මීසම බැහැදැකීමට නියමිතය.

මෙහිදි අගරදගුරු හිමිපාණෝ මීසම් සැදැහැවතුන් හා සමිති සමාගම්වල පිරිස් සමග කතාබස් කරති. මිරිස්වත්ත මීසම් සේවක ගරු කිරුල් සිල්වා පියතුමන් විසින් මෙහි කටයුතු සංවිධානය කරනු ලැබේ.



සීදුව මීසමේ වින්සන්ද පාවුලා සමිතියේ සාමාජික සාමාජිකාවන් එක්ව මීසම් වාසින්ගේද සහයෝගය ඇතිව මැල්වත්ත ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පවුලක් සඳහා තනාදුන් නිවස සීදුව මීසම් සේවක ගරු ඇන්ටන් ප්‍රේමලාල් පියතුමන් විසින් ආසිරි ගන්වා විවෘත කරන ලද අවස්ථාව මෙහි දැක්වේ. මෙම සමිතිය මගින් 2011 සහ 2012 වසරවලදීද, නිවාස 2 ක් සාදා පවුල් 2 ක් වෙත ප්‍රදානය කර ඇත. නිවාස 3 චතාරික පරිත්‍යාග ලෙස ප්‍රදානය කෙරිණි. පැටට්‍රීෂියා පෙරේරා මහත්මිය වින්සන්ද පාවුලා සමිතියේ ලේකම් ලෙස සේවය කරයි.

රන්ජිත් ලොකුපෝතාගම

## රාගම දිසා ආචියෙස් මෙහෙය

රාගම දිසාවේ මරිය භටයන්ගේ ආචියෙස් උත්සවය ඇල්දෙනිය දේවස්ථානයේදී පැවැත්විය.

මරිය භටයින් 150 ක් පමණ සහභාගි වූ අතර කඩවත මිසම් සේවක ගරු සුනිල් කුමාර පීරිස් පියතුමා ද සහභාගි විය.

ප්ලැසිඩස් පෙරාඩ්



රත්නපුර කතෝලික ඇංග්ලිකන්, බැප්ටිස්ට්, ගැලවීමේ හමුදාව ලංකා සභා වන ක්‍රිස්තියානි මණ්ඩලයේ ක්‍රිස්තියානි සභා එකමුතුවේ 2013 පාස්කු මෙහෙය මෙවරත් පවත්වනු ලැබුවේ රත්නපුර ගැලවීමේ හමුදා දේවස්ථානයේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි. රත්නපුර රදගුරු හිමිපාණන් යාච්ඤා මෙහෙය පවත්වන අයුරු ඡායාරූපයෙන් දිස්වෙයි.

තියබෝල්ඩ් සමරතුංග

## කනුවන මීසමේ ධර්ම විවේකය

**හමුවිය හැකි බැවින් සමිඳුන් සොයා යන්න. ලඟම සිටින බැවින් එතුමන් අයදින්න තේමාව යටතේ පුරා දින හතලිහක් තුළ දෙවිඳුන්ගේ වචනය මෙනෙහි කරමින් අසීමිත වූ දේව ආදරය අත්විඳමින් එකම සංඝයක්සේ. දේව වරප්‍රසාද බහුල කාලයක් කනුවන මීසම්වාසි ජනතාව අත්දුටහ.**

මීසම් සේවක පියතුමන් ඇතුළු පියවරුන් ගණනාවකගේ අර්ථාන්විත දේශනා සහ දේව වචනයෙන් පෝෂණය වන්නට හැකි වුනි. අවසන් දින අර්ධ රාත්‍රි මෙහෙයක් ද, පොදු පාපොච්චාරණය ඇසීම්ද සිදුවිය. වැඩ සටහන් මෙහෙය වූ සියලුම පියවරුන්ගේ අභිප්‍රාය වූයේ 'එදා ඊශ්‍රායෙල් ජනතාව රතු මුහුදින් එතෙර වී කිරියෙන් පැණියෙන් ඉතිරෙන දේශයකට ගියාසේ' අපත් පාපයෙන් එතෙර වී අලුත් ජීවිතයකට පියනග නු දැකීමය.

කමනි පිගේරා

## මොරටුව උයන මංගල උලෙළ

1959 දී අතිඋතුම් 12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ශුද්ධ වූ ජුසේ මුනිඳුන් කම්කරුවන්ගේ නාම සාන්තුවරයා ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ බව බොරැල්ල ඇක්වයිනස් විද්‍යායතනයේ ගරු දර්ශන ජයමාන්න පියතුමා පැවසීය.

උයන සා. ජෝශප් දෙව්මැඳුරේ 115 වන වාර්ෂික මංගල දිව්‍ය මෙහෙය පැවති මෙම අවස්ථාවට ගරු ලූෂන් පෙරේරා, ගරු ෆිලිෂියන් ප්‍රදිනාන්දු යන පියවරුන්ද සහභාගි වූහ. සවස ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ ප්‍රතිමාව රැගෙන වීදි සංචාරය කරන ලදි.

මීසම් සේවක ගරු බර්ට්‍රම් රන්ජිත් සහ සහයක රන්ජන් ප්‍රියදර්ශන පියතුමන් විසින් මංගල උලෙළ සංවිධානය කරන ලදි.

රන්ජිත් කුරේ

## සලාපුර සා. මරියා 80 වසරට සංගීත ප්‍රසංගයක්

හලාවත සා. මරියා මහා විද්‍යාලයට ආධාර පිණිස පැවැත්වෙන මේරියන්ස් ෆෝ මේරියන්ස්, මේරියන්ස් සංගීත කණ්ඩායමේ සංගීත ප්‍රසංගය, මැයි 18 සෙනසුරාදා විදුහල්පති ගරු සඳලාල් සහෝදර තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

80 වෙනි සංවත්සරය වෙනුවෙන් පැවැත්වෙන මේ සංගීත ප්‍රසංගයට දිවයිනේ විසිරී සිටින සියලුම ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහභාගී වන ලෙස විදුහල්පති සහෝදර තුමා ආරාධනය කරයි.

පර්සි ප්‍රනාන්දු



මත්තුමගල ශ්‍රී හෘද දෙව්මැඳුරේ දහම් පාසල් වේලාවේදී දහම් පාසල් දූ දරුවන්ගේ දෙමාපියන් නිකරුණේ රැඳී සිටින නිසා ඒ අයට බයිබල් පංතියක් පැවැත්වීමට මීසම් සේවක ගරු ඇන්සලම් ශිරාන් පියතුමා කටයුතු යෙදීය. මේ එහි අවස්ථාවකි.

ටී. ක්‍රිෂාන් ප්‍රනාන්දු

## ඩිජ්නා මුනි මංගල්ලය අදය

මානසික හා ස්නායු ආබාධිතයින්ගේ සුව සහනයේ සාන්තුවරිය ශු. ඩිජ්නා මුනිශ්වරියගේ 15 වන වාර්ෂික මංගල්‍යය මැයි 19 වන ඉරිදා රාජකදළුව අත්තංග නය දෙව් මැඳුරේදී හලාවත පදවියේ භාණ්ඩාගාරික අතිග රු ලූක් නෙල්සන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

පර්සි ප්‍රනාන්දු

## උණලීය උත්ථාන වූ ස්වාමින් වහන්සේගේ දේවස්ථානය



කුරුණෑගල සිට කුලියාපිටිය මාර්ග යේ පූගල්ල හංදියෙන් දකුණට හැරී කි.මි. 1 ක් පමණ දුරින් පිහිටි උණලීය ග්‍රාමයේ උත්ථාන වූ ස්වාමින් වහන්සේට කැප කරන ලද දේවස්ථානය පිහිටා ඇත.

පුදබිමක අසිරිය

උණලීය ග්‍රාමය තුළ දේවස්ථානයක් ගොඩනැංවීම සඳහා ඉඩමක් මිළදීගෙන ඇත්තේ 1989 වසරේ මැයි මස 1 වන දිනදීය. 'උණලීය එස්ටේට්' නමැති රූඩ් 2 ක ප්‍රමාණයෙන් යුත් ජෙරි ට්‍රෙසට් ද සිල්වා විජේරත්න නමැති අයට අයත් මෙම ඉඩම කුරුණෑගල රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් විසින් ලබාගෙන ඇත. එහි වටිනාකම රු. 500/= කි.

1982 වසරේ දී උණලීය. දැනට දේවස්ථානය ඇති භූමියේ පොල් අතු මඩුවක් සාදා එහි දහම් පාසල් පවත්වා ඇත. යාච්ඤා කිරීම, ශු. පැය වැනි භක්ති අභ්‍යාසයන්ද මේ ස්ථානයේ සිදුකර ඇති අතර සෑම මසකම පළමු වන සිකුරාදා දින දිව්‍ය පූජාවද පවත්වා ඇත. 1995 දී නව දේවස්ථානයකට මුල්ගල තබන ලදුව, 1996 වසරේ සැප්තැම්බර් මස 06 වන දින අති උතුම් රේමන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් විසින් දේවස්ථානය ආසිරි ගන්වා, පළමු මංගල්‍යයද, එදිනම සිදු කර ඇත. එයින් පසුවද, සෑම මසකම පළමු වන සිකුරාදා දින දිව්‍ය පූජාව පවත්වා ඇත.

2005 වසරේ සිට සෑම ඉරු දිනකම දිව්‍ය පූජාවද, ඊට පෙර දහම් පාසල පැවැත්වීම ද ආරම්භ කර ඇත. උණලීය දේවස්ථානයට අයත් කිතුනු පවුල් සංඛ්‍යාව 27 ක් පමණ වේ. මෙහි වාර්ෂික මංගල්‍යය මැයි මාසයේ දී පවත්වනු ලැබේ.

**කතෝලික අපේ උරුමය ග්‍රන්ථය අනුග්‍රහයෙනි.**

## කන්ද උඩරට පියතුමා කුළුඳුල් මෙහෙය පවත්වයි



කන්ද උඩරටින් බිහි වූ ඩොමිනික් රාජ් පූජක පුතනුවන් මහනුවර ශු. අන්තෝනි ආසන දෙව් මැඳුරේදී අති උතුම් ජෝසප් වියානි හිමිපාණන් වෙතින් පූදැදුරු වරම් ලැබීමෙන් අනතුරුව කඩියන්ලෙන භාග්‍යවත් ජුසේවාස් මුනි දෙව්මැඳුරේදී කුළුඳුල් දිව්‍ය මෙහෙය පිදීය.

ජාතික දෙව්සත්හලේ ගරු ඇල්වින් පීටර් ප්‍රනාන්දු, ගරු බාලා රාජෙන්ද්‍රන්, ගරු පෝල් ලියනගේ. ගරු අයිවන් ජයසුන්දර, ගරු වින්ස්ටන් ජෝන් පීටර් මීසම් සේවක ගරු නිලංක හර්ෂ ඩයස් පියවරුන්ද, ගරු තේවාචාරි වරුන් ද ගරු පැවිදි සොහොයුරියන් සමග දහසකට අධික පිරිසක් මේ අවස්ථාවට එක්වූහ.

මිකි ප්‍රනාන්දු

## දරුවන් තුළ විශ්වාසයේ බීජය ඇති කරමු



එකමුතුකම හා විශ්වාසය තුළ මෙම දේව ගෘහය ගොඩනැගුවා සේම ඔබ ඔබගේ දරුවන් තුළ විශ්වාසයේ බීජය ඇති කළ යුතු යැයි පහත්ගම දේවස්ථානය ගොඩනැගූ ගරු ජූඩ් පීරිස් පියතුමා පිළිගෙන දේවස්ථානයට කැඳවාගෙන පැමිණීමෙන් පසු පැවති වාර්ෂික මංගල්‍යයේ දී ප්‍රකාශ කළේය.

ධර්මදූත කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් පැවැති ඥානකාන්ති මෙහෙයන් වලදී සැදැහැවතුන් දැනුවත් කළ අතර, මෙහි සියලු කටයුතු හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමා සහ සහයක ගරු ටිරොන් අජිත් පියවරුන්ගේ මෙහෙයවීමෙන් සංවිධානය කරන ලදි.

ඇන්තනි හෙට්ටිආරච්චි

## නිවැරදි කිරීමයි

පසුගිය සතියේ පුදබිමක අසිරිය විශේෂාංගය යටතේ දංකොටුව උත්ථාන වූ කිතු සමිඳාණන්ගේ දෙව්මැඳුර පිළිබඳ පළවූ සේයාරුව ප්‍රමාද දෝෂයකින් අදාළ දෙව්මැඳුරේ නොවේ. මේ සමග පලවන්නේ නිවැරදි ඡායාරූපයයි. ප්‍රමාදය ගැන අපගේ කනගාටුව.



# මට විශ්වාසයි...!



**මරිය හමුදාවේ සාමාජිකාවන් කිහිප වතාවක්ම මා වෙතට ඇවිත් පෙරත්ත කළේ කිතුනු දහම වැළඳ ගැනීමට කැමති හින්දු බැතිමතකු ඔවුන්ට හමු වූ බව කියමින් ඔහුට හැකි ඉක්මනින් ඒ අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලමිනි. එක එල්ලේම ඒ සඳහා මගේ කැමැත්ත නොදුන්නත් විගසින් මම ඒ ගැන බලන බව ඔවුන්ට පැවසීමි. වෙසෙසින්ම මට අවශ්‍ය වූයේ ඔහු කිතුනුවකු වීමට අදහස් කළේ කුමන පරමාර්ථයක් පෙරදැරි කරගෙන ද යන්න දැන ගැනීමටයි. තරමක් සොයා බැලීමෙන් පසුව මම ඔහු සොයා යාමට තීරණය කළෙමි.**

දිනක් දිව්‍ය පූජාවෙන් පසුව දිව්‍ය පූජාවට මට සහය වන ළමයකු සමඟ ඔහු සොයා ගියෙමි. ඒ නිවසට ළඟා වූ විට රෝගීව සිටි ඒ තැනැත්තා පන් පැදුරක වැතිර සිටියේය. මා ඔහු ළඟ බිම දණගසා ඔහුගේ මුහුණට මගේ මුහුණ ලං කර "ඔබ කතෝලික ආගමට එන්න අදහස් කළේ ඇයි කියා ඇසීමි. ඔහු තම දෑත් පපුව මතට එක්කොට, දෑත් ඇඟිලි පටලවා සිහින් හඬින් මේ වචන උච්චාරණය කළේය. "මට විශ්වාසයි". එම වචන තුළ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඔහුගේ විශ්වාසය රැඳී තිබුණු බව ඇදහූ මම ඔහුට ප්‍රසාද ස්නාපනය දෙන්නට අදිටන් කළෙමි. ඔහුගේ බිරිඳගෙන් වතුර ටිකක් ඉල්ලාගත් මම පූජා උදව්වන දරුවාට ඥාන පියා සේ පෙනී සිටින්නට නියමකර ඔහුට ප්‍රසාද ස්නාපනය දානය කළෙමි. ඥාන පියා සේ එදා පෙනී සිටි ඒ දරුවා අද පූජාප්‍රසාදිවරයෙකි.

කිතුනු ලබ්ධිය වැළඳගත් ඒ බැතිමතා දින කිහිපයකට පසු අවසන් හුස්ම හෙළූ බව මට දැනගන්නට ලැබිණි. තෝසේ, වඩේ යනාදිය නිෂ්පාදනය කරමින්ය. ඔහු පවුල නඩත්තු කළේ. එම බිරියට ද භූමදාන කටයුතු කිරීමට මුදලක් නැති වූයෙන් ගම්මු එකතු වී සම්මාදම් කිරීමට කතිකාකරගත්හ. අසල්වාසීන්ගේ උනන්දුව මත මුදල් එකතුව ඇරඹුනි. නැති බැරි අය මෙන් ඇති හැකි අයද ආධාර කිරීමට මැලිවූයේ නැත. නමුත් එක්තරා "කාඩ්බෝඩ් ශුද්ධවන්තයකුගෙ" නිවසට ගියවිට ඔහු මුදලකින් ආධාර කරනු වෙනුවට ඒ ගිය පිරිස එලවා ගත්තේ මෙවන් වදන් සමූහයක් තෙපලමිනි. "උඹල කොහොමද ඒ හින්දු මිනිහව අපේ කතෝලික කැරකොප්පුවෙ (මිනිපිටියෙ) වළලන්නේ? කවුද ඒ සඳහා අවසර දුන්නේ. පිරිසෙන් කටකාර තරුණයෙක් සියල්ලන් වෙනුවෙන්ම කතා කළේය. "ඇයි දන්නෙ නැද්ද? අපේ සුවාමි. ටික දිනකට කලින් එයාව ක්‍රිස්තියානි කළානේ. මේ ඉන්නේ පඤ්ඤා කියමින් පූජාවට උදව්වන දරුවා දෙසට අත දිගු කළේය. ඒ වචන නොඇසුනා මෙන් "මං ඒවා සුවාමිත් එක්ක බලාගන්නම්. සතයක්වත් මම දෙන්නේ නැහැ. ඒ මිනිහව වළලන්න දෙන්නෙත් නැහැ.

ඔවුන් ආපසු කෙලින්ම මා හමුවන්නට ආවෝය. සිදුවූ සිද්ධිය ඔවුන් මට සැලකළ විට ඔවුන්ට මම මෙසේ සඳහන් කළෙමි. "ඔයගොල්ලො මෙතන ඉන්න. මම ගිහින් ඒ මහත්තය හමුවෙලා එන්නම්", "නැහැ නැහැ පියාණනි ඔබවහන්සේ යන්න එපා. අපි ගිහින් කියන්නම් ඔබවහන්සේ හමුවෙලා විස්තර දැනගන්න කියලා. කරුණු එතකින් නිමාවට පත්විය. මා ඔහු හමුවුනේවත් ඔහු මා හමුවුනේ වත් නැත. අවමංගල්‍ය කටයුතු සංසුන්ව මෙන්ම ගෞරවාන්විතව සිදුකරන්නට මම අමතක නොකළෙමි. ගමේ තැන තැන මෙම අවමඟුල ගැන කතා බහ වුනද, කසු කුසු ඇතිවුනද කිසිවෙකුත් මා වෙත කෙළින්ම ඉදිරිපත් වූයේ නැත. ඊට පසු ඉරුදින සියලු දෙනාගේම දැනගැනීම පිණිස මෙම බැතිමතා ගැන ද කරුණු පහදන්න අවස්ථාවක් මම ගතිමි.

මෙම හින්දු බැතිමතාගේ මරණයෙන් පසුව ඔහුගේ බිරිඳ හමුවී බැතිමතාගේ සිත් හැරීම සම්බන්ධයෙන් තවත් කරුණු ටිකක් දැන ගන්නට මම උත්සාහ කළෙමි. ඇය කී කතාව මා පුදුමයට පත් කළා පමණක් නොව, මගේ විශ්වාසය ද තව තවත් තහවුරු කරන්නට සමත් විය.

"ඒක පියාණනි, හරි පුදුම කතාවක්. මගේ පළමු දරුවා ටික කලක් යනවිට තේරුණා ඔහු තරමක් දුරට අස්වාභාවික දරුවෙක් කියලා. කුඩා දරුවෙක් සාමාන්‍යයෙන් කතා කරන වයසෙදි කතා කළේ නැහැ. මුණින් පෙරළෙන, දණ ගාන, යමක් අල්ලාගෙන නැගිටින ඒ කිසිවක් කරන්නට අපේ දරුවට පුළුවන් වුණේ නැහැ. ඒ කාලේ මේ සිද්ධිය නිසා කර කියා ගන්න දෙයක් නැතිව අපි හරියට අසරණ වුණා. මම මේ කතාව දවසක් අසල්වැසි කතෝලික කාන්තාවකට කිව්වා. ඇය එකපාරටම මට කිව්වා "ඔයා සදාසරණ මෑණියන්ට භාරයක් වෙන්න දරුවා සනීප වෙයි" සදාසරණ මෑණියෝ කියන්නේ කවුද කියලා මම දැනගෙන සිටියෙ නෑ. "කවුද සදාසරණ මෑණියෝ කියලා" එකපාරටම මම ඇහුවා. "ඇයි අපේ මේ පල්ලියේ ඉන්නේ!!!"

මට භාරවෙලා පුරුද්දක් තිබුණේ නැහැ. පල්ලියක් දන්නේ නැහැ. ඔරසන් කියනවා කියල කියන්නේ මොනවාද කියල දැනගෙන හිටියේ නැහැ. "ඔයා දරුවව ගෙනිහින් මෑණියන්ගේ පාමුල තියලා යාච්ඤා කරන්න.

කෙසේ හෝ පසුදිනම මා ළමයත් කරපින්නාගෙන වත්තල පල්ලියට ගියා. අපි එතකොට පදිංචි වෙලා හිටියෙ ඒ පල්ලිය කිට්ටුවයි. යාච්ඤා කරන්නට, භාරහාර වෙන්නට නොදැන සිටිය මම පල්ලියට ගිහින් මෑණියන්ගේ පින්තූරය ඉදිරිපිට ළමයව බිමින් තියල මෙහෙම කිව්වා.

"මෑණියනි, මෙන්න ළමයා; ඔබට බාරයි" ටික වෙලාවක් පල්ලියේ ගත කරලා ළමයවත් අරගෙන මං ගෙදර ආවා. දින කිහිපයක් ගතවෙද්දි මගේ පුතා සම්පූර්ණයෙන්ම වෙනස් වන්නට පටන් ගත්තා. දරුවාට හොඳවුණා. සාමාන්‍ය දරුවෙක් වගේ හැසිරෙන්න පටන් ගත්තා. මේ සිද්ධියෙන් පස්සෙ තමයි පල්ලියට සම්බන්ධ වුණේ. ඒ දරුවා විතරක් නොවෙයි. ඊට පස්සෙ ලැබුණු දරුවත් ක්‍රිස්තියානි කළා. දැන් දෙන්නම කසාද බැඳල ඉන්නේ කතෝලික අය. බැන්දෙ කතෝලික අය නිසා ඒ අය දැන් අදහන්නේ කතෝලික ආගම. ඒ කාලෙ ඉඳලම අපේ එක්කෙනාට උවමනාව තිබුණ කතෝලික වෙන්න. නමුත් අවසාන මොහොතෙ තමයි ඒ වාසනාව ලැබුණේ.

"ඉතින් අම්මෙ දැන් සුවාමිපුරුෂයත් කතෝලික වෙලා මැරුණේ. පුතුන් දෙදෙනාත් කතෝලික ආගමේ. එහෙම නම් ඇයි අම්මා කතෝලික ආගමට නොයන්නෙ" කියා මම ඇසීමි. "පියාණනි මාත් එහෙම හිතාගෙන තමයි ඉන්නෙ. දැන්ම නොවෙයි. තව අවුරුද්දකට විතර පස්සෙ." "ඇයි තව අවුරුද්දක් බලා ඉන්නේ දැන්ම පුළුවන්නේ." "නැහැ පියාණනි හින්දු කෙනෙක් හැටියට වෙච්ච පොරොන්දුවක් කඩකරන්න බැහැ. මම පොරොන්දුවක් වෙලා තියෙනවා එක්තරා කෝවිලකට නොකඩවා අවුරුදු හතක් යන්නට. අවුරුදු හත පිරෙන්නේ ලබන අවුරුද්දටයි. ඊට පස්සෙ මම ආගමට එනවා. මම දැන්ම ආගමට ආවොත් මේ ආගමේ ඉඳගෙන ඒ ආගමේ දේවල් කරන එක හරි නැහැනේ. ඇයට බාධා කරන්න හෝ ඇයගේ තීරණයට හරස් වන්නට මට සිතුනේ නැත.

✍ **ගරු සාර්ටෝ නෝනිස් පියතුමා**

දේව වචනයෙන් හික්මීම
ප්‍රදීපය
**ධර්ම සංග්‍රහය**

**බටගම රිචඩ් වික්‍රමසිංහ විසිනි**

# මාගේ ආත්මානුභාවය සකල මනුෂ්‍යයන් කෙරෙහි ප්‍රදානය කරමි.

**මේ වසරේ වෙසක් මස 19 වැනි ඉරුදින එනම්, අද දින සභා මාතාව ශුද්ධාත්ම ආගමනයේ මංගලෝත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලබනවා. එය එසේ විය යුතු යයි අප සලකනවා.**

දෙවිපියාණන්ගේ පොරොන්දුවත්, දිව්‍යමය රහසත්, වෙන කිසිදෙයක් හෝ කිසි කෙනෙක් නොව ඒ ශුද්ධාත්මයාණන් වහන්සේ යි. එමෙන් ම උන්වහන්සේගේ පරම අරමුණ වනුයේ ද, මේ සහයදායකයාණෝ, මේ සත්‍යතාවේ ආත්මයාණෝ යුගාන්තය දක්වා සිටින පිණිස, සකල මනුෂ්‍යයන් වෙත ප්‍රදානය කිරීමයි. එය එසේම සිදුවන්නක්. අප සභාවේ ජීව හුස්ම ශුද්ධාත්මයාණෝයි. ලොව ශුද්ධවත් කරන්නේත් උන්වහන්සේයි. උන්වහන්සේගේ මෙහෙය වීමට නතු නොවූ කිතුනු ජීවිතයක් කෙරෙහි අපට සිතාගත නොහැකි තරම්ය. අපට දැනෙන අපට පෙනෙන දෙයක් තමයි ශුද්ධාත්මයාණන්ට ක්‍රියා කරන්නට ඉඩනොදෙන, මෙහෙයවීමකින් තොරව ගතකරන කිතුනු ජීවිත, හුදු මිනිස් ශක්තියෙන් පමණක් යන ගමනක් බව.

මේ පිළිබඳව ශ්‍රාවකයන්ගේ ජීවිත දෙස හැරී බලද්දී ශුද්ධාත්ම ආගමනයට පෙර ඔවුන් ගතකළ ජීවිත රටාවත් ඉන්පසුව ඔවුන් ක්‍රියා කළ අන්දමත් අතර පැහැදිලි වෙනසක් පෙන්නුම් කරනවා. ඔවුන් නොබියව ජනතාව අතර, ප්‍රබලව ක්‍රියා කරමින්, ජීවිත පවා පරදුවට තබා, සුභාරංචිය ලොව පුරා පැතිරවීමට ක්‍රියා කළහ. දේව පුත්‍ර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට තම පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටුකරලන්නට, ශුද්ධාත්මයාණන්ගේ ආලේපනයේ බලය, කොතෙක් අවශ්‍ය වූයේද ඊට කොපමණ වැඩියෙන් ඔබටත්, මටත් අවශ්‍ය වන්නේ ද? ශුද්ධාත්මයාණන් පැමිණි කල නුඹලා බලය ලබන්නහුය" යන දෙව් වදන ශ්‍රාවකයන්ගේ ජීවිත තුළින් ප්‍රකාශ වූවා පමණක් නොව ප්‍රබල ලෙස සාක්ෂි දැරූහ. අප කිතුනු ජීවිත පෝෂණය කිරීමටත්, ඵල දැරීමටත් දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිත බවට පත්කරනු සඳහාත් උන්වහන්සේ අප ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන ශුද්ධාත්මයාණන් අධික ලෙස අප පිට වැගිරෙව් සේක."

එබැවින් යුගාන්තය දක්වා අප අතර, අප තුළ වැඩ වසන දෙව් පියාණන් ඉදිරියෙහි නිරන්තරයෙන් අප වෙනුවෙන් මැදිහත්වන අපගේ සහයදායකයාණන් වන ශුද්ධාත්මයාණන් වහන්සේට දැනුවත්ව අවදි වී අප ජීවිත මෙහෙයවන්නට ඉඩ දී බලය ලබමු.

# සහනදායකයාණන් වූ ශුද්ධාත්මයාණෝ



ශුද්ධාත්මයාණෝ මහා ආලෝකයාණෝ ය. ඒ මහා ආලෝකය අභිවෘද්ධි ආලේපය නමැති මහඟු සක්‍රමේන්තුව තුළින් අපට දැනුවත්වම නොමිලයේම ප්‍රදානය කෙරෙන අතර අප සතු ක්‍රිස්තු දූත මෙහෙවර සාර්ථක කරගැනීම සඳහා අප බලවත් කරමින් ඉදිරියට මෙහෙයවනු ලබන්නේ ද මේ ශුද්ධාත්මයේ බලගතු ස්පීතුවයි. "ශුද්ධාත්මයාණන් වහන්සේ කරණකොටගෙන ජේසු ස්වාමින් වහන්සේ, ස්වාමින් වහන්සේ යැයි කීමට කිසිවෙකුට නොහැකි වන බවත් අන්‍යෝන්‍ය යහපත සඳහා එකිනෙකා තුළ ආත්මයාණන් වහන්සේ ප්‍රකාශ වීමත් ඇති බව ( 1 කොරින්ති 12: 4-7) ශු. පාවුලු තුමා කොරෙන්තිවරුනට ලියූ බව ශු. ලියවිල්ලෙහි සඳහන් වෙයි.

එසේම අපගේම යහපත සඳහා ආත්මයාණන්ගේ ප්‍රකාශ වීමක් දී ඇති අතර කෙනෙකුට උවදෙස් දීමේ ප්‍රඥාවද තවත් කෙනෙකුට එම ආත්මයාණන් මඟින්ම ධර්මය පහදා දීමේ ඥානය ද දී ඇත. අන් කෙනෙකුට ආත්මයාණන් තුළ විශ්වාසය ද, තවත් කෙනෙකුට සුව කිරීමේ වරම් ද එසේම හාස්කම් කිරීමේ බලය ද තවත් කෙනෙකුට දිවැස් වැකි කීමේ බලය ද, තවත් කෙනෙකුට ආත්ම විමසීමේ හැකියාව ද තවත් කෙනෙකුට විවිධ ශබ්ද වලින් කතා කිරීමට පුළුවන් කම ද තවත් කෙනෙකුට ශබ්ද පහදා දීමේ බලයද, දී ඇති අතර මේ සියලු දීමනා තමන් කැමති පරිදි වෙන් වෙන් වශයෙන් එකිනෙකාට බෙදා දෙන්නේ එකම ආත්මයාණන් වහන්සේ ය. (1 කොරින්ති 12:7-11 - 7)

ලෝකාරම්භයේ දී දෙවියන් වහන්සේ අහස හා පොළොව මැවූ බවත් පොළොව පාලුව හිස්ව තිබූ බවත් මහ සයුර මැද අන්ධකාරයක් වසා තිබූ බවත් උත්පත්ති පොත ගෙන හැර දක්වනු ලබන අතර දේවාත්මානුභාවය ජලය මතු පිට හැසිරුණු නිසා දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ශූන්‍යතාවය මත ක්‍රියාකාරී වෙමින් මැවිල්ල ඇති වූ බවද උත්පත්ති පොත තව තවත් සඳහන් කරයි.

මිනිසා, සත්වයා, ගහකොළ පමණක් නොව ලෝකය තුළ විවිධත්වය ඇති කළේ ද මැවුම්කරුවාණන් ම වූ ශුද්ධාත්මයාණන් වහන්සේමය. ශුද්ධවූ ත්‍රිත්වය දෙස බැලීමේදී පියාණන් වහන්සේ දෙවියන් වහන්සේය. පුත්‍රයාණන් වහන්සේ ද දෙවියන් වහන්සේ ය. ශුද්ධාත්මයාණන් වහන්සේද දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා බොහෝ විට වෙන් කරනු ලබන්නේ පාපයයි.

පාපයද දෙවැදෑරුම්ය. දැන දැන කරන පාප සහ නොදැන කරන පාප ඒ අතරය. පාපය සුළු පාපයක් වුවද මරණීය පාපයක් වුවද පාපය පාපයමයි. එහෙත් පාපයේ ඇති භයානකකම සහ විපාකය අප හට පසක් කොට දී පාපයේ අන්ධකාරය ආලෝකයට හරවා ගන්නටත් සැබෑ මනස්ථාපනයකින් යුතුව නැවත හැරී විත් දේව ආදරය වැළඳ ගත් නාස්තිකාර පුත්‍රයා මෙන් නැවත සමිඳුන් දෙසට හැරී ඒ නොවෙනස් වූ දේව ආදරය දිනා ගන්නටත් අපට මඟ පෙන්වන එකම ආලෝකය ශුද්ධාත්මයාණෝම ය.

ස්නාවක ජුවාම් තුමා හරහා ජේසු සමිඳුන් ලද ස්නාපනය මහා සක්‍රමේන්තුවක් වූවාසේම "මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝය. මම ඔබ ගැන ප්‍රසන්න වෙමි"යි ආත්මයාණන් තුළින් ඇසුනු හඬ එතුමාණෝ ඉහළ තලයට ඇද දැමූ තවත් මුද්‍රාවක් පමණක් නොවීය. ඉදිරි දූත ක්‍රියාවලියට ද ඒ අතිශයින්ම පිටුවහලක් වූවා පමණක් නොව පාළුකරය හා කුරුසියේ ගමන තුළ ද ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරෙන්නට මහඟු බලයක් විය. කුරුසියේ මරණයෙන් සියල්ලම නිම වුණා යැයි සිතා බිය වැදුනු ගෝලයින්ගේ විශ්වාසය වැඩි දියුණු කරමින් තම ජීවිතය තුළින් පෙන්වූ සුභාරංචිය සකල ලෝකයාටම ගෙන යන්නට උත්ථාන වූ ස්වාමින් වහන්සේ එදා සේනාකුළු ශාලාවේදී ගිනි දිව් ආකාරයෙන් අපෝස්තුළුවරුන් වෙත ප්‍රකාශ වෙමින් කළ ඒ මහා ශුද්ධාත්ම වැගිරීම ලෝකය අවසන් වන තුරු පවතිනවා ඇත.

අද අප ජීවත්වන සමාජය තුළ ද ශුද්ධාත්මයාණන් බලගතුවම වැඩ සිටින සේක. අල්ලස, දූෂණය, ළමා අපචාර හරහා ද, මිනීමැරුම් හා ස්ත්‍රී දූෂණ ඇතුළු සියලුම සමාජ පාපයන් ඉදිරියේ ද බොහෝ විට අපේ කිතුනුකම දියාරු වී ඇත්තේ ආත්මයාණන් වහන්සේට අවදි නොවීම නිසාමය. ඒ සඳහා ඉදිරිපත් වීමට තරම් අප තුළ ඇති බියගුලුකමේ දොරගුළු ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් බිඳ දමා ඇත. සෑම සිද්ධියක් තුළම අප හා සමඟ සිටිමින් අප මෙහෙයවන අපගේ නොවෙනස් කල්‍යාන මිතුරාණන් හා අසහාය සැනසිලිදායකයාණන් වූ ශුද්ධාත්මයාණන් වහන්සේ අප අවදි කරන සේක.

සභාව, අනාගතයේදී අල්පේච්ඡිත දිළිඳුන්ගේ සභාවක් තුළින් සැබෑ ක්‍රිස්තු අත්දැකීමක් මත මහා ගමනක ගෙන යන්නට විශ්වාසයේ වසරේදී අප සසුනිසුරාණන් වූ අති උතුම් ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් ගන්නා මහඟු පියවර පැහැදිලිවම ශුද්ධාත්මයාණන් ආලේපනයට හසු වූ තවත් ගමනක්ම බව පැහැදිලිය.

මියැදෙන සිත් සතන් තුළට නව ජීවයක් දෙමින් වැළලුනු උන් ගොඩ ගන්නට සෑම මොහොතකම ක්‍රියා කරන ඒ මහා ශුද්ධාත්මයාණන්ගේ බලය අත්දකින්නට අපි සෑම මොහොතක් පාසාම අවදියෙන් සිටිය යුතු වෙමු.

✍ **ඇන්තනි ජයලත්**
**රාගම**

# ශුද්ධාත්මාගමන මංගලෝත්සවය






ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ ශ්‍රාවකයන් සුභාරංචිය ලොව පුරා පතළ කිරීමට පියවර ගැනීම අද පළමු කියවීමෙන් පෙන්වා දෙයි. දෙවන කියවීමෙන් විවිධාකාර දීමනා ඇතත්, සිටින්නේ එකම ශුද්ධාත්මයාණන් වහන්සේ බවත්, විවිධාකාර සේවා ඇතත් සිටින්නේ එකම ස්වාමින් වහන්සේ බවත්, විවිධාකාර දේව බල ක්‍රියා කරතත් සිටින්නේ සියල්ලන් තුළ ක්‍රියා කරන එකම දෙවියන් වහන්සේ බවත් පසක් කර දෙයි.

සුවිශේෂය තුළින් ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වී ශුද්ධාත්මයාණන් වහන්සේව පිළිගන්නට ආරාධනා කරන සේක.

අද දින ශුද්ධවූ කතෝලික සභාවට ඉතාමත් වැදගත් දිනයකි. මන්ද අද දින විශ්ව සභා මාතාව ශුද්ධාත්ම ආගමන මංගල්‍යය සමරනු ලබන්නීය. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ ඉගැන් වූ දහම ලෝ පතළ කරන්නට නොබියව පෙළ ගැස්ම අද දින සිහිපත් කරනු ලබයි.

පාපයට වැටුනු මිනිසාව නැගිටුවන්නට, නැවත වරක් දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ කරන්නට ජේසුස් වහන්සේ මේ ලොවට වැඩිය සේක. ඔවුන් වහන්සේ තම දූත මෙහෙවර ආරම්භ කරන්නට මත්තෙන් ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු කැඳවනු ලැබූ සේක. තමන් වහන්සේගේ දූත මෙහෙවර ඉදිරියට ගෙන යෑමේ අරමුණින් ජේසුස් වහන්සේ මෙම ශ්‍රාවකයන් කැඳවූ සේක. මොවුහු ඔවුන් වහන්සේ කළ කී දේ සැම දෙයක්ම දුටුවෝය. ජේසුස් වහන්සේව ළඟින්ම ඇසුරු කිරීමේ භාග්‍යය ඔවුන් ලද්දාහ.

ජේසුස් වහන්සේගේ මරණය මෙම ශ්‍රාවකයන්ට බිය උපැද්ද විය. ඔවුන්ගේ සියලු බලාපොරොත්තු බිඳ වැටුනු ස්වභාවයකින් ඔවුහු කටයුතු කරන්නට වූහ. නායක පූජකයන්ට, පරිසිවරුන්ට බියෙන් ඔවුහු මුළු ගැන්වී සිටියහ.

මෙසේ බිය ගුළු වූ ශ්‍රාවකයන්ව ශක්තිමත් කරන්නට, ධෛර්යවත් කරන්නට ශුද්ධාත්මයාණන් වහන්සේ පොරොන්දු ප්‍රකාර එවන ලදි. "ඔවුන් වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හෙළා, ශුද්ධාත්මයාණන් පිළිගන්න" (ජොහාන් 20:22).

ශුද්ධාත්මයාණන් වහන්සේ මඟින් ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර ඉදිරියට ගෙන යන්නට ඔවුන් ශක්තිමත් කරන ලදි. "පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි... ඔබ යමෙකුගේ පව් කමා කරන්නහුද, ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ. ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නහුද ඒවා කමා නොකරනු ලැබේ" (ජෙහාන් 20:21-23). මෙසේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ ශ්‍රාවකයන් ජේසුස් වහන්සේව නොබියව ලොවට ප්‍රකාශ කරන්නට පෙළ ගැසිණි (ක්‍රියා. 2:1-13).

කතෝලිකයන් වශයෙන් අපි හැම කෙනෙක්ම ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළින් ජේසුස් වහන්සේගේ ධර්මදූතයෙක් දූතිකාවක් වන්නෙමු. ප්‍රසාද ස්නාපනය තුළින් ලද මෙම ධර්මදූතික කැඳවීමට අපි කෙතරම් සාධාරණය ඉටු කරන්නේ ද? ජේසුස් වහන්සේ ඉගැන්වූ දහම අපගේ වචන, ක්‍රියා හා ජීවිතයන් තුළින් අප ජීවත් කරන්නේ ද? අප රැකියා කරන ස්ථානය, අප ඉගෙනගන්නා පාසල, අප ජීවත් වන සාමාජයෙන් අපට එල්ල වන අභියෝග, කරදර හමුවේ අපි ජේසුස් වහන්සේ ඉගැන්වූ දහම ජීවත් නොකර, ඊට පරස්පර ජීවිත රටාවක් තුළ ජීවත් වන්නහුද?

මොහොතක් සිතමු. යථාර්ථය අප හමුවෙහි දිග හරින්නා වූ සත්‍යයේ ආලෝකයාණන් ලොව ආලෝකවත් කරන්නාවූ මේ පරිශුද්ධ දිනයේදී අප මතට ද වඩිමින්, අප වසා ගනිමින්, නියම සත්‍යවාදි කතෝලික වටිනාකම් තුළ ජීවත් වෙමින්, ජේසුස් වහන්සේව නොබියව ප්‍රකාශ කරන්නටත් ඔවුන් වහන්සේව අප තුළ ජීවත් කරවන්නටත්, අප අවදි කරන ලෙස ආලෝකයේ ආත්මයාණන් වහන්සේට නිරතුරු යදිමු.

අම්පිටිය ජාතික දෙව්සත්හලේ
ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ

✍ **ගරු මිලාන් බර්නාඩ් සහෝදරතුමා**

---

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 77

## පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය




**පසුගිය සතිය හා සබැඳේ**

### 1 වන තෙහිලි ගීය

**සාහිත්‍යමය ස්වරූපය**

මෙම තෙහිලි ගීය ධර්මිෂ්ඨ ජීවිතය හා අධර්මිෂ්ඨ දිවි පෙවෙත අතර පවත්නා වෙනස කෙරෙහි අවධානය යොමු කරයි. ධර්මිෂ්ඨ ජීවිතයක් සතු වාසි ගණනය කරයි (3-4). ඒ අනුව එය ප්‍රඥාවේ තෙහිලි ගීතයක් ලෙස නම් කළ හැකිවෙයි.

**ජීවන පසුතලය**

සමාජයේ අයුක්තිය, අසාධාරණය රජකරන සමයක කතුවරයා ජීවත් වූ බව පෙනේ. ඒ අනුව, ඔහු දේව ගරුබිය ඇතිව ජීවත්වන ලෙස තම සගයන් හා සමකාලීනයන් දිරිමත් කරයි. මෙලෙස ඔහු තම අනුශාසනාවන් ඉදිරිපත් කරන්නේ දමිටු අදමිටු ජීවිත සංසන්දනය කරමිනි.

**බෙදුම**

1-3 : ධර්මිෂ්ඨව ජීවත්වීම පිළිබඳ විස්තරයකි.
4-5 : අධර්මිෂ්ඨ දිවි පෙවෙත පිළිබඳ විස්තරයකි.
6 : දමිටුනට හිමිවන යහවිපාකය සහ අදමිටුවනට එරෙහි විනිශ්චය.

**විග්‍රහය**

1 : "...මිනිසා භාග්‍යවන්තය" - මෙය "... මිනිසා කොතරම් භාග්‍යවන්ත ද" යන යෙදුම හා සමානය. මෙහි අරමුණ ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම සඳහා ජනතාව පෙළඹවීම ය.

2 : "සමිඳුන්ගේ විනය" (සමිඳුන්ගේ නීතිය) - මෙය ඉදිරිපත් කරනුයේ මෝරා නැතහොත් මෝසෙස්ගේ නීතිය ලෙස හැඳින්වූ පංච පුස්තකය යන අදහස විය හැකිය. එලෙසම එය දිවැසිවර දේශන මඟින් ඉදිරිපත් කෙරෙන දේව අභිමතය පිළිබඳ සඳහනක් ද විය හැකිය.

3 : "මෙම වගන්තියෙහි අන්තර්ගතය, ජෙරමියා 17:5-8 හා බෙහෙවින් සමාන වෙයි. ජෙරමියා ග්‍රන්ථයේ ආභාෂය කතුවරයා සතුවීද නැතහොත් ජෙරමියා මෙන්ම තෙහිලි ගීත කතුවරයා ද දායකත්වය පුදකළ වඩා පැරැණි ප්‍රඥා සාහිත්‍ය මූලාශ්‍රයක් කතුවරයා සතුවූයේ ද යන්න එතරම් පැහැදිලි නැත.

4 : "සුළඟේ යන බොල් හා සමාන" - මෙහි ඉදිරිපත් කෙරෙන චිත්තරූපය, ධාන්‍ය පාගා බොල් වෙන්කර, හුළං කර පිරිසිදු කරන කෘෂිකාර්මික පරිසරයකින් මතුව එන්නකි.

**පණිවුඩය**

දැහැමි දිවි පෙවෙත, යහවිපාක උරුම කරගන්නා අතර අදැහැමි දිවි පෙවෙත දෙවියන් වහන්සේගේ දැඩි විනිශ්චයට හසුවනු ඇත.

☛ ලබන සතියට

---

# සැබෑ මනස්ථාපනයකට ඇතුල් වෙමු

**ජේසුස් වහන්සේට දුරාතීතයේ ජීවත්වූ දිවැසිවරු මෙන්ම උන්වහන්සේත් සිය ධර්ම දේශනා ආරම්භ කළේ මනස්ථාපනය සම්බන්ධව ජනතාව දැනුම්වත් කිරීම මඟිනි.**



මනස්ථාපනය යනුවෙන් අදහස් කරන්නේ තමන් කළ වැරදි කල්පනාවට ගනිමින් ඒවා පිළිබඳව අවංකව පසුතැවිලි වීමයි. කණගාටුවීමයි. මිනිසුන් ලෙස අපෙන් සිදුවන පාප, අඩුපාඩුකම් පිළිබඳව හෝ අසල්වැසියාට අප අතින් සිදුවී තිබෙන වරදක් හෝ යුතුකම් මඟ හැරීමක් සම්බන්ධව අප මනස්ථාප වී තිබේ ද? මතකයට ගෙන තිබේ ද? එම කිසිම දෙයක් අපට දෙවිඳුන්ගෙන් සැඟවිය නොහැකිය. අපගේ හෙට දවස අපට අයත් නැත. සැම පුද්ගලයකුගේම අතින් වැරැදි, අඩුපාඩු සිදුවේ. එහෙත් තමන් අතින් වැරැදි සිදුවන බව බොහෝ දෙනෙක් පිළිනොගනිති.

අපගේ ආත්මාර්ථකාමී බව නිසා අප අතින් සිදුවන පාප සම්බන්ධව පසුතැවිලි වී ජීවිත මාරුවක් අත්දැකීම දේව වචනය අවබෝධ කරගැනීමේ ප්‍රථම පියවරය. ඔබ අන්ධව සිටියා නම් ඔබට පාපයක් නැත. එහෙත් දැන් අපට පෙනේ යැයි ඔබ කියන නිසා ඔබේ පාපය එසේම පවතී" යනුවෙන් ජුවාම් 9:41 හි දැක්වේ. එය කිතුනු සමිඳුන් පරිසිවරුන්ට දුන් අවවාදයයි.

එම අවවාදය අපට ද ගැලපේ. අප හදවතේ ඇති අවිශ්වාසය, මමත්වය, මුරණ්ඩු භාවය අව්‍යාජ පසුතැවිල්ලකට මහත් බාධා කීපයකි. අපගේ හදවත් බැහැපත්ව තිබේ නම් අපගේ පාප අපටම තේරුම් ගැනීමට පුළුවන. දේශ මමත්වය, ජාති මමත්වය, දෘෂ්ටි මමත්වය, පක්ෂ මමත්වය නිසා කිනම් දෙයකට වුවද ප්‍රමාණය පසුකොට වහල් නොවිය යුතුය. එයින් සැබෑ යථාර්ථය අමතක වේ. අපගේ දුබලතා අපට නොපෙනේ. හදවතේ බැහැපත්කම තිබිය යුතු අතර දේව හඬ ඇසෙන්නේ එවිටය. බැහැපත්කම තුළින් සැබෑ මනස්ථාපනයක් අත්කර ගැනීමට පුළුවන. අපට අමතක වී ඇති පැරැණි පාප තිබිය හැකි අතර සැබෑ විශ්වාසයකින් හා මනස්ථාපවීමකින් ඒවායේ බලපෑම් ද දුරු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඇතැම් පුද්ගලයන් පසුතැවිලි වන්නේ ප්‍රයෝගකාරී හැඟීම් නිසාය. සමහරු මනස්ථාප වන්නේ අවස්ථාවාදි වීමටය. ඇතැමෙක් ආර්ථික වරප්‍රසාද ලබා ගැනීමට, හොඳ නම, කීර්තිය ලබා ගැනීමට මනස්ථාපනය වෙති. එයින් දේව අභිමතය ඉටුවන්නේ නැත. දේව ප්‍රසන්න භාවය අත්දැකීමට නොහැකිය. දේව දරුකම ලබා ගැනීමට බාධා වන්නේ ය.

එදා ස්නාවක ජුවාම් තුමා පාළුකරයේ දී ජනතාව මනස්ථාපනයකට ලක් කිරීම සඳහා බොහෝ සේ පරිත්‍යාග විය. සැප පහසුකම් අත්හැරියේ ය. අප වත ඉරාගෙන නොව සිත ඉරාගෙන දෙවිඳුන් වෙත පා තබන්නට නම් ප්‍රථමයෙන් අප අපට අවංක විය යුතුය. එමෙන්ම ආධ්‍යාත්මික වශයෙන් නැවත අප අප වෙතටම නැඹුරු විය යුතුය. වාණිජත්වයේ රැල්ලෙන් සමාජය තුළ පවතින ආටෝප සාටෝප වලින් අප නොරැවටිය යුතුය. එවිට අපට අප හදවත් දෙවිඳුන් වෙත ඔසවන්නට වෑයම් කළ යුතුය. අප එතරම් පාප සිදු කර නොමැති බව අපගේ සිතට එන එක් පාපිෂ්ඨ සිතුවිල්ලකි. එයින් අපගේ පෞද්ගලික ශුද්ධවන්තභාවය තහවුරු කෙරේ. එහෙත් එය පාපයකි. ආත්මාර්ථකාමීත්වයට පාවඩ එළීමකි. නිල පාපොච්චාරණය කෙරෙහි අප අවම වශයෙන් මාසයකට වරක්වත් උත්සාහ දැරිය යුතුයි. එලෙසම පොදු පාපොච්චාරණය සඳහා ද නැඹුරු විය යුතුය. නිල පාපොච්චාරණය යනු පූජාප්‍රසාදිතුමා වෙතින් පව් සමාව ලැබීමයි.

පූජාප්‍රසාදිතුමා ද පව් කරන නිසා නිල පාපොච්චාරණය නොවැදගත් බවත්, අප කෙළින්ම දෙවියන් වහන්සේගෙන් පව් සමාව ලබා ගත යුතු බවත් ඇතැමෙක් ඉදිරිපත් කරන තර්කයකි. එහෙත් එහි පදනමක් නැත. පව් සමාව දෙන්නේ දෙවියන් වහන්සේ වන අතර පූජාප්‍රසාදිතුමා උන්වහන්සේව නියෝජනය කරයි. පොදු පාපොච්චාරණය යන්නෙන් අදහස් කරන්නේ අපගේ පව් වලට අප විසින් දෙවිඳුන්ගෙන් සමාව ලබා ගැනීමයි. අප සියලු අවස්ථා වලදීම එකිනෙකා කෙරෙහි සංවේදී වන තරමට අපට ආත්මාර්ථකාමිත්වයේ පාපයෙන් මිදීමට පුළුවන. එමෙන්ම නිරතුරුවම අප දිනපතා පෞද්ගලිකව දෙවිඳුන් වෙත යොමුවන්නට වෑයම් කළ යුතුය. අපට කෙතරම් වැඩකටයුතු පැවැතිය ද සුළු කාලයක් හෝ ඒ සඳහා වෙන් කළ යුතුය. පෞද්ගලික යාච්ඤාව සඳහා ද අප දවස තුළ කාලයක් ලබා දිය යුතුය. දෙවිඳුන්ට ප්‍රශංසා කිරීම, පව් සමාව ලබා ගැනීම, අවශ්‍යතා ඉල්ලීම, දේව අභිමුඛය අත්දැකීම යනාදි ක්ෂේත්‍ර එහිලා පැවතිය යුතුවේ.

✍ **මලින්ත බෝපෙආරච්චි**
**- දළුගම, කැලණිය**

---

# කුරුසියේ බර



සමිඳුන් කුරුසෙ කරගැසුවේ අප පවු ඒ මත පටවා
ගලවනු පිණිස ලොව අප හැම විඳිමින් දුක පිදුවා
පාස්කුවට එළිමහනේ ඔබ කුරුසිය කර ගැසුවා
කුරුසියෙ බර විතරද එහි ඔබ එතනදි බොරු කෙරුවා

**පී. වී. ඞී. ලුවී මයිකල්**
**කපුවාගාර**

## ජනතා හඬ

# මෙරට මැයි දිනය කම්කරු වාගේද ?

**කතුතුමනි,**

'ලෝක කම්කරුවනි එක්වව්' යන සටන් පාඨය යටතේ සෑම වසරකම ලොවපුරා මැයි දිනය පැවැත් වූවත්, අප රටේ සිදුවී ඇත්තේ කම්කරුවන් බෙදා වෙන්කිරීමය. කම්කරු දිනයේ සම්පූර්ණ අයිතිය කම්කරුවා සතු වුවද අද එය පක්ෂ දේශපාලනය නිසා බෙදී වෙන්වී ඇත. පක්ෂ එය අයිති කරගෙනය.

නොයෙක් වෘත්තිය සමිති තමන්ට හිතවත් පෙළඹී ඇත. මේ සැම කොටස්ම 'කම්කරුවනි එක්වව්' කියමින් වෙන් වෙන්ව පෙළපාලි යති. රැස්වීම් පවත්වති. එදින කථා කරන්නේ කම්කරුවා ගැන නොව අනිකුත් පක්ෂවල වැරදි අඩු පාඩුකම්ය. කම්කරුවන්ට සුරංගන කථා කියති. කම්කරුවාද තම අයිතිවාසිකම් පසෙක තබා දේශපාලන පක්ෂවල ප්‍රචාරයන් ගෙනයාම සඳහා දේශපාලන පක්ෂවල අතකොලුවක් බවට පත්වී ඇත.

කම්කරු ජනතාවගේ අයිතීන් දිනාගැනීම සඳහා අවංකව ක්‍රියා කළ දේශපාලකයන් වෘත්තිය සමිති නායකයන් අප රටේ සිටියහ. දැනුත් සිටිනු ඇත. උදේ සිට සවස්වන තුරුම පෙළපාලි ගොස් සුරංගනා කථා අසා හෙම්බත්වී රාත්‍රියේ නිවසට යන කම්කරුවා පසුදා නැවත සුපුරුදු වියගහම කර තබා ගනිති.

කම්කරු ජනතාව සතු විශාල බලයක් ඇත. එම බලය රටේ දියුණුව සඳහා මිස අනි අයගේ පටු අරමුණු ඉටුකර ගැනීම පිණිස නොයෙදිය යුතුයි. රටේ කුමන පළාතක සිටියත් කුමන ජාතියක වූවත් කම්කරුවා තම ශ්‍රමය වැය කරන්නේ රට වෙනුවෙනි. මෙදින කම්කරුවන්ට උපකාර කිරීම, ඔවුන්ගේ සේවය අගය කිරීම ඉතා වැදගත්ය. ඔවුන් මෙදා වෙන් නොකර එකම කම්කරු ධජයක් යටතට පත්කළ යුතුය. වේදිකාවලින් හඬනගන කම්කරුවන්ගේ සාධාරණ ඉල්ලීම් ඔවුන්ට ලබාදීමට වහා පියවර ගත යුතුය. කම්කරු දිනයට නියම අරුතක් ලැබෙන්නේ එවිටය. නැතහොත් කම්කරු ජනතාව සුරංගනා ලොවකට ගෙනයන තවත් එක් දිනයක් වනු ඇත.

**ඩොරින් පෙරේරා**
මොරටුව

# විදුලි බිල වැඩි කිරීමෙන් හෙළි කළ නිරුවත

**කතුතුමනි,**



යෝජිත විදුලි බිල වැඩි කිරීම තුළින් සමස්ත පොදු ජනතාවම ඉමහත් අපහසුතාවයට පත්වන බව නොරහසකි. විපක්ෂය විදුලි බිල වැඩි කිරීමට විරෝධය පල කරන විට ආණ්ඩු පක්ෂයේ ඇතැම් කොටස් විපක්ෂය කවදත් රජයේ ක්‍රියා මාර්ග වලට විරුද්ධ වන බව කියමින් විදුලි බිල වැඩි කිරීම සාධාරණීය කිරීමට යත්න දරනු පෙනේ. තම පැවැත්ම සඳහා කරනු ලබන මෙම ක්‍රියා මාර්ග තුළින් ගම්‍ය වනුයේ ඉතාමත් අපහසුතාවෙන් ජීවත් වන පොදු ජනතාවට කෙතරම් ලෙංගතු ද යන්නයි.

එහෙත් පාඨලී චම්පික, විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර තිස්ස විතාරණ, ඩලස් අලහප්පෙරුම වැනි ඇමතිවරුන් එයට ප්‍රසිද්ධියේම විරුද්ධත්වය ප්‍රකාශ කර ඇති බවද අමතක කළ යුතු නැත. අනිකක් තබා නව ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ද සාමූහික වගකීමෙන් බැහැරව මෙය මගේ යෝජනාවක් නොව හිටපු ඇමතිගේ යෝජනාවක් යයි කීමට පෙළඹීම තුළින් පැහැදිලි කරන්නේ මෙය පොදු ජනතාවට පීඩාකාරී බව පිළිගැනීමකි.

ඒ අස්සේ මෙවර රජයේ මැයි දින උත්සවයේදී සහනශීලි ක්‍රියා මාර්ග කිහිපයක් ගැනීමට පියවර ගන්නා බව ජනපති තුමා ප්‍රකාශ කිරීම තුළින් රජය ඕනෑම අහිතකර පියවරයන් ගත්තද ජනතාව ගැන නොසිතා ක්‍රියා කරන ඇතැම් දේශපාලකයන්ට වූයේ නන්නත්තාර වීමයි. ජනතා අභිලාෂයන් ඉටුකිරීම තම පිළිවෙත බව කියමින් වේදිකාවල මරහඬ තලන ඇතැම් දේශපාලකයන්ගේ නිරුවත හෙළිවීමකි.

**තියබෝල්ඩ් සමරතුංග**
රත්නපුර

# ශුද්ධාත්මයාණන් පිළිගැනීමට පෙළ ගැසෙමු

**කතුතුමනි,**



ජේසුස් වහන්සේගේ ශ්‍රාවක පිරිස ප්‍රාණවත් වී දේශාන්තරවල යෑමට මූලික වූයේ ශුද්ධාත්ම බලයයි. එය එසේ මෙසේ බලයක් නොවීය. 'ශුද්ධාත්මයාණන් වැඩිය කල නුඹලා බලය ලබන්නහුය'යි ජේසුස් වහන්සේ මුලින්ම ප්‍රකාශ කළේ ඒ නිසාමැයි.

එය සාක්ෂාත් කරමින් ශ්‍රාවක පිරිස උන්වහන්සේ කළ ක්‍රියාත්, උන්වහන්සේගේ දේශනත් මහත් ගර්වයකින් යුතුව කළහ. යුදෙව්වරුන් අන්ද මන්ද විය. නායක පූජකයෝ විපිලිසර විය. ජනතාව වැල නොකැඩී කතෝලික දහම වැළඳගත්හ.

අපටද මෙය මහා ආදර්ශයකි. ශුවිශේෂ පාඨවලට පමණක් සීමා නොවී ශ්‍රාවකයන් පරිදි ක්‍රිස්තු තුමන්ගේ ජීවිත පැවැත්ම අපටද අනුබද්ධ කර ගනිමින් දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා දායකවීමයි. දෙවි සමිඳුන්ගෙන් අප එකිනෙකාට ලැබී ඇති තලෙන්තු එකෙන් හැටක් උපදවා ගනිමින් නියම ක්‍රිස්තු අනුගාමිකයෝ වෙමු.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**
මීගමුව

# යක්ෂයා කවුරුද?

**කතුතුමනි,**

මෙය කාලෝචිත හෝ ප්‍රයෝජනදායි මාතෘකාවක් නොවුනත් ප්‍රදීපයේ 'ජනතා හඬ' ඔස්සේ කතු තුමන්ට ලියැවුනු ප්‍රිති ජයසූරියගේ ලිපිය දැක අදහස් කිහිපයක් සටහන් කිරීම උචිතය යැයි සිතීමි. ප්‍රථමයෙන් ඔබ යක්ෂයාගේ මිතුරෙක්ද? යන ශාස්ත්‍රිය ලිපියේ මුඛ්‍ය පරමාර්ථය වූයේ මිනිසුන් පරීක්ෂාවට වැටෙන ආකාරය පෙන්වාදීම නොව යක්ෂයාට පැවැත්මක් ඇත යන්න ඔප්පුකර දැක්වීමය.

එහෙත් අපගේ වහරේ යක්ෂයා යන්නට අර්ථ කිහිපයක්ම ඇත. ඉන් එකක් වනුයේ යක්ෂ ගෝත්‍රයයි. පොදු වහරේදී 'නුඹ යකෙක්' යන ප්‍රකාශයෙන් අදහස් කෙරෙනුයේ වීරයෙක්, දක්ෂයෙක්, අභීතයෙක් මෙන්ම දරුනු, අනුකම්පාවක් නැති පුද්ගලයකැයි ආදී දෙයක් විය හැක. ඒවා එම ගෝත්‍රයට පොදු ලක්ෂණ වූවා විය හැක. දෙවැන්න නම් යක්ෂයා යනු දෙවියන්ට සමාන බලයක් සතු ආත්මයකි. කාලි විටෙක, දේවතාවියක්ද විටෙක යකින්නියක්ද වශයෙන් ආමන්ත්‍රණය කෙරේ. එහෙත් කතෝලික අප යක්ෂයා යන්නෙන් අදහස් කරන්නේ දෙවියනට විරුද්ධ වූ එනම් අයහපතම තම භවය වූ ආත්මයකටය. මෙම ආකල්පය ඇතිව කෙනෙකුට 'නුඹ යක්ෂයාගේ මිතුරෙක් ද?'යි ඇසීමට අපට නොහැක්කේ ඕනෑම නරක පුද්ගලයකු තුළවුවද ගිනි පුපුරක තරම්වත් හොඳක් තිබිය හැකි නිසාත් අප දිය යුත්තේ බලාපොරොත්තුව නිසාත්ය.

යමකුව යක්ෂයාගේ මිතුරෙකිය කියා ලේබල ගැසීම කිසිසේත්ම සදාචාරාත්මක නොවන අතර අප ඕනෑම අපරාධකාරයකුට වුවද පිදිය යුත්තේ දේව දයාවේ හස්තයය. ක්‍රිස්තියානිකම නම් එයයි. එමෙන්ම සියලුම මිනිසුන් දුර්වලය. තවත් අයෙකු යක්ෂයාගේ මිත්‍රයෙකුදැයි ඇසීමට නම් තමන් සියලු දුර්වලකම් වලින් නිදොස් විය යුතුය. අනෙක් අතින් පුද්ගලයකු වරදකට වැටුන නිසාම ඔහු යක්ෂයාගේ මිත්‍රයෙකියැයි විනිශ්චයක් දීමට අපට අයිතියක් නැත. අප අද කළ යුත්තේ මනුෂ්‍ය දුර්වලකම් හරිහැටි අවබෝධ කරගෙන දේව ප්‍රේමය තුළින් දුර්වලකම් දුරුකර ගැනීමට අත්වැල් සැපයීමය. යක්ෂයා පෙන්වා බිය වද්දා යක්ෂයාගේ මිතුරන්ය කියා ලේබල ගසා මිනිසුන් යහපතට හැරවීමේ හැකියාවක් අද නැත. යක්ෂයා සිටියා හෝ නැතා හෝ වැදගත් වන්නේ දෙවියන් සිටිනා බව තේරුම් ගැනීමය.

අවසාන වශයෙන් සඳහන් කළයුත්තේ නම් ලියුම්කරු තම මිතුරන් යක්ෂයාගේ මිතුරන් ලෙස දක්වීමය. එය අරුමයකි. බොහෝ විට ලිපිය ලියා ඇත්තේ ආරූඪ නාමයකින් බව ඉන් පෙනී යයි.

**දොමිනික් රුද්‍රිගො**
ඇවරිවත්ත

# දරුවන් පාසල් පෙළ පොත් වලින් නිසි ඵල ලබා ගන්නවාද ?

**කතුතුමනි,**

රජය වාර්ෂිකව මහජන මුදල් රුපියල් කෝටි ගණනක් වැය කර පාසල් දරුවන්ට නොමිලේ පෙළ පොත් ලබා දෙයි. කිලෝ කීපයක් බර එම පොත් තොගය ඉතා අපහසුවෙන් දිනපතා ළමුන් පාසලට ඔසවාගෙන ගොස් ආපසු ගෙනත් තබයි. එහෙත් දරුවන් බහුතරයක් මෙම පෙළ පොත් කියවා නිසිඵල ලබා නාගන්නා බව පෙනී යන්නකි.



බොහෝවිට පහල සිට ඉහල දක්වා පියවරෙන් පියවර කරුණු අවබෝධවන ලෙස පෙළ පොත් සකස් කර ඇතත් කියවා ඒවායින් උපරිම දැනුම ලබා ගැනීමට දරුවන් උනන්දු වන්නේ නැත. රූපවාහිනිය හා පරිගණකය සමග දරුවන් පැය කීපයක් ගත කරතත් වෙනත් බාහිරදෙයක් තබා පසු දිනට ඇති විෂයය සම්බන්ධ පාඩමවත් කියවා අවබෝධ කර ගැනීමට උනන්දුවක් නැත. ඒ සම්බන්ධව දෙමාපියන්ගේ අවවාදද නොසළකන තත්ත්වයකට පත්ව ඇත. ප්‍රසිද්ධ විභාග දෙකතුනේදී නගරබද හා බැහැර පළාත්වල විශේෂ කුසලතා ඇති දරුවන් කීප දෙනෙකුගේ ප්‍රතිඵල සම්බන්ධව බලධාරින් පුරසාරම් දෙඩුවත් විශේෂයෙන් ගණිතය, ඉංග්‍රීසි භාෂාව හා විද්‍යාව යන විෂයයන් සම්බන්ධව දරුවන්ගේ ඇත්තේ බියකි. උසස්යයි සම්මත පාසල්වල ඉහල පන්තිවල සමහර දරුවන්ට පවා ගණිත චක්‍රය පාඩම් නැත. සාමාන්‍ය ඉංග්‍රීසි ලිපිනයක් කියවා ගත නොහැක. සමහරෙකුට මව් භාෂාව තම ශ්‍රේණියේ තරමට ලිවීමට කියවීමට නොහැක. පහසුකම් අඩු ප්‍රදේශවල තත්ත්වය කිවයුතු නොවේ. මෙයින් පෙනී යන්නේ ඉගෙනීමේත්, ඉගැන්වීමේත් යම් අඩුවක් කොහේ හෝ තිබිය යුතු බවය. අද පෙර පාසල් දරුවාගේ සිට උසස්පෙළ දක්වා දරුවන් අතිරේක පන්ති නොහොත් ටියුෂන් පංති කරා නොනිමෙන පිපාසයකින් ඇදී යන්නේ මේ නිසාය. එයිනුත් ඉතා ස්වල්ප දෙනෙක් ඵල ලබා ගන්නා අතර අනෙක් බහුතරය විලාසිතාවකට ඒ සඳහා පෙළඹී ඇත. ඒද බොහෝවිට දරුවන්ගේ නොව දෙමාපියන්ගේ වුවමනාවටය.

කෙසේ වුවද දැනුම වැඩුම සඳහා කියවීම අත්‍යවශ්‍යය. ඒ සඳහා පාසල මගින් දරුවන් පෙළඹ වීමේ අඩුවක් ඇතැයි පෙනේ. මේ සඳහා පසුදිනට ඇති, කියවා අවබෝධකර ගත හැකි පෙළපොතේ පාඩම කියවාගෙන එන ලෙස දරුවන්ට දැනුම් දී පසු දින පාඩම ආරම්භයට පෙර සුළු කාලයක් ඒ සඳහා වෙන්කර ළමුන් කීප දෙනෙකුගෙන් ප්‍රශ්න කිහිපයක් ගුරුවරයා විසින් විමසීමෙන් දරුවන් පොත් කියවීමට පෙළඹවිය හැක. එමගින් සිසුවාට පාඩම පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකි වීමත්, ගුරුවරයාට පාඩම පහසුවෙන් අවබෝධකර දීමට හැකිවීමත්, දරුවන් කියවීමට නිරායාසයෙන් පෙළඹවීමකුත් ඇතිවේ යයි සිතමි.

එසේම රැකියා නොමැති උපාධිධාරීන් බඳවාගෙන පුහුණුකර පාසල් වෙත ගොස් දරුවන්ගේ දැනීම පරික්ෂා කිරීමේ අඛණ්ඩ විධිමත් වැඩපිළිවෙලක් ඇති කිරීමෙන්ද වඩා යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිවනු ඇත.

**බර්නාඩ් පී. දාබරේ**
එඬේරමුල්ල



# කතෝලික සභාවේ විශිෂ්ටත්වය - 05

**පසුගිය සතිය හා සබැඳේ....**

**14. වර්තමාන ලෝකයේ කිතුනු සභාවන් සහ මූලධර්මවාදි කණ්ඩායම් රැසක් ඇත්තේ කෙසේද? බෙදීම ඇති වුයේ කුමන හේතුන් නිසාද?**

**නොයෙකුත් කාලවලදී විවිධ හේතුන් මත බෙදීම් ඇතිවිය. ඉන් සමහරක් මෙසේය**

iv. කිසියම් සිද්ධියක් හේතුවෙන් ඇතිවූ සභාවන් (උද :- වර්ෂ 1533 දී එංගලන්තයේ සිටි 8 වන හෙන්රි රජතුමන්ට තම බිසව වූ කැතරින් දික්කසාද කර ඈන් බොලින් සමඟ විවාහ වීමට 7 වන ක්ලෙමන්ට් පාප්වහන්සේ අවසර නොදුන් හෙයින් වර්ෂ 1534 දී එම රජුන් ඔහුගේ නායකත්වය යටතේ එංගලන්ත සභාව පිහිටු විය).

v. ශුද්ධ බයිබලය මුළුමනින්ම තම හිතුමතේට වචනාර්ථයෙන් තේරුම්ගැනීම සහ තමන් දෙවියන් වහන්සේ විසින් තෝරාගත් විශේෂ දිවැසිවරයකු ලෙස සිතූ සමහර අය විසින් 19 සහ 20 ශතවර්ෂ වලදී ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටුවන ලද කිතුනු මූලධර්මවාදි කණ්ඩායම්.

උදාහරණ :-
අ.) ''අනාගත ශුද්ධවරයින්ගෙන් සැදුම්ලත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සභාව'' (නොහොත් මෝර්මන්වරු) වර්ෂ 1829 දී ජෝසප් ස්මිත් විසින් පිහිටුවන ලද්දකි.

ආ.) වර්ෂ 1850 දී පමණ විලියම් මිලර් සමග හිරාම් එඩ්සන් සහ එලන් වයිට් ආරම්භ කළ සභාව වර්ෂ 1860 දී ''සෙවන්ත් ඩේ ඇඩ්වෙන්ටිස්ට්ස් සභාව'' යනුවෙන් නම් කරන ලදී. වර්ෂ 1844 දී ක්‍රිස්තුන් වහන්සේ ලෝක විනිශ්චය ආරම්භ කළ බවත් දෙවිඳුන් නියම කළ නිවාඩු දිනය සබත මිස ඉරුදින නොවන බවත්, එලන්වයිට් තමන් දුටු යයි පවසන දර්ශන ඇසුරින් ප්‍රකාශ කළාය.

ඇ.) වර්ෂ 1852 දී පෙන්සිල්වේනියාවේ පිට්ස්බර්ග් හි උපත ලැබූ (කොන්ග්‍රිගෙෂන් සභාවට අයත් වූ ) චාල්ස් ටේස් රසල් නැමැත්තා වර්ෂ 1872 දී ''මිලෙනියල් ඩෝනිස්ට්ස්'' නම් වූ සංවිධානයක් පිහිටුවාගෙන, ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමේ සුපුවත ලොවට ගෙන එන දිවැසිවරයා වශයෙන් තමන් ව හඳුන්වා ගත්තේ ය. වර්ෂ 1818 දී ''දේවගැති'' යන ගෞරවනීය තනතුරක් රසල් තමාට ම හිමිකරගත්තාට පසුව ඔහුගේ සංවිධානය ආගමික සංවිධානයක් බවට පත්වී වර්ෂ 1879 දී මෙම සංවිධානයේ නම ''මුරටැඹ සමාජය'' යනුවෙන් වෙනස්කරන ලදී. වර්ෂ 1930 දී ''යෙහෝවා : වහන්සේගේ සාක්ෂිකරුවෝ'' යනුවෙන් නැවත වරක් නම වෙනස් කරන ලදී.

ඈ. වර්ෂ 1900 දී ප්‍රැම් නමැති දේවගැතිවරයා විසින් තම සිසු පිරිස සමඟ ''පෙන්තකොස්ත සභාව'' පිහිටුවන ලදී. වර්ෂ 1909 දී ''මූලධර්ම'' යන නම ඇති කාණ්ඩ 12 කින් යුත් විශාල ග්‍රන්ථයක් ඇමරිකාවේ පළ කරනු ලැබිය. මෙම ග්‍රන්ථය මූලධර්ම ව්‍යාපෘතියට බලවත් රුකුලක් විය. පෙන්තකොස්ත සභාව තුළින් බිහිවූ කිතුනු කණ්ඩායම් 30,000 ක් පමණ අද ලෝකය පුරා දක්නට ඇත. මෙම කණ්ඩායම් විවිධ නම් වලින් හඳුන්වනු ලබන අතර, ඇතැම් විට ඒවා එකිනෙකට වෙනස් වූ පරස්පර විරෝධී මතයන් ද ඉදිරිපත් කරති. දිගු කාලීන පැවැත්මක් ද, පැහැදිලි ඓතිහාසික පසුබිමක් ද, ඉගැන්වීමේ නිල අධිකාරයක් ද නැති මෙම කණ්ඩායම් ශුද්ධ ලියවිලි පාඨයන්ට තමතමන්ට රිසි අයුරින් විවිධාකාර අර්ථකථනයන් ඉදිරිපත් කරති. ''ලයිට් හවුස් '' ''එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්'' , ''ස්මරණ'' , ''කල්වාරි'' , ''නව කල්වාරි'' , ''බෙත්ලෙහෙම්'', ''ජීවන ගංගා'' , ''නව ජීවන ගංගා'' සහ ''ජීවන දිය' වැනි කණ්ඩායම් 'තකොස්ත සභාව යටතේ බිහිවී ඇති මූලධර්මවාදී කණ්ඩායම් රාශියකින් සමහරකි.

**15. 16 වෙනි සියවසරේ ඇතිවූ සංශෝධන ව්‍යාපාරය හේතුවෙන් බිහිවූ සම්ප්‍රදායානුකූලව ගොඩනගන ලද කිතුනු සභාවන් අතරින් ශ්‍රී ලංකාවේ දැනට පවතින සභාවන් කවරේද?**

i. ලංකා සභාව (ඇන්ග්ලිකානු සභාව)
ii. මෙතෝදිස්ත සභාව
iii. ඕලන්ද නව සභාව
iv. ප්‍රෙස්බිටේරියානු සභාව
v. බැප්ටිස්ට් සභාව
vi. දකුණු ඉන්දියානු සභාව
vii. ගැලවීමේ හමුදාව

ඉහත සඳහන් සභාවන් මූලධර්මවාදී කණ්ඩායම් නොවන බවත්, එම සභාවන් සමග ශුද්ධවූ සභාව සුහදශීලීත්වයෙන් ක්‍රියා කරන බවත් සඳහන් කළ යුතුය.

**16. ශ්‍රී ලංකාව තුළ දැනට පවතින මුලධර්මවාදී කිතුනු කණ්ඩායම් කීපයක් නම් කරන්න.**

- ★ එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්
- ★ ලයිට් හවුස් සභාව
- ★ අපෝස්තලික සභාව
- ★ බෙතල් සභාව
- ★ කල්වාරි සභාව
- ★ නව කල්වාරි සභාව
- ★ ක්‍රිස්ටියන් එසෙම්බ්ලීස් ඔෆ් ලංකා
- ★ ඩිවයින් ලව් චර්ච්
- ★ ෆෝ ස්කොයැර් ගොස්පල් සභාව
- ★ ජීවන සභාව
- ★ නව ජීවන සභාව
- ★ යෙහෝවා : වහන්සේගේ සාක්ෂිකරුවෝ
- ★ මයි සේවියර් සභාව
- ★ සයන් සභාව
- ★ ෆිලඩෙල්ෆියා සභාව
- ★ රොක් සභාව
- ★ සෙවන්ත් ඩේ ඇඩ්වෙන්ටිස්ට්ස්
- ★ ස්පිරිචුවල් ක්‍රිස්ටියන් ෆෙලෝෂිප්
- ★ ලංකා පෙන්තකොස්ත සභාව
- ★ චර්ච් ඔෆ් ප්‍රෙයා
- ★ ඊස්ට් ලංකා ඉවැන්ජලිකල් මිෂන්
- ★ හවුස් ඔෆ් ප්‍රෙයා සභාව
- ★ ජීවන ගංගා සභාව
- ★ නව ජීවන ගංගා සභාව
- ★ ජීවන දිය සභාව
- ★ ජීසස් කම්ස් ඉවැන්ජලිකල් මිනිස්ට්‍රි
- ★ මොර්මොන්ස් සභාව
- ★ නිව් ලයිෆ් සභාව
- ★ පෙන්ටකොස්ටල් එසෙම්බ්ලි ඔෆ් ශ්‍රී ලංකා
- ★ ප්‍රෙයා ටැබර්නකල් සභාව
- ★ සැන්ක්චුවරි ෆෙලෝෂිප්
- ★ ස්මර්ණ සභාව
- ★ ට්‍රම්පට් සවුන්ඩ් මිනිස්ට්‍රීස්
- ★ බෙත්ලෙහෙම් සභාව
- ★ යුනයිටඩ් ක්‍රිස්ටියන් ෆෙලෝෂිප්

**ලබන සතියට....**

**වික්ටර් සිල්වා**

# පාස්කුව නිමාවිය

නත්තල ළඟට කිතු ජන හදවත බැඳගත් කිතුනු ආගමික උත්සව සමය වන්නේ පාස්කු සමයයි. නත්තල් සමයේ දී සතුට, ප්‍රීතිය උතුරා ගලා යද්දී, පාස්කු සමයේදී කිතුනු ජනතාවට ශෝචනීය ජනවන්දනාවකට පසු, ඔවුන්ගේ සිත් සතන් උද්දාම කරන අප සභා මාතාවගේ උත්කෘෂ්ටතම මංගල්‍යය වූ කිතු සමිඳුන්ගේ අජරාමර උත්ථානය කිතුනු ලොව ප්‍රීතියෙන් කළඹයි. ඔකඳ කරයි. සනහාලයි.

මෙම සුවිශේෂී විශිෂ්ට සමය කිතුනු ආධ්‍යාත්මය විවෘත කරන කාල වකවානුව වන්නේ ය. මෙහිදී ජේසු සමිඳුන්ගේ දුඃඛප්‍රාප්තිය සැමරීම ප්‍රමුඛත්වය ගනී. මීගමුව, හලාවත, කලාපයේ කතෝලික ගම්මානවල පසන් ගී, ලතෝනි, කයදුෂ්කර ප්‍රාර්ථනා ආදිය ගෙදරදොර සහ දේවස්ථානවල ගැයෙන්නේ අප ලාංකික ඌරුවට මුල්තැන දෙමිනි. භාරත පුත්‍රයකු වූ ගෞරවණීය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා, අප දේශයේ සංස්කෘතිය වටහාගෙන සිංහල හා දමිළ භාෂාවන් ගැන නිපුණත්වයන් ලබාගෙන, නිමැ වූ සුපිරි ආගමික ග්‍රන්ථ (ගද්‍ය, පද්‍ය) මඟින් මෙම දේශීය කතෝලික ආගමික සංස්කෘතිය බිහිකළ බව අවිවාදාත්මකය. මීගොමු දූව, පිටිපන ප්‍රමුඛ කතෝලික ගම්මානවල පාස්කු නාට්‍ය කලාව සහ සම්ප්‍රදාය බිහිවූයේ මෙම මං ඔස්සේ ය. මෙය කොතරම් අප සංස්කෘතියට කිඳා බැස්සේද යත් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශූරින් සිය නාට්‍යයන් සඳහා (මනමේ, සිංහබාහු ආදිය) තාල, රාග ලබාගත්තේ කිතුනු නාට්‍ය සම්ප්‍රදායයෙන් බව පුන පුනා පවසා ඇත. (එහෙත් පක්ෂග්‍රාහී වර්තමාන විදග්ධයෝ, මෙය අමතක කරති. සියල්ල සිංහල බෞද්ධ රාමුවෙන් කොටු කරති.

අප දේශීය සංස්කෘතියට, සිංහල බෞද්ධ සංස්කෘතිය මෙන්ම, දමිළ හින්දු සංස්කෘතිය ද විශාල ලෙස බල පෑ බව කිව යුතුය. එසේම අප දේශීය සංස්කෘතියේ ඉදිරි ගමනට සහ විකාශයට දේශීය කතෝලික සංස්කෘතිය ද බලපෑ බව පිළිගත යුතුය.

මෙම ඓතිහාසික පදනම ඔස්සේ පසුගිය පාස්කු සමයේ බිහි වූ විවිධ නාට්‍ය, සංදර්ශන ආදිය ගැන පසු විපරමක් කිරීම කාලෝචිත යැයි සිතමි. සිය ආගමික ශාස්තෘන් වහන්සේට උපරිම ගෞරව දැක්වීම දේශීය (බෞද්ධ) සංස්කෘතියේ සම්ප්‍රදායයි. මේ අනුව කිසිම නාට්‍යයක හෝ චිත්‍රපටයක බුදුන් වහන්සේ රංගනයෙන් නිරූපණය නොකෙරෙති. අංගුලිමාල, පටාචාරා වැනි චිත්‍රපටවල බුදුන් වහන්සේ දැක්වෙන්නේ ආලෝකමත් සිතුවමකිනි. නැතහොත් දීප්තිමත් හස්ත මුද්‍රාවෙනි. අනෙකුත් සියළු චරිත සඳහා දක්ෂ නළු නිළියන් යොදා ගැනෙන අතර ඔවුන් රංග නයෙන් එම චරිත වලට උපරිම සාධාරණය ඉටු කරති. මෑතක සිට අප රට ප්‍රදර්ශනය වන "ශ්‍රී සිද්ධාර්ථ ගෞතම" චිත්‍රපටය සඳහා ආරෝහපරිනාහයෙන් යුත් ඉන්දීය නළුවකු ද, යශෝධරා දේවි, මහමායාදේවි, ප්‍රජාපතී ගෝතමී ආදි චරිත සඳහා ඊට ගැලපෙන ඉන්දීය නිළියන් ද යොදා ගෙන ඇත. ඔවුන්ගේ රංගනය ද එම චරිත වලට අගෞරව නොවන පරිදි සිදුවේ. (පිටපත සහ අධ්‍යක්ෂවරයාගේ දස්කම් වේ) සිදුහත්, බිළිඳු හඬමින් ඉපදෙනු දක්නට නැත. ඒ වෙනුවට තිරවලින් වැසුනු, සල්ගස යට, බිළිඳු බිහිවන බව ඇඟවේ. ඉන්පසුව පෙන්වන්නේ සුවසේ නිදන සිදුහත් බිළිඳුය. සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය ද සිත් පහන් කරන අයුරින් පෙන්වයි. එසේම දුෂ්කර ක්‍රියා කරද්දී සිහිසුන්ව ඇද වැටීමද ගෞරවපූර්වකය. සිදුහත් කුමරු ශ්‍රී සම්බුද්ධත්වය ලබා ගැනීම, විවිධ ආලෝක ක්‍රම සහ පසුබිම් රංගන මඟින් අපූරුවට දක්වයි. බුදු රදුන්ගේ සම්බුද්ධ චරිතය කිසිවකු නිරූපණය නොකරයි. මේ සියල්ල අධ්‍යක්ෂවරයා ඉටු කළේ අප සංස්කෘතික රාමුව තුළ සිට බව ඉතා පැහැදිලිය.

මේ අනුව අප දේශීය සංස්කෘතිය තුළ පාස්කු නාට්‍ය සහ චිත්‍රපට විග්‍රහ කිරීම, යුක්ති යුක්ත මෙන්ම සාධාරණ වන්නේ ය. (අප දේශයේ බහුතරය සිංහල, බෞද්ධ ජනතාව බව අමතක නොකළ යුතුය) පාස්කු සමයේ පෙන්වූ "ක්‍රිස්තු චරිතය" (රූපවාහිනි නාලිකාවක් ඔස්සේ) චිත්‍රපටයේ මරිය තුමිය චරිතය බැතිබර, සැදැහැවත් ජුදා තරුණියක් ලෙස නිරූපනය නොවන බව පෙනේ. අනෙක් ජුදා ස්ත්‍රීන් හිස වසා සිටියද, චිත්‍රපටයේ මරියතුමී හිස වසා නැත. දෙවිඳුන්ට ලැදිව නිතර යාච්ඤා කරන කාන්තාවක් ලෙස එතුමිය හුවා නොදැක්වේ. ඇයට ගාබ්‍රියෙල් දේවදූතයා (චිත්‍රපටයේ පෙන්වන්නේ ආලෝකයක් ලෙසය.) දිස්වන්නේ නිදා සිටින විටය. එසේම ජේසු බිළි වේදනාවෙන් බිහිකරන බව සහ ජේ බිළිඳු මිනිත්තුවක් පමණ හඬමින් ඇඹරෙමින් සිටිනු පෙන්වයි. එහෙත් සිද්ධාර්ථ ගෞතම චිත්‍රපටයේ මෙම අවස්ථාවන් ප්‍රේක්ෂකයින්ට පෙන්වන්නේ නැත. පෙන්වන්නේ සැනසීමෙන් නිදා සිටින සිද්ධාර්ථ බිළිඳුය. මෙලෙස ශාස්තෘවරයාණන්ට ගරු සරු බව දැක්වීම අප සංස්කෘතික රටාව බව, කිතුනු නාට්‍ය නිෂ්පාදකයින් (කිතුනු චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ද) අවබෝධ කර ගැනී ඉතා වැදගත් වේ.

එකල පාස්කු නාට්‍යවල මූලික තේමාව වූයේ අප සංස්කෘතික රටාව තුළ කිතුනු ආධ්‍යාත්මයට ආමන්ත්‍රණය කිරීමය. එය කිසිසේත් ප්‍රසාංගික වේදිකා නාට්‍යයක් නොවී මෙම පසුබිම ඔස්සේ අප සමිඳුන්ගේ මහා දුඃඛප්‍රාප්තිය, කිතුනු හදවතට දහම් රසය ලබාදීමේ චේතනාවෙන් විකාශය වුනි. ජේසු සමිඳුන් මෙන්ම කිතුනු ජන හදවත බැඳගත් මරිය වහන්සේ ද නිරූපනය වූයේ විශාල ප්‍රමාණයේ ඇව මුවා ප්‍රතිමා මඟිනි. මෙම චරිතයෙන් දුඃඛප්‍රාප්ති සංදර්ශනයේ විවිධ අවස්ථා දැක්වීමේදී, වේදිකාවේ එහා මෙහා ගෙන යනු ලබන්නේ ඉතා ගෞරව පූර්වකවය. කස පහර දෙනු ලබන්නේ ද, බිම ඇද වැටෙනු දක්වනු ලබන්නේ ද සංයමයෙන් යුතුවය. (ශ්‍රී ශරීරයට වධ හිංසා කිරීම බැතිමතුන්ගේ හදට අකැප බැවින් මෙම අවස්ථා දැක්වූයේ අභිනරංග නයන් ලෙසටය.) අනෙක් අතට ජුදාස්, පිලාත්, කයිපාස්, අන්නාස්, වැනි චරිත පොළවේ අඩි හප්පමින්, හඬ වේදිකා පුරා විහිදුවමින් දෙබස් උච්චාරණය කළේ ප්‍රේක්ෂකයින් කුල්මත් කරවමිනි. ජේසු සමිඳුන්ගේ ගැඹුරු, උදාර හඬ ලබා දෙන ලද්දේ පියතුමකු විසිනි. (කිසිම මිනිස් නළුවකුට ජේසු සමිඳුන් නිරූපණය කළ නොහැකි බව බැතිමත් කිතුනු

# ඓතිහාසික

# ශ්‍රී ලංකාවේ යහපත් එඬේරා

භාවනාශීලි නිකායක් අරඹනු වස් යහපත් එඬේරා නිකායේ නිර්මාතෘවරිය වූ ශාන්ත මේරි යුෆ්‍රේසියා පෙලෙටියර් මව්තුමිය හට 1829 දී එක්තරා අදහසක් මතුවිය. එය එතුමිය තුළ ධ්‍යානගත වූ ඓතිහාසික සිහිනයකි. මුළු ලොව ම වැළඳගත් නිර්මාණශීලි ස්වභාවයෙන් හා අපෝස්තලික ජ්වලිතභාවයෙන් පිරිපුන් වූ එතුමිය එම ඓතිහාසික සිහිනය සැබෑ කරගනු වස් ඉදිරියටම ගමන් කළාය. එම ගමන නිමා වූයේ, මුලදී ශාන්ත මරිය මග්දලේනා නමින් හැඳින්වුනු අද යහපත් එඬේරා භාවනාශීලි සොහොයුරියන්ගේ නිකාය 1831 දී ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් ය.

අප රට තුළ ද යාච්ඤාවේ - ආත්ම දමනයේ - නිශ්ශබ්දතාවයේ හා ඇතුළාන්ත බවේ ජීවිතයක් ඇරඹීමට මං පෙත් විවර කරන ලද භාවනායෝගී දූත සේවාව පිළිබඳව කියැවෙන ඒ අතීත ඉතිහාසයට දැන් අපි පිවිසෙමු.

"ලංකාව තුළ මග්දලේනා සොහොයුරියන් ලබා ගැනීමට අපට නොහැකිවන්නේ මන්දැ"යි නායකකන්ද ගෘහයේ විසූ නිහතමානි ඩොලොරෝසා නමැති උපස්ථායික සොහොයුරිය, ඔවුන් භාරව සිටි තෙරෙස් ඩේලි නම් වූ යහපත් එඬේරා සොහොයුරියගෙන් ප්‍රශ්න කළාය. "නොනවත්වා යාච්ඤා කරන්න" යනු තෙරෙස් සොහොයුරියගේ පිළිතුර විය. එම අදහස සාර්ථක කරගනු වස් ඔවුහුද යාච්ඤාවේ නිරත වූහ. අවසානයේ දී එවකට ප්‍රාදේශිය ශ්‍රේෂ්ඨවරියව සිටි මේරි ගුඩ් කවුන්සල් මව්තුමිය විසින් හිල්ඩා රුදිගු නමැති තරුණියව බැංගලෝර්හි භාවනාශීලි නව තාපසික ගෘහය වෙත යවන ලදි. 1958 අප්‍රියෙල් 17 වැනි දින ඇය භාවනාශීලි තාපසිකාවක් ලෙස මේරි හෝලි රිඩීමර් යන නමින් තාපසික වස්ත්‍ර ලබා ගත්තාය. 1961 ජුලි 22 වැනි දින ඇය ප්‍රථම වේදභාර ගිවිස ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම යහපත් එඬේරා භාවනාශීලි තාපසිකාව වූවා ය.

හිල්ඩා අනුව යමින් ඉන්පසුව චාලට් ප්‍රනාන්දු සහ ඩොරති සිල්වා ද බැංගලෝර්හි නව තාපසික ගෘහයට ඇතුළු වී සිය තාපසික ජිවිත ඇරඹූහ. වීසා ප්‍රශ්නය හේතුවෙන් ඔවුනට 1963 මැයි 31 වැනිදා වනවිට ඉන්දියාවෙන් පිට වී යාමට නියම විය. එහෙත් වරායට සපැමිණි ඔවුනට ගමන් ඇරඹීම සඳහා නෞකාවක් නොවී ය. එසේම ඉන්දියාවේ තවදුරට රැඳී සිටීමට ද ඔවුනට වීසා බලපත්‍රයක්



නොවීය. සොහොයුරියන්ගෙන් කිසිදු තොරතුරක් නොලැබුන හෙයින් කොළඹින් මදුරාසියට කතා කරන ලදි. ඔවුන් කියා සිටියේ සොහොයුරියන් පිටත් වූ බවයි. දෙරට අතර මහත් කලබැගෑනියක් ඇති විය. දින තුනකට පසුව විඩාවෙන් - බලාපොරොත්තු සුන්වීමෙන් පිරී සිටි ඔවුහු කිළිටි ඇඳුමෙන් යුතුව නැවත මදුරාසියේ කන්‍යාරාමය වෙත පැමිණියහ. මේරි මැටිල්ඩා සොහොයුරිය ඔවුන්ව ආදරයෙන් පිළිගෙන වීසා

# ...ි ! පසු විපරමක්

හැඟීම විය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුත් බුදුන් වහන්සේ ද කිසිම නළුවකුට නිරූපණය කළ නොහැකි බව බැතිමත් බොදුනු හැඟීම වන්නාසේය.)

මෙම පසුබිම නිසා පාස්කු නාට්‍ය වනාහි ප්‍රසාංගික වේදිකා නාට්‍යයක් නොව, අතිශයින්ම කිතුනුවන්ටම සීමා වූ භක්ති අභ්‍යාසයක් පමණක් බව භක්ති පූර්වක රංගනයක් බව එදා කිතුනු නාට්‍ය ශිල්පීන් පැහැදිලිවම අවබෝධකොට ගෙන තිබුණි. එය එක්තරා අන්දමකින් විකාශනය වුණු පාද නමස්කාර මෙහෙයයක් බඳු විය.

එහෙත් වානිජකරණය සහ දේශපාලනීකරණය නිසා කතෝලික අපගේ අතිශයින් ආගමික අභ්‍යාසයක් පොදුජන වේදිකාවක් බවට පත්වීම ඛේදජනකය. විමුක්තිකාමියකු ලෙස, පොදු ජනතා වීරයකු ලෙස ශුද්ධවූ බයිබලයේ මූලික හරයන් යටපත් කරමින්, පසුගිය දශකය තුළ දුඃඛප්‍රාප්තියේ කතාව, විවිධ තේමා ඔස්සේ ප්‍රසංග වේදිකාවන්හි ඉදිරිපත් කිරීම කණගාටුදායකය. ජේසු සමිඳුන් පඹයකු මෙන් (සමාවනු මැන සමිඳුනි), කෙසඟ මිනිසකු මෙන් වේදිකාවේ එහා මෙහා ඇක්කවීම (අහිංසක බැටළු පෝතකයා සිහිපත් වේ) අපහාසයක් බව ඉඳුරා කිව හැකිය. ශුද්ධවූ බයිබලයේ කථාව ඉක්මවමින් කස පහර දීම (දීර්ඝ වේලාවක් තුළ) අධි රංගනයකි. මෙය ප්‍රබලව රඟපාන අනෙකුත් බයිබල චරිත අතර බයිබලයේ මහා පුරුෂයා වූ ක්‍රිස්තු සමිඳාණන් පාස්කු වේදිකාවේදී "පීචං" චරිතයක් බවට පත් වූ සැටියක් නොවේද? බයිබල කථාවේදී කිතු සමිඳුන් බොහෝ විට මුනිවත රැකි බව සහ උන්වහන්සේගේ මනුෂ්‍යභාවය තහවුරු වූයේ ශ්‍රී වාක්‍ය හතෙන් බව සහ මල් උයනේ මහා යාච්ඤාවෙන් බව ඉතා පැහැදිලිය. එහෙත් ජනප්‍රිය පාස්කු නාට්‍යවලදී මේ උතුම් අවස්ථා නොසලකා හැර ඇත. මිනිස් රංගනය නිසා සහ දෙබස් විකෘතිය නිසා ඒ ද යටපත්ව ඇත.

බයිබලීය දෙබස් සහ සිද්ධි අනුපිළිවෙල වෙනස් කිරීම නිසා පාස්කු චිත්‍රපටවල කිතුනු හරයට ඇඩි හානි සිදුව ඇත. ජේසු සමිඳුන්ගේ දුඃඛප්‍රාප්තිය, ප්‍රසංග වේදිකාවේදී විකෘති වීම, ජේසු සමිඳුන් තමන් වහන්සේගේ අනාගත දුඃඛප්‍රාප්තිය සහ අසහාය අසමසම උත්ථානය ග ැන සිය ගෝලයින්ට දැන් වූ කල, පේදුරුගේ ප්‍රතිචාරයට දුන් සමිඳුන්ගේ ප්‍රති උත්තරය ඊට කදිම පිළිතුරක් ලෙස පෙන්වා දිය හැකිය. පේදුරු ජේසු සමිඳුන් ගැන බලාපොරොත්තු තබා සිටියේ නොබෝ කලකින් ඊශ්‍රායෙල් ජාතිය බේරාගන්න මහා වීරයකු ලෙසය. විමුක්තිකාමියකු ලෙසය. මෙවැනි මනසකින් යුත් පේදුරු හට, ජේසු සමිඳුන් තමන් වහන්සේ සතුරන්ට පාවාදෙනු ලැබ කුරිරු මරණයට ගොදුරු වන බව ඉන්පසු මරණයෙන් උත්ථාන වන බව දැන්වූ කල්හි ඔහු ඇඩි සේ කම්පනයට පත් විය. එනිසාම හෙතෙම සමිඳුන් පසෙකට කැඳවා චෝදනා කරමින් මෙවැනි අවකැපෙන කතා නොකියන ලෙසද "එවැනි ඉරණමක් දුරින්ම දුරුවේවා! එවැන්නක් ඔබට කවදාවත් සිදුනොවේවා!" යැයි ප්‍රාර්ථනා කළේය. මෙයට පිළිතුරු දුන් සමිඳාණෝ පේදුරු අමතන වදාළේ "සාතන් අහකට යව, නුඹ මට බාධාවකි." නුඹ සිතන්නේ මිනිසුන් සිතන ලෙසට මිස දෙවියන් වහන්සේ සිතා බලන ලෙස නොව " යන යථාර්ථයද අපූර්වතම අනුශාසනයෙකි.

ඉදින් ඊනියා පාස්කු ප්‍රසංගයන්හි ජේසු සමිඳුන් රංගනය කරනු ලබන්නේ ලෞකික පේදුරු විසින් සමිඳුන් ලෞකික වීරයකු ලෙස කල්පනා කළ පරිදි නොවේද? දෙවියන් වහන්සේ සිතන පරිදි එනම් ජේසු සමිඳුන් මෙලොව බිහිවූයේ බොහෝ දුක් විඳ කුරිරු මරණයට පත් කරනු ලැබ, එහෙත් ජයග්‍රාහීව උත්ථාන වීම සඳහා පමණක්ය යන නිවැරදි කල්පනය ඔවුන් තුළ නැත.

මෙම මිසදිටු විග්‍රහය නිසා අප සමිඳාණන් ලෞකික වීරයකු, පීඩිතයින්, පවුකාරයින් වෙනුවෙන් පෙනී සිටි නායකයකු ලෙස යහපත් පුද්ගලයකු ලෙස පමණක් හුවා දැක්වීම නිසා කිතුනු නොවන ලාංකික ජනතාව ඉදිරියෙහි අප සමිඳුන්ගේ දේවත්වය බිංදුවට බස්සවා ඇත යනු නිබොරුවකි. මෙම යහපත් අහිංසක පුද්ගලයා මෙලෙස අසාධාරණ ලෙස මරණයට පත් කළේ මොන "කරුමයක්" නිසාදැයි ඔවුන් කම්පාවට මෙන්ම විමතියට ද පත්වනු ඇත. කිතු සමිඳුන්ගේ දුක් ගාවිනාව කේන්ද්‍රකොටගෙන පමණක් නාට්‍ය නිපදවීම නිසා කිතු සමිඳුන්ට වද හිංසා දීම අතිශයෝක්තියෙන් අධිරංගනයෙන් කිරීම නිසා කුඩා ළමයින් බියට පත් වූ අවස්ථා අපහසුවට පත් වූ අවස්ථා ලියුම්කරු අත්දැක ඇත.

සැබැවින්ම කිතු සමිඳුන්ගේ දුඃඛප්‍රාප්තිය අතිශයින්ම කිතුනුවන්ට පමණක් තේරුම්ගත හැකි ඔවුන්ට පමණක් අධ්‍යාත්මික ආලෝකයක් ලබා ගත හැකි ඓතිහාසික සිද්ධි සමූහයකි. මෙම ආධ්‍යාත්මික ආගමික වින්දනය ඉතා අපූරුවට මහා බ්‍රහස්පතින්දා දිව්‍ය පූජා මෙහෙයේ දී ගරු පියතුමා සහ ගිහි සැදැහැවතුන් කීප දෙනෙකු සම්බන්ධ වී කරන සුපුවත කියවීම් තුළින් කිතුනු බැතිමතුන් තුළ නිරායාසයෙන් ජනිත වන්නේ ය. මෙම සමයේදී දේවස්ථාන තුළ ගායනා කරනු ලබන කයදුෂ්කර ප්‍රාර්ථනා සහ අනෙකුත් පසන් ගී ලතෝනි ගී ආදියේ ද මෙම ධර්ම රසය තීව්‍ර වන්නේ ය. එසේම මහ සිකුරාදා බොහෝ දේවස්ථානවල ඉටු කරනු ලබන තුන් පැය ධ්‍යානය මඟින්ද, පාස්කු රංගනයට වඩා, විශාල භක්ති ප්‍රබෝධනයක්, සැදැහැවතුන් තුළ ඇති වන්නේ ය. පාද නමස්කාර මෙහෙයයන් ද එසේම වන්නේය.

මෙලෙස අප කිතුනු හදවතට ඉතා සමීප වූ ජේසු සමිඳු සහ මරිය තුමන්ගේ චරිතවලට හානි නොවන ලෙස කලා කෘතින් නිර්මාණය කිරීම, බහු ආගමික දේශයක් වූ අප සිරිලක කතෝලික, කිතුනු ජනතාවට කරන උපහාරයක් වන්නේ ය. උන්වහන්සේට නිසි ගෞරව දැක්වීම අප දේශීය සංස්කෘතිය තුළින් නික්මෙන උදාර ප්‍රතිචාරය වන්නේ ය. එසේම අප සමිඳුන්ගේ දුඃඛප්‍රාප්තිය සහ අජරාමර අසමසම උත්ථානය, උපහාසයට, අපහාසයට ලක් කිරීමට වගකිව යුතු නාට්‍යධරයන්, කලා ශිල්පීන් ඉඩ නොතැබිය යුතුය. මේ සඳහා අපගේ ශ්‍රේෂ්ඨ ආගමික නායකයින්ගේ මඟ පෙන්වීම, උපදෙස් තහංචි වැදගත් වෙයි.

**වෛද්‍ය නෙල්සන් දයානන්ද - මීගමුව**

# ...ත සිහිනයක් :
# ...ා භාවනාශීලි සොහොයුරියෝ

බලපත්‍ර සකස්කොට දී නැවත ගුවන් මඟින් ඔවුන් ලංකාවට එව්වා ය. මේරි යුෆ්‍රේසියා ඕ



කොනර් සහ මේරි ෆ්‍රැන්සිස් ඩි සේල්ස් වීල් යන සොහොයුරියන් විසින් ඔවුන් රත්මලාන ගුවන් තොටුපල දී පිළිගෙන බෝලවලාන කන්‍යාරාමයට ගෙන එන ලදි. ඒ 1963 ජුනි 5 වැනිදා ය.

1975 දී භාවනාශීලි සොහොයුරියන් බෝලවලානේ සිට වඩා නිස්කලංක පරිසරයකින් හෙබි හල්ගස්හේන ගෘහය වෙත ගෙන යන ලදි. පසුව 1989 දී ඔවුන් සඳහා නව ගෘහයක් නායකකන්දේ කන්‍යාරාම භූමිය තුළ ඉදිවිය. ඉන්පසුව හල්ගස්හේන ගෘහය වසා දැමීමට සිදුවිය. 1992 දී තවත් ගෘහයක් හංවැල්ල නිරිපොල දී ආරම්භ කරන ලදි. 2006 වසරේදී ද සුනාමියට ගොදුරු වූ කලමුල්ල ග්‍රාමය තුළ තවත් කන්‍යාරාමයක් විවෘත විය. දැනට ඇන්ගෝලාව, ප්‍රංශය, අයර්ලන්තය සහ ඉතාලිය යන රටවල ශ්‍රී ලාංකික සොහොයුරියන් සතර දෙනෙක් භාවනාශීලි දූත සේවාවේ නියැලී සිටිති.

ගැඹුරු යාච්ඤාමය ජීවිතයක් ගත කරනු වස්, ලෝකයෙන් ඈත් වී භාවනායෝගී තාපසික සමාජයකට ඇතුළුවන ඔව්හු, හුදෙකලාබව හා නිහැඬිබව ඒකරාශිව අගය කරති. ඝෝෂාකාරී ලොවක් තුළ ඔව්හු සාමකාමී ක්ෂේම භූමි බවට පරිවර්තනය වෙති. මෙම භාවනාශීලි සොහොයුරියෝ යහපත් එඬේරාණන්ගේ අපෝස්තලික සේවාවන් ද යාච්ඤාව තුළින් බෙදා හදා ගනිති. දේව දයාවේ සංකේත වෙමින් දෙවි සමිඳුන් ඉදිරියේ සමාව හා සමගි කරවීම පතා මැදිහත් වන්නෝ ඔවුහුය.

අද ජීවිතයේ ඛේදවාචකයන්ට ගොදුරුව, යාච්ඤාව සඳහා සාපිපාසාවක් ඇති ගිහියන් අපමණ දෙනෙක් මෙම සොහොයුරියන්ගේ ආරාම වෙත පැමිණෙති. තනිකමේ - ආත්මික, වියලි බවේ - වේදනාවේ උරුම සීමාවන් ඉක්මවා ගිය ජනතාව සමඟින් ඔව්හු එක්ව යදිති. ජීවිතය හසුරුවා ගැනීමට ඔවුනට උපදෙස් දෙති.

එබැවින් අප ශ්‍රී ලංකාවේ භාවනාශීලි සොහොයුරියන් මේ වසරේ ජුනි මාසයේ දී සිය ස්වර්ණමය ජුබිලිය සමරමින් ස්වර්ණමය මං පෙත් කරා අවතීර්ණ වන මොහොතේ දී ඔවුන් තුළින් අප ජනතාව වෙත දිස් වූ දෙවිඳුන්ගේ ගැළවීමදායක ක්‍රියාදාමය වෙනුවෙන් අපි එතුමාණන්ට තුති පුදමු. යාච්ඤාව හා මඟ පෙන්වීම සඳහා ඔවුන් වෙත පැමිණෙන ජනතාවගේ ජීවිත සක්‍රියතාවය මෙහෙයවමින් මෙම පනස් වසර පුරා ඔවුන් ගමන් ගත් විශ්වාසයේ හා නිහැඬියාවේ මංපෙත් වලට බල පෑ නොයෙක් ඓතිහාසික අවස්ථා සිය දූත සේවාව තුළ ගැබ් වී ඇත. තව දුරටත් ඔවුන්ගේ යාච්ඤාවේ හා නිහැඬියාවේ දූත මෙහෙවර තුළින් යහපත් එඬේරාණන්ගේ අපෝස්තලික සොහොයුරියන් කරන්නා වූ දූත මෙහෙවරට පංගුකාරයින් වීම සඳහා දේව කැඳවීම් ලැබෙන මෙන් ඉල්ලා යදිමු.

**ගරු මේරි ප්‍රාන්සස් පැව්දි සොහොයුරිය**

# යුරෝපය හා මැද පෙරදිග දත් ශ්‍රී ලංකාව

**ශ්‍රී ලංකාව ජලයෙන් වට වූ දූපතක් වූවත් ආදියේ සිට ම ලෝකවාසී ජනතාව එය දැන හැඳින සිටි බවට සාධක රැසකි. ඉන් ඉතා ස්වල්පයක් මෙසේ ය.**

ක්‍රිස්තු පූර්ව තෙවැනි සත වසරේ අලෙක්සැන්ඩර මහා රජතුමා ගේ කණ්ඩායමේ පුද්ගලයකු වූ කලිස්තිනීස් නම් වූ පුද්ගලයා ඉන්දියාවට පැමිණියේ ය. එම කණ්ඩායමේ ගමන් මෙහෙය වූ පුද්ගලයා ඔනසික්‍රිටස් ය. මේ දෙදෙනා ම දිවයින පිළිබඳ සටහන් කැර ඇත. එසේ ම ක්‍රිස්තු පූර්ව තෙ වැනි සත වසරේ ජීවත් වූ මෙගැස්තීනීස් නමැති ලේඛකයා ද ඇලෙක්සැන්ඩ්‍රියාවේ පුස්තකාලාධිපති එරටොස්තීනිස් ද දිවයින පිළිබඳ ලියා ඇත. මේ අය ක්‍රි. පූ. දෙවැනි සත වසරේ ජීවත් වූහ. (මේ වග තුග සඳහන් වන්නේ "ද සිලෝන් හිස්ටොරිකල් ජර්නල්"හි 1952 පළ කරන ලද ප්‍රථම වෙළුමෙහි ය.)

ක්‍රි. පූ. 63 - ක්‍රි.ව. 24 අතර ජීවත් වු ස්ට්‍රාබෝ නමැති ග්‍රීක භූ විද්‍යාඥයා සකස් කළ ග්‍රන්ථයේ කලාප 17 කි. මෙහි කලාප 11 සිට 17 දක්වා වූ කොටසෙහි දිවයින් ගැන සවිස්තරව සඳහන් වී ඇත. (මේ බව රජයේ මුද්‍රණාලය පළ කළ බ්‍රෝහියර් - පවුලස් ගේ "ලැන්ඩ්, මැප්ස් ඇන්ඩ් සර්වේස්" දෙ වැනි වෙළුමේ සඳහන් ය.

ටොලමි - ක්ලෝඩියස් නමැති ගණිත හා භූගෝල විද්‍යාඥයා ටැප්රොබේන් හෙවත් දිවයින ගැන ඔහු ගේ 3, 5 සහ 7 වැනි ග්‍රන්ථයන්හි සටහන් කරැත. එහි සිතියම ද දොළොසකි.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ

**141**

ඩියෝඩොරස් සිකුලස් නමැති ග්‍රීක ඉතිහාසඥයා ග්‍රන්ථ සතළිහක් පිළියෙළ කළ අතර, "ඉතිහාස පුස්තකාලයක්" බඳු ඔහුගේ කෘතීන් අතර 18 වැනි ග්‍රන්ථයේ මුල් කොටසේ දිවයින පිළිබඳ හෙතෙම විස්තර කරයි. මොහු ජීවත්ව සිටියේ ක්‍රි. පූ. පළමු සත වසරේ අග භාගයේ ය.

දෙවැනි සත වසරේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ දියනීෂියස් පෙරියජීටීස් නමැති භූගෝල විද්‍යා විශේෂඥයා ද දිවයින ගැන සඳහන් කර ඇත. භූගෝල විද්‍යාව පිළිබඳ ලියන මොහු දිවයින ගැන සඳහන් කැර ඇත. භූගෝල විද්‍යාව පිළිබඳ ලියන මොහු දිවයින ගැන ලියන ලද කොටස් ඇතුළු රැසක් ලතින් බසට පරිවර්තනය වී තිබේ. මේවා පසු කල පේට්‍රස් බර්ටියස් වැනි වියතුන් බොහෝ විට උපුටා දක්වා ඇත. මෙම ග්‍රන්ථ අද නෙදර්ලන්තයේ පුස්තකාලයක තැන්පත් කොට ඇත.

තවදුරටත් ක්‍රි.ව. සිව් වැනි සත වසරේ සිටි අවියේනස් නමැති කවියකු ද දිවයින ගැන සඳහන් කර ඇති බව කිව යුතු යි.

මෙයට අමතර ව අම්මියානස් මාර්සලීනස් නමැති සිරියාවේ ඇන්ටියෝක්හි ඉතිහාසඥයෙක් ඔහු ගේ 23 වැනි ග්‍රන්ථයේ දිවයින ගැන විස්තරයක් ලියා ඇත. ක්‍රි.ව. 330 - 395 අතර ජීවත්ව සිටි මොහු එකල මෙහි පැමිණි සිරියානු වැළඳුන් ගෙන් මෙම විස්තර ලබා ගත්තා විය හැකි ය. එසේ නැත්නම් ඔහු ම මෙහි පැමිණියා විය හැකිය. මීට හේතු වනුයේ ඉන්දියාව හා ඒ අවට දූපත් හා සිරියාව ද අතර ඉතා කිට්ටු වෙළඳ සම්බන්ධතා පැවැති හෙයිනි.

ඉන්දියාව සහ දකුණු ආසියාතික රටවල් සමඟ පර්සියාව සහ සිරියාව ද සේද මාවත ඔස්සේ නොයෙක් බඩු බාහිරාදිය එකල ආනයනය අපනයනය කළ බව නොරහසෙකි. සේද මාවත ඔස්සේ මෙන් ම නෞකා මඟින් ද සිරියානුවන් හා පර්සියානුවන් අප රටවලට පැමිණි බව නොරහසකි.

අද ඉරාණය සහ ඉරාකය වී ඇත්තේ පසු සඳහන් කළ මේ රටවල් දෙකයි. එහෙත් ඉස්ලාමය මැද පෙරදිග බිහිවීමත් සමඟ මේ රටවල් එම ලබ්ධිකයන් අතට පත්විය. එතැන් සිට අතරමැදි වෙළෙඳුන් බවට පත් වූවෝ අරාබි - ඉස්ලාමීය වෙළෙන්දෝ ය. මෙහි විපාක වශයෙන් එතෙක් ඒ රටවලින් අපට ගලා ආ කිතු දහම හා කිතුනු අනුග්‍රහය නැවැතී ඒ වෙනුවට ඉස්ලාමය දකුණු ආසියාවේ ද පැතිරීම යි.

ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් ක්‍රි.ව. 52 දී ඉන්දියාවට වැඩම කළේ ද සිරියාව ඔස්සේ ය. එතුමාගෙන් කිතු දහම හැඳිනගත් කිතුනුවෝ දකුණු ඉන්දීය කේරළ ප්‍රාන්තයේ අද දක්වා පැතිර සිටිත්. සීරෝ මලබාර සහ සීරෝ මලන්කාර කිතුනුවන් ලෙස හැඳින්වෙන කතෝලිකයෝ මොවුහුය.

ඉන්දියාවේ එකල සිටි ගොන්ඩෆෝරේස් නමැති රජතුමන් පර්සියාව හා සිරියාව සමඟ කිට්ටු සම්බන්ධතා පැවැත් වූ බවත් තම මාළිගය නිර්මාණය කැර ගැනීම සඳහා වඩු කාර්මිකයන් එහින් ලබාගත් බවත් කියැවේ. ශු. තෝමස් මුනිවරයාණන් ද මෙහි පැමිණියේ එම කණ්ඩායම සමඟ බව ඉන්දියාවේ ප්‍රචලිත ජනප්‍රවාදයකි.

මේ සියල්ලෙන් අනාවරණය වන්නේ මැද පෙරදිග හා දකුණු ආසියාව අතරත් ඇතැම් යුරෝපා රටවල් හා අප රට අතරත් එ කල සම්බන්ධතා, බෙහෙවින් පැවැති බව යි. මේ නිසා අප රටවල් වෙත කිතු දහම හඳුන්වාදීම සොළොස් වැනි සත වසරේ පෘතුගීසීන් වැනි යුරෝපා යටත් විජිතවාදීන් පැමිණෙන තුරු පමා නොවූ බව යි.

ලංකාව ආසන්නයේ - අත දිගු ප්‍රමාණයේ පිහිටි දකුණු ඉන්දියාව හඳුනාගත් කිතු දහම දිවයිනට ද හැඳින්වීම විමතියට හේතුවක් නො විය යුතුයි. පර්සියාව හරහා දකුණු ඉන්දියාවට වැඩමකොට, චීනයට ගමන් කිරීමේ අපේක්ෂාවෙන් සිටි ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් දිවයිනට පා තැබුවේ නැත්නම් එය අප මවිත කරවන්නකි. එතුමන් නියතින් ම මෙහි වැඩම කළ වග ග්‍රන්ථ කාණ්ඩ 18 කින් යුතු පෙරදිග කිතුනු ඉතිහාසයේ පළමු වසර 620 ඉතිහාසය ලියූ ග්‍රීක ඉතිහාසඥ නිකේෆොරෝස් කලිස්ටෝස් සන්තපොලෝස් සහතික කොට ලේඛනගත කර ඇත.

කලා සංග්‍රහය

# 'අම්මා ඔබයි' සංයුක්ත ගී තැටිය නිෂ්පාදනය කළ රණවිරු සිසිල් රණතුංග

කලාව එක්තරා රන් කාසියකි. ලෝකයේ සමහර අයට වැඩිපුර ලැබෙන අතර, සමහර අයට ලැබෙන්නේ අඩු ප්‍රමාණයකි. තමන්ට ලැබුණ ප්‍රමාණය කෙසේ වුවද එය වැඩිදියුණු කර වර්ධනය කර ගන්නා අය කලා ලොවේ සිටිති. සිසිල් රණතුංග මහතා එවැනි කලා කරුවෙකි. ඔහුට ලැබී ඇති සංගීත වාදන රන් කාසි ප්‍රමාණය වර්ධනය කරගත් තැනැත්තෙකි.

පල්ලන්සේන මීසමේ දූවන ප්‍රදේශයේ පදිංචි, කොච්චිකඩේ ශුද්ධාත්ම දේවස්ථානයට අයත් දායකයකු වුවද ඔහු 1985 මුරුතාන සා. අන්තෝනි දේවස්ථානයේ දහම් පාසලේ බටහිර තූර්යවාදක කණ්ඩායමට බැඳී පෝල් මාස්ටර් (ආදර නමින් යුත්) හා ජූඩ් ආනන්ද ගුරු පියාණන්ගෙන් සංගීතය සම්බන්ධ භාවිත කරන විශේෂ ප්‍රධාන ස්වර හත ඉගෙන ගනු ලැබීය. මෙම පාසලෙන් හා ගුරු පියවරුන්ගෙන් ඔහු ලබාගත් රන් කාසි තැන්පත් නොකර ඉන් ඔබ්බට දියුණු කර ගනිමින් ඕගන් වාදනය කෙරෙහි දැනීම ලබාගැනීමට සිසිල් රණතුංගයන් යුහුසුලු විය. ඒ සඳහා ලංකාවේ ප්‍රසිද්ධ ඕගන් වාදකයකු වන ඇන්ටන් පෙරේරා ගුරු පියාණන්ගෙන් එම ශිල්පයෙන් ද පුහුණුව ලැබීය.

මේ සියල්ලෙන් නිපුණත්වයක් ලබාගත් හෙතෙම කොච්චිකඩේ මධ්‍ය මහ විද්‍යාලයේ වාදනය සඳහා පමණක් නොව විවිධ කලා කටයුතු කෙරෙහි



තමා ලබාගත් මූලික දැනුම උපයෝගි කරගනිමින් කලා හා සංස්කෘතික කටයුතු කෙරෙහි සහයෝගය දැක්වීය. එපමණක් නොව මෙම අංශය තුළින් සිසු සිසුවියන් හා සම්බන්ධව විදුහල තුළ ආගමික කටයුතු කෙරෙහි ද ක්‍රියාකාරිත්වයක් ආරම්භ කළේය. තවද 1985-1989 දක්වා පස් වසරක් පියවරින් පියවර නගිමින් තමා ලබාගත් නිපුණත්වය තුළින් ශුද්ධාත්ම දේවස්ථානයේ දේව මෙහෙයන් වලදී විදුලි ඕගනය වාදනය කිරීමෙන් දෙවිඳුන් ප්‍රශංසා කිරීමට සහභාගි වූහ.

1989 දී සිසිල් රණතුංග විරුවාණන් ශ්‍රී ලංකාවේ යුධ හමුදා බටහිර තූර්ය වාදන කණ්ඩායමේ සාමාජිකයකු විය. එම කණ්ඩායමේ කිතුනු රණවිරුවන් දුටු හෙතෙම ඔවුන් හා සමග යුධ හමුදා ක්‍රිස්තියානි මිත්‍රත්ව සංගමය සමග සහයෝගය දැක්වූ අතර පුහුණු කිරීම් කටයුතු ඔහු විසින් මෙහෙය වන ලදී. වසරක් පාසා සම්ප්‍රදායිකව පවත්වන යුධ හමුදා උත්සව දිනයේදී පවත්වන දේව මෙහෙයදී වාදනයෙන් දෙවිඳුන්ට තුති පිදීම ඔහු වෙතින් කෙරිනි. එපමණක් නොව නත්තල් කැරොල් ගායන සංදර්ශණ ද පැවැත්වීමෙන් යුධ හමුදා බලකායන් නත්තල් සිරියෙන් ඔපගැන්වූහ. යුධ හමුදා වනිතා ඒකකය මගින් පවත්වනු ලබන සියලු ළදරු පාසල් උත්සව සාර්ථක කර ගැනීමට ගායනයෙන් ද වාදනයෙන් ද දායකත්වය ලබා දුන්නේ ඔහුය.

අනුරාධපුර යුද හමුදා තූර්ය වාදන කණ්ඩායම ඔහු බාරව සිටි අතර අනුරාධපුර 'විරු කැකුළු' ළදරු පාසලට ඔහු විසින් විශේෂ දායකත්වයක් ලබා දුනි. එම පාසලේ සිඟිති දරු දැරියන්ගේ උසස් දක්ෂතාවය හේතුවෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් පවත්වනු ලබන 'හඳ මාමා' වැඩසටහනට සහභාගි වීමේ භාග්‍යය ලබාගත්තේය. මෙම සියළු සේවා කටයුතු අන් අයට පවරා දෙමින් වසර 2011 දී යුද හමුදා ජීවිතයෙන් විශ්‍රාම ගත්තේය. විශ්‍රාමික සුවයෙන් පසුවන හෙතෙම ඉහත සේවා කටයුතු වල තම ගම් පෙදෙසෙහි දායක වෙමින් සිටී. මින් එක් අවස්ථාවක් ලෙස පල්ලන්සේන මීසමේ ප්‍රධාන දේවස්ථාන දෙකක් වන වික්ෂෝප දේවමාතා හා ශුද්ධාත්ම දේවස්ථානයන් හී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 'අම්මා ඔබයි' සංගීත සංයුක්ත තැටියක් නිෂ්පාදනය කර ඉන් ලැබෙන මුළු ආදායම සම්පූර්ණයෙන්ම පරිත්‍යාග කිරීම ඔහුගේ අරමුණයි.

**මෙල්වින් ද කෝස්තා**
කොච්චිකඩේ

# කිතු අඹරේ නොමියෙන කලාකරුවා

'යාගය' පාස්කු නාට්‍යයේද, 'පිනැති පුතෙක්' ජෝශප්ගේ කථාව නාට්‍යයේද. 'අසම්මත මිනිස්සු' නමැති ස්වතන්ත්‍ර වේදිකා නාට්‍යයේද නිර්මාතෘ කඳවල මීසම් සභාවේ ක්‍රියාකාරි සාමාජිකයෙකු වූ, ඇලෝසියස් ඉඳුරුව මහත්මා පොදුජන හද ගැස්ම හඳුනාගත් කෘතහස්ත කලාකරුවෙකි.

පළමු පෙළේ විදුහල්පතිවරයකු ලෙස වසර 15 කට නොඅඩු සේවාවක් ඉටුකළ මේ කලාකාමියා, තම පාසල් දරුවන් පුහුණු කරගෙන, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ අනුමැතියද ඇතිව මනමේ, සිංහබාහු, එලොව ගිහිං මෙලොව ආවා. රත්තරං වැනි නාට්‍යයන් පාසල් වේදිකාවේදී රඟ දක්වන ලදී. තවද, පාසල් නාට්‍ය තරග වලටද සිසු දරුවන් ඉදිරිපත් කරවන ලදී. එපමණක් නොව ඔහු තම මීසමට කරන ලද සේවය අනභිභවනීය ය. කඳවල මීසමේ සේවය කළ ගරු එච්. ඩී. ඇන්ටනි පියතුමාගේ 50 වන ජුබිලි උත්සව කමිටුවේ මූලිකත්වය ගෙන ක්‍රියා කරමින් අනඟි සමරු කලාපයක් නිර්මාණය කිරීමට ඒ මහතා සංස්කාරකත්වය දරමින් අනඟි දායකත්වයක් සැපයීය.

තවද, කඳවල මීසමේ අවමංගල්‍යාධාර සමිතියේ ආරම්භක සාමාජිකයෙක් වූ අතර, පසුව එහි සභාපති ධූරය වසර ගණනාවක්ම හෙබවීය. කඳවල සණස සමිතියේද සභාපති වශයෙන් සේවය කළ ඒ මහතා, අගනා සණස බැංකු ගොඩනැගිල්ලක් හා සමිති ශාලාවක්ද ඉදිකිරීමට පුරෝගාමී විය. මිය යන විට ඒ මහතා සණස සමිතියේ උපදේශකයකු ලෙස සේවය කළේය. 2000 වසරේදී විදුහල්පති ධූරයෙන් ඉසිඹු ලැබූ ඒ මහතා තම සැඳෑ සමය සතුටින් ගතකිරීමට විවිධ සමිති සමාගම්වලට සම්බන්ධ වෙමින් තමන් ගුරු පුහුණුව ලැබූ සොහොයුරු පිරිස එක්රැස් කිරීමට උදව් කරමින් 66/67 බෝලවලාන ගුරු එකතුව නමින් සමිතියක් පිහිටුවා ගැනීමට දායක විය.

පහළ කඳවල ග්‍රාමසේවා වසමේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය පිහිටුවීමට පුරෝගාමි වූ අතර, එහි සභාපති ධූරය මේ දක්වාම දැරීය. එහි වැඩිහිටි සාමාජික සාමාජිකාවන්ගේ තොරතුරු හා නිර්මාණ ඇතුළත් 'ගිමන නිවන සැඳෑ සමය' නමැති සමරු කලාපයක්ද එළිදැක්වීය.

තවද, ඒ මහතා ලේඛන කලාවට දැක්වූයේ ඉමහත් ඇල්මකි. ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතට හා අනිකුත් සිංහල පුවත්පත් වලට ලිපි, කවි ආදිය රචනා කළ ඒ මහතා 'හදමු දරුවන් යොමා නැණ නුවන්' හා 'මළගිය ඇත්තෝ' සහ 'රත්නාවලී විචාරය' නමැති වටිනා ග්‍රන්ථ දෙක ද රචනා කොට එළිදක්වා ඇත.

මිය යාමට ස්වල්ප කාලයකට පෙර 'ආදරණීය දුවේ පුතේ' යන තුන්වන නිර්මාණයත් මුද්‍රණද්වාරයෙන් එළිදැක්වීමට සියලු කටයුතු සූදානම් කර තිබිණි. ඊට අමතරව ළමා පරපුර වෙනුවෙන් සිය නිර්මාණ දායකත්වය ලබාදෙනු වස් 'සවනට සුන්දර ළමා කතන්දර' හා 'දැනුමයි වාසනාවයි' නම් පොත් දෙකක්ද සකස් කරමින් සිටි බව සැල විය. කෙසේ වූවත්, සැලසුම් සියල්ල නිමාවට පත් කරමින් දෙවි පියාණන්ගේ අභිමතය පරිදි ඒ මහතා සග සැපත දිනා ගන්නා ලදී.

ප්‍රදීප ලේඛකයකු වු ඒ මහතා සගසුව දිනීම වෙනුවෙන් ඥානාර්ථ ප්‍රදීපයේ ශෝකය පළකරමු. පෞද්ගලික ජීවන තොරතුරු සපයාදුන් අනෝමා ඉඳුරුව හා කුමාරි ඉඳුරුව යන දියණියන්ට ස්තූති කරමි.

**වික්ටර් දෙහිපිටි ආරච්චි**

ෆිලීෂන් අබයකෝන්ගේ
## සුබස 233

### ගස්කොළන් කුසුමන්

කර්මවිභක්ති බහුවචනය 'න්' ප්‍රත්‍යයත් ගනියි. නරන්, දනන්, ගජන්, ලියන් 'න්' ප්‍රත්‍යය ගත්තද ඒවා තුළ 'අන්' ප්‍රත්‍යය සන්ධිගතැයි කෙනකු තර්ක කිරීමට පිළිවන. සීගිරි ගීවලත් පියුම් සඳහා පියමන් දැකගත හැකිය. කව්සිළුමිණේ ඇසිපියන්, නාකැළන්, බිඟුවැළන්, නිලුපුලන්, පියොවුරන්, පියුමන් අතර පියොවුරු, නිලුපුල්, පියුම් දිස්වේ. ගුත්තිලයේ තැනක 'පුද කුසුම් සුවඳටය, තව තැනක පිපි සමන් කුසුමන් පටින්ය. සචේතන වස්තුවලට උරුමවූ ප්‍රත්‍යය මෙසේ ගැනුණ් බොහෝවිට විරිත රැකුමටය. එහෙත් දහම්සොඬකවට සංස්කරණයක් කළ පණ්ඩිත වැලිවිටියේ සෝරත හිමියෝ එහි පෙරුමන් වදන ගැන මෙසේ කියති. නපුංසක ලිංගික හෙයින් පෙරුම්'යි සිටියවූවත් විශේෂ විධි හෙයින් 'පෙරුමන්' යි සිටී. උපුලන්, කුසුමන් යනාදිය මෙනි.

ඇඳන්, කඳන්, කොටන්, ගස්කොළන් කටවහරේ නොනැසී පවතී. කොටන් සඳහා කොටද බහු වචනයි. ගහ කොළ ගහක් කොළක් යුගල පදවල කොළ ඒකවචනයි. හංස සඳෙසේ 'මුදු දලු නිල් කොළින්' (කොළවලින්) කියද්දී කොළ බහුවචනයි.

පැතුමන්, හැඟුමන්, රැගුමන්, සුසුමන් ආදි වැරදි වහර සලකද්දී, උම්, ඊම්, ඉලි, මන් මිස උමන් යයි ක්‍රියා නාම ප්‍රත්‍යයක් නැත. සොල්මන් (සෙලවීම) කියමන් ආදියේ බහු වචනය රුවන්, යහන්, සටන් මෙනි. පසු පසු වෙද්දී කැවුම, තැල්ම, බැඳුම ආදියට කුමක් වේවිද?

සිහිනයන්, දත්තයන්, කෘතීන්, පූජාවන්, කැමරාවන් ලෙස හිතු හිතු තැන මේ බහුවචන යොදන්නෝ ඒවා අයිති අප්‍රාණවාචී වචන ප්‍රාණවාචී බහු වචන ගැනීමේ විශේෂ විධියට බව නොදනිති. පැතුමෝ, සිහිනයෝ, කෘතීහු, පූජාවෝ ආදිය මේ අනුක්ත බහුවචනවල උක්තය බව ඔවුනට නොවැටහේ. ඔවුහු ප්‍රවණතාවන්ට 'ය' අකුරකුත් යොදා තවත් වරදති. ප්‍රාකශයන්වල කියද්දී අචේතන පදයකට සචේතන බහුවචක ප්‍රත්‍යයක් යොදා නැවත අචේතන බහුවචන ප්‍රත්‍යයක් යෙදේ. එහෙත් නිවැරදි කෙටිමඟ ගන්නෝ එමටය. 2012.9.30 ඉරිදා ලංකාදීප උපුටන දෙකක් මෙන්න. ඒවායේ තත්ත්වයන් විවේචනයන්, විචාරයන් නැත.

1. ජා.ඉ. බැංකුව සම්බන්ධයෙන් පාරිභෝගිකයන් අතර මතුවූ ව්‍යාකූල තත්ත්ව

2. ඒත් මේ පොතපත ගැන වගකියන සාහිත්‍ය මණ්ඩලවල කවුරුත් විවේචන, විචාර පළකරන බවක් පෙනෙන්නේ නෑ.

## 'ජාතීන්ගේ විනිශ්චය'

**කර්තෘ - ඒ. ඩී. එස්. විජේතුංග**
**මිළ - රු. 210/=**

ඉදිරි වසර කීපය තුළ ලොවට සිදුවන්නේ කුමක් ද? මෙහි ක්‍රිස්තු ශුභාරංචිය කුමක් ද? තහනම් ගහ යනු කුමක්ද? මනුෂ්‍යයාට පාපයට වැටීමට දෙවිඳුන් ඉඩ හැරියේ මන්ද? මිනිසාට ආගමක් අවශ්‍යය ද? ආගම් කීපයක් පවතින්නේ කෙසේද? තම ජීවිතය පූජා නොකර මිනිසාට ගැලවීම ලබාදීමට දෙවිඳුන්ට නොහැකි වීද? දෙවියන්ට ලෙඩ සුව කළ හැකි නම් ප්‍රතිකාර ගැනීම අවශ්‍යය ද? ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චය සහ සැබෑ ප්‍රඥාව කුමක් ද? ආදි මාතෘකා 40 ක් යටතේ කරුනු සාකච්ඡා කර තිබේ.

මනුෂ්‍යත්වය ඉක්මවා ගමන් කිරීම, දේව පුත්‍රභාවය ලබාගැනීම, ශුද්ධාත්ම දීමනාව, මෙලොව පවතින දේව රාජ්‍ය, සැබෑ, ප්‍රඥාව, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන වැඩසිටීම, ශුද්ධවරයන්ට ගරු කිරීම නූතන අනාවරණ, එළිදරව් කිරීම් සහ දර්ශන (Visisons) ඇතුළු විවිධ පාර්ශවයන්ගෙන් කිතු දහමට අදාලව මතුවන ප්‍රශ්න 43 කට පිළිතුරු මෙහි අන්තර්ගතව ඇත.




### ගොළුව ගිය මා

සරා සඳේ සොමි කැල්මන්
ගලා බසිනා හෝරාවේ....
සමිඳුනි ඔබ හැරී මවෙතින්
කතා කළා නොසිතු සේ.....
කතා කරන්නට බැරි මගෙ දෙතොල්
කෙසේ මුමුනන්නද මගේ සමිඳේ....
දෙනෙත් අයා මම බලා සිටියෙමි
ගලා හැලෙනා ඔබේ කඳුලේ.....
අනේ සමිඳුනි නොහඬන්
කියා කියන්නේ කෙලෙසදෝ මං......
වෙන් වී යන්නට නොහිතන්
ගොළුව ගිය මා තනිකර මෙසේ......
සතුටයි සැනසුමයි දැන්
නැගේ සමිඳුනි මගේ හදේ....
දිවිය පුරා ලඟ සිටිමින්
සැනසුමක් වෙන්න මගේ ජීවේ......

**ඈන් නිෂාරා**
පූර්ව ආධුනික සොහොයුරිය
දේව සංරක්ෂණයේ දියණියෝ
පළඟතුරය

## 'කාලයේ අවසානය සහ ක්‍රිස්තු පුනරාගමනය'

**කර්තෘ - ඒ. ඩී. එන්. විජේතුංග**
**මිළ - රු. 180/=**

ඉතාලි ජාතික මරිය වැල්ටෝර්ටා හට සමිඳාණන් වහන්සේ විසින් දෙන ලද පණිවිඩ ඇතුලත් "The End Times" කෘතිය "කාලයේ අවසානය සහ ක්‍රිස්තු පුනරාගමනය" නමින් සිංහලෙන් මුද්‍රණය කරනු ලැබ ඇත.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ බොහෝ වාරයක් දර්ශණය කිරීමටත් එතුමා දුන් පණිවිඩ, ප්‍රකාශන හා දර්ශණවල විස්තර සටහන් කර තබා ගැනීමටත් භාග්‍ය ලැබූ එතුමිය ඉතාලි ජාතික කාන්තාවකි. ඇය විසින් පිටු 16,000 ක පමණ සටහන් කර ඇති එය කියවන විට ලිවීම සහ දර්ශන ග්‍රන්ථ දහසක් ලෙස ඉතාලි බසින් මුද්‍රණය කරනු ලැබ ඇත. එම කෘතීන් අතුරින් ඉංග්‍රීසි භාෂාව ඇතුළු භාෂා ගණනාවකට පරිවර්තනය කර ඇති "The end Times as Tevealed to Mariya Valtorta" කෘතිය, පළඟතුර මීසම් සභාවේ ද, මීගමුව කතෝලික ශාසන ආරක්‍ෂක බල මණ්ඩලයේ සුබ සාධන කමිටුවේ ද ලේකම්, මීගමුව මරුද මඩු මංගල්‍ය කමිටුවේ ක්‍රියාකාරි සමාජික සාම විනිසුරු සුනිල් විජේතුංග මහතා විසින් සිංහලට පරිවර්තනය කරනු ලැබ ඇත.



# ආගම තහනම් වුවත් නිරන්තර රහස් යැදුමේ යෙදුනා

ඇල්බේනියාවේ ටිරානා නගරයේ කවජා නම් වීථියේ ඇති ශ්‍රී හෘදයේ කුඩා දෙව් මැඳුර තුළින් සැමදා සන්ධ්‍යා කාලයේ ඕගනයකින් නික්මෙන ගීතිකා වාදනය හදවත් දෙවිඳුන් වෙත ඔසවනු ලබයි. එම ඕගන් වයන්නිය 70 හැවිරිදි දිමිත්‍රි නම් වැඩිහිටි වැන්දඹු මවකි. පසුගිය සතියේ ඇ එම කුඩා දෙව් මැඳුර තුළ සුපුරුදු ලෙසින් දෙව් මහිමය වයද්දී, කතෝලික පුවත් ඇ මුණ ගැසුණේය. ඇ පවසා සිටියේ ඇදහිලි යාච්ඤාවේ මහරු කථාවකි.

"වර්ෂ 1999 පමණ කාලයක සිට මම මෙලෙස සන්ධ්‍යා සමයේ දෙව් මැඳුර තුළ ඕගනය වාදනය කරනවා. වර්ෂ 1967 ට ඉහතදී පවා කුඩා ගීතිකා කණ්ඩායමක් සමග මෙම දෙව් මැඳුරේම ගීතිකා වැයුමෙන් හා ගැයුමෙන් දෙවිඳුන් නැමදීම කළා. එනමුත් ඇල්බේනියාව කොමියුනිස්ට් පාලනයට ගැනුනායින් පසුව දෙව් මැඳුරේ කැරුණු මගේ වාදනය ද සම්පූර්ණයෙන් නැවතුනා. මන්දයත් කොමියුනිස්ට් පාලනය විසින් ආගම් ඇදහීම තහනම් කැරුණු ලැබීම නිසාය. තවද කොමියුනිස්ට් රජය විසින්, වර්ෂ 1967 දී ඇල්බේනියාව ව්‍යවස්ථානුකූලව අදේව දෘෂ්ටික රාජ්‍යයක් ලෙස ප්‍රකාශ කරනු ලැබීමෙන් ආගමිකයන් වෙත එල්ල වූ පීඩනයන් අති මහත් වූවා.

සියලු පූජක හා පැවිදි පිරිස් පිටුපස හඹා ගොස් ඔවුන් සිරභාරයට ගෙන පසුව මරා දමනු ලැබුවා. බොහෝ කිතුනුවන්ගේ ඉරණමද එසේ වූවා. කාලයත් සමග බොහෝ කිතුනුවන් සිය පෞද්ගලික යැදුම තුළින් දෙවිඳුන් හමුවීමේ මාර්ගය තුළ පියවර තැබුවා. තවද ඇතැම් දෙව් මැඳුරු ක්‍රීඩා ශාලා බවට පත් කරනු ලැබුවා. අප අයත් වූ ශ්‍රී හෘදයේ දෙව් මැඳුර ද ක්‍රීඩා ශාලාවක් කැරුණා. කුඩා කණ්ඩායම් සැදි හෝ තනි තනිව හෝ යැදුමේ යෙදෙන්නේදැයි සොයා බැලීමට ඔත්තු කාරයන් යොදවා තිබුණා. පවුලේ කවරෙකු හෝ යම් ආකාරයක ඇදහිල්ලේ නිරතව සිටියේ නම් මුළු පවුලම විනාශ කරනු ලැබුවා. එහෙත් කිතුනුවන් තනි තනිව හා පවුල් වශයෙන් යැදුමේ යෙදීම නම් මරණය හමුවේ වුවද බලධාරීන්ට වැළැකිය නොහැකි බවට අදටත් සාක්ෂි එමටයි.

"මා හැමදා යැදුමේ නිරත වූවා. මගේ කුඩා පුතා හා දියණිය මා හා යැදුමට එක්වූවා. දෙවිඳුන් යැදුම තහනම් බව දරු දෙදෙනා දැන සිටියත් ඉන් ඉවත්වීමට ඔවුන් කිසිදා උත්සහ කළේ නැහැ. මගේ ස්වාමි පුරුෂයා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක්ව සිටියත් පක්ෂයේ ක්‍රියාදාමය ගැන ඔහු කළකිරි සිටියා. මා දරුවන් සමග යාච්ඤා කිරීම නවතා ලන්නැයි ඔහු කිසිදා මට පවසා නැහැ. වෙනත් කතෝලික පවුල් ද රහසේ යැදුමේ යෙදුනා. එහෙත් අප සැමට හමුවී යාච්ඤා කරන්නටනම් අවස්ථාව ලැබුණේ නැහැ. එනමුත් අප නිහඬ යැදුමෙන් අප එකිනෙකා බැඳී සිටි බැව් අපේ අත්දැකීම වූවා. අප නත්තල් හා පාස්කුව සැමරුවේ කේක් ගෙඩියක් මිලයට ගෙන ඒ වටා නිහඬ යැදුමේ යෙදී අනුභව කිරීමෙනි.

වර්ෂ 1967 සිට 1990 දක්වා පැවැති කොමියුනිස්ට් පාලනය බිඳවැටීමෙන් පසුව ඇල්බේනියාවේ කතෝලික ඇදහිල්ල යළි පුබුදු වූවා. පැවැති සියළු බාධක හිරිහැර මැද යාච්ඤාවේ බලයෙන් ඉදිරියට ගිය ඇදැහිල්ලේ ජනතාවක් වශයෙන් අපි අද දෙවිඳුන් පසසන්නෙමු. මා අදත් දෙව් මැඳුරේ ඕගනය වයන්නේ ද ඇදැහිල්ලේ බලය ප්‍රකාශ කරන්නයි.

## සසුනිසුරාණෝ මුඩුක්කු සිරගෙවල් ඒඩ්ස් කඳවුරු කරා යන්නට සැරසෙති

ප්‍රැන්සිස් සසුනිසුරාණන් බ්‍රසීලයේ රියෝ ද ජනෙයිරෝ හී, ජූලි මස 22 සිට 29 දක්වා පැවැත්වෙන ලෝක තාරුණ්‍ය දිනට සහභාගි වනු ඇත. එම ගමනේදී දිළිඳුන් ද, සිරකරුවන් ද, රෝගීන් ද හමුවී සිය පීතෘක සෙනෙහස ලබා දීමට එතුමෝ බලාපොරොත්තුවෙන් සිටිති.

එතුමා විසින් දැනටමත් ප්‍රකාශ කොට ඇති දිළිඳුන්ගේ සභාව යන සංකල්පය හා අදාළ ගමන අනුගත වන බැව් ද මාධ්‍යයන් විසින් ප්‍රකාශ කොට ඇත. රියෝ ද ජනෙයිරෝ හී ඇත්තාවූ කලාපය පුරා ප්‍රසිද්ධ මැන්ගුඩින්ම්ස් නම් මුඩුක්කු නගරයක් ඇත. තෙල් පිරිපහදුවක සේවය කරනා දිළිඳු ජන කොටසක් ද එහි ජීවත් වෙති.

දුප්පත්කම හා ආනුසංගික මත්ද්‍රව්‍යය ජාවාරම් ද එම මුඩුක්කු නගරය පුරා පවතී. සුදොතුම් පියා එම මුඩුක්කු නගරයේ ජනයා හා සෑහෙන කල් වේලාවක් ගත කරනු ඇතැයි ද අපේක්ෂා කැරේ. තවද සිරගෙවල් වලැ දිගුකල් දඬුවම් විඳිනා තරුණ තරුණියන් පිරිසක් සුදොතුම් පියා නැවතී සිටිනා රදගුරු නිවසැ වෙත ගෙනෙනු ඇත.

එතුමා ඔවුන් හා සුහදව කතාබහ කරමින් ජීවිතය පිළිබඳ බලාපොරොත්තු උපදවීමේ මෙහෙවරක් යෙදෙනු ඇතැයි ද වාර්තා වේ. එමෙන්මැ ඒඩ්ස් රෝගීන් ගෙන් පිරුණු විසල් ආරෝග්‍ය ශාලාවකට ද එතුමා පා නගනු ඇත. දෙවිඳුන් කෙරෙහි ඇදැහිල්ල තුළින් ඉදිරි ජීවිත බලාපොරොත්තු වෙත ලඟා විය හැකි යයි එතුමා පීතෘක සෙනෙහසින් ඔවුන් දිරි ගන්වනු ඇත.

දැස් හමුවේ දක්නා මිනිස් වේදනාවන් සඳහා කෙසේ ප්‍රතිකර්ම ලබාදිය හැකිදැයි එතුමා, දේශපාලන බලධාරීන් හා ආර්ථික විශේෂඥයන් සමග කතිකාවක යෙදීමට නියමිත වේ. ලෝකයේ වැඩිම කතෝලිකයන් සංඛ්‍යාවක් ජීවත්වන දේශය වන බ්‍රසීලයේ අධ්‍යාත්මික හා භෞතික වශයෙන් වේදනා විඳින එම ජනතාවන් සඳහා ප්‍රත්‍යක්ෂ ප්‍රතිකාරයන් ගෙන ඒමට යෝජනා ඉදිරිපත් කරනු ඇතැයි ද අපේක්ෂිතයි.

මේ අනුව ලෝක තාරුණ්‍ය දිනයේදී තරුණ තරුණියන් වෙත ගැලවුම් මාර්ගයන් පසක් කර දෙනු ලබන අතර දුක්වේදනා හා පීඩනයන්ට ලක්ව සිටිනා ජනතාවන්ට මිදීමේ මෙහෙවරක් උදා කරවීමට ද එතුමා විසින් ක්‍රියා කරනා බවට දැනටමත් අපේක්ෂාවන් දල්වනු ලැබ ඇතැයි ද කතෝලික පුවත් විසින් වාර්තා කරැත.

## නව දෙව් මැඳුර අභිෂේකයේදී බෝම්බයක් පුපුරයි

ටැන්ෂානියාවේ නැගෙනහිර ප්‍රදේශයේ වලාසිති නගරයේ අලුතින් තනනු ලැබූ කතෝලික දෙව් මැඳුර අභිෂේක කිරීමේ මෙහෙය පැවැතියේ මැයි මස 08 වෙනිදාය. එම උලෙළට ටැන්ෂානියාවේ අපෝස්තලික තානාපති ප්‍රැන්සිස්කෝ පදිල්ලා අගරදගුරු හිමිපාණෝද ප්‍රදේශයේ ලෙබුළු ජොසාපාට් රදගුරු තුමා ද සහභාගි වූහ. දේව මෙහෙය අතර තුරේදී බෝම්බයක් පුපුරුවනු ලැබීමෙන් එක් වනිතාවක් මරණයට පත්ව තවත් 40 ක් පමණ දෙනා දරුණු තුවාල ලදහ. දිව්‍ය යාගය පවත්වමින් සිටි රදගුරු හිමිවරුන්ට ශාරීරික හානි කිසිවක් සිදුවී නොමැත.

මෑතදී ටැන්ෂානියාවේ ඉස්ලාම් ත්‍රස්තවාදීන් හා කිතුනුවන් අතර විරෝධතාවයන් වර්ධනය වෙමින් පවතී. මේ වසරේ පෙබරවාරි මාසයේදී පූජක වරයෙක් ද ඝාතනය කරනු ලැබීය. තවද එරටේ ඇතැම් ප්‍රදේශයන් හී පවත්නා දෙව් මැඳුරු කීපයකට ද ත්‍රස්ත කණ්ඩායම් විසින් පහරදී තිබිණි. කතෝලික පිරිමි දරුවකු විසින් කුරාන් ග්‍රන්ථයේ පිටපතකට මුත්‍රා කොට ඇතැයි යන චෝදනාව මත මෙම ගැටුම් උග්‍ර වී ඇතැයි ද වාර්තා වේ. එලෙස විරෝධතාවයන් වර්ධනය වීමත් සමග කිතුනුවන් 200 කට වඩා වැඩි පිරිසක් එක් මුස්ලිම් පල්ලියක් ගිනි තබා විනාශ කිරීමට යත්න දරා ඇති නමුත් එය පොලීසිය විසින් වළකනු ලැබ ඇත.

"කළකෝලහාල කිරීමෙන් විනාශයක් මිස සාමයක් නම් කිසිදා උදා වෙන්නේ නැහැ. එබැවින් ක්ෂමාවේ හා සමාදානයේ ක්‍රියාදාමයක් මගින් ආගමික සංහිඳියාව ඇතිකර ගත යුතු බැව් සියලු පාර්ශවයන් විසින් අවබෝධ කරගත යුතු වෙනවා." ටැන්ෂානියාවේ අපෝස්තලික තානාපති අති උතුම් ප්‍රැන්සිස්කෝ පදිල්ලා අගරදගුරු හිමි පැවසීය. ටැන්ෂානියාවේ ජනගහණය මිලියන 47 පමණ වේ. එම ජනගහනයෙන් 30% ක් කතෝලිකයෝ වෙති; 35% ක් ඉස්ලාම් බැතිමත්තු වෙති; ඉතිරි කොටස් විවිධ ආගම් වලට අයත් වෙති.

## කොලොම්බියාවේ තවත් පූජක වරයෙක් මරා දැමේ

කොලොම්බියාවේ බරන්කුයිලා නම් අගරදගුරු වසමේ ක්‍රිස්තු රජාණන්ගේ දෙව් මැඳුරේ සේවයේ නිරතව සිටි 48 හැවිරිදි බෙසෝනා ඩෙල් නම් පියතුමා, ත්‍රස්ත කල්ලියක් විසින්, අප්‍රේල් මස 18 වෙනිදා පැහැරගෙන ගොස් දරුණු වද දී මරා දමා තිබිණි. ඔහුගේ සිරුරේ කැපුම් කෙටුම් 18 ක් තිබූ බැව් කතෝලික පුවත් වාර්තා කරයි. මෙම පූජක තුමාගේ මරණය සම්බන්ධයෙන් කොලොම්බියාවේ අගරදගුරු මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ එක් ත්‍රස්ත කල්ලියක් විසින් පියතුමා මරා දමා ඇති බවයි. සිදුවන මෙවන් සාපරාධයන් හමුවේ කිතුනු ජනතාව ඉමහත් සංතාපයටත් වේදනාවටත් පත්ව ඇතැයි ද වාර්තා වේ.




මේ වසරේ පසුගිය මාස තුන ඇතුළතදී කොලොම්බියාවේ පූජකවරු සතර දෙනෙක් දැනටමත් මර මුවට පාත්‍ර කොට ඇත; තවද 2012 වර්ෂයේදී එක් පූජකවරයෙක් ද, 2011 වර්ෂයේදී පූජකවරුන් 05 දෙනෙක් හා එක් ගිහි කතෝලිකයෙක් ද, 2010 වර්ෂයේදී පූජකවරුන් 03 දෙනෙක් ද, 2009 වර්ෂයේදී පූජකවරුන් 05 ක් ද එක් ගිහියෙක් ද වශයෙන් ඝාතනය කරනු ලැබ ඇති බැව් වාර්තා වේ. පවත්නා මෙම තත්ත්වය යටතේ වුව ද ඇදැහිල්ලේ සවිය තුළ කතෝලිකයෝ සමිඳාණන් තුළ නොසැළී රැඳී සිටිති.

## රුසියානු ඔතොඩොක්ස් සභා නායක, සසුනිසුරාණන් හා කිතුනු ඒකත්වයට

කතෝලික සභාව හා රුසියානු ඔතොඩොක්ස් සභාව අතර පවත්නා සම්බන්ධතාවයන් තව තවත් වර්ධනය කර ගැන්මේ අරමුණින් ප්‍රැන්සිස් සසුනිසුරාණන් හමුවීමට තමා බලාපොරොත්තුවෙන් සිටිනා බැව් රුසියානු ඔතොඩොක්ස් සභා පාලක කිරිල් උතුමාණන් විසින් කිතුනු මාධ්‍ය වෙත ප්‍රකාශ කොට තිබේ. එබඳු කඩිනම් සම්බන්ධතාවයක් වඩවාලීම සඳහා ද්විපාර්ශික සාකච්ඡා වෙත ප්‍රැන්සිස් සසුනිසුරාණන් එක සිතින් කැමැත්ත දක්වනු ඇතැයි ද තමා විශ්වාස කරනා බැව් පවසා තිබේ.

කිතුනු ඒකත්ව සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා ඉසිඹුලත් XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියා මහත් උනන්දුවක් දැක් වූ බැව් ද එතුමා විසින් දක්වනු ලැබීය. යුරෝපා දේශයන් ලෞකීකකරණයෙන් වෙළී සිටිනා හෙයින් ඊට අධ්‍යාත්මික විසඳුම් ලබාදීම සඳහා රුසියානු ඔතොඩොක්ස් හා කතෝලික සභාවන් විසින් අතිශය ඵලදායි මෙහෙවරක් කළ හැකි බැව් ද එතුමාගේ අදහස වේ. එම දැකුම උලුප්පාලමින් ඔතොඩොක්ස් සභා නායක කිරිල් හිමිපාණන් මෙලෙසින් ද පවසයි. 'යුරෝපීය හා අනෙක් රාජ්‍යයන් හී පවත්නා අධාර්මික පැවැත්ම යළි නගා සිටුවීම සඳහා සියලු කිතුනු සභාවන් ඒකත්වයට පැමිනිය යුතුයි. ලෞකීක කරණය තුළ ලෝ දනා ප්‍රගතියට නොව අගතිය කරා දිව යන බැව් ඇදැහිල්ලේ ආලෝකයෙන් පසක් කර දිය හැක්කේ කිතුනු සභාවන්ට පමණි. එම කාර්යයේදී සියලු කිතුනු සභාවන්ට එකතු වීම සඳහා කෙරෙන ආරාධනය කළ යුත්තේ සභා එකමුතුව තුළින් පමණක් හෙයින් විශේෂයෙන් රුසියානු ඔතොඩොක්ස් සභාව හා කතෝලික සභාව එකමුතු වීමෙන් එම කාර්ය ඵලදායි අන්දමින් ඉදිරියට ගෙනයනු ලැබිය හැක. සමලිංගික විවාහය හෙළා දකිමින් ප්‍රංශ ජනතාව විසින් දැක්වූ විරෝධතාවයන්ට කිතුනු සභාවේ දායකත්වය අති ඵළදායි වී ඇත. මේ අනුව අධ්‍යාත්මිකත්වයෙන් තොර නූතන ලෝකය විනාශය කරා ඉක්මන් ගමන් යන බැව් අවධාරණය කෙරුමේ ක්‍රියාවලිය කතෝලික හා ඔතොඩොක්ස් සභාව විසින් දියත් කිරීමේ කතිකාවත් අප දෙපාර්ශවය විසින් නොපමාව ආරම්භ කරනු ලැබිය හැක."

## ශුද්ධෝත්තම පියතුමන්ගේ සාම පණිවුඩය උතුරු කොරියාවටත්

කොරියානු අර්ධද්වීපය යු තර්ජන හා ගර්ජන මැද වර්තමානයේදී උණුසුම්ව පවතී. එහෙත් දඅති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ සාම පණිවුඩය රැගෙන උතුරු කොරියාවට ගිය කතෝලික කණ්ඩායම, උතුරු කොරියානු බලධාරින් විසින් මිත්‍රශීලීව පිළිගෙන තිබේ. 'ඉයුජින් බෙල් පවුන්ඩේෂන්'නම් සංවිධානයේ සමාජිකයන් 20 දෙනෙක් උතුරු කොරියානු සාම ගමනට සහභාගි වූහ.

සාමගමනට පූජකවරු සතර දෙනෙක් ද එම කණ්ඩායමට අයත් වූහ. 'අපේ කණ්ඩායම වසර ගණනාවක සිට සාමයේ දූතයන් ලෙසින් උතුරු කොරියාවට යැමට පුරුදුව සිටිනා අතර එරටේ ජනතාව අතර විශේෂයෙන් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ සාමයේ ආලෝකය පෙරදැරි කොටගත් ගමනක් ලෙසින් මේ වාරේදී අප අපේ උතුරු කොරියානු සහෝදර සහෝදරයින් මුණ ගැසුණා.' එලෙසින් පවසනු ලැබුවේ එම දූත කණ්ඩායමේ නායක ජෙරාඩ් හැම්මොන්ඩ් පියතුමාය.



මෙම සාමයේ දූත පිරිස සිය දූත මෙහෙවරේදී වැඩියෙන් හමුවන්නේ ඈත ප්‍රදේශයන් හී ජීවත් වන සාමාන්‍ය දිළිඳු ජනතාවන්ය. ජාත්‍යන්තර මාධ්‍යයන් ඔස්සේ ප්‍රකාශිත සංඛ්‍යා ලේඛණ අනුව උතුරු කොරියාවේ මිලියන 22 ක ජනතාවගෙන් අඩකට ආසන්න පිරිසක් දිළිඳු බවින් පෙළෙනා බවයි. එම දිළිඳු ජනතාවන් අතර ක්ෂය රෝගීන් බෙහෙවින් පැතිර සිටිනා බැව් ද වාර්තා වේ. ඒ නිසාවෙන් මෙම සාම කණ්ඩායමේ පිරිස ක්ෂය රෝග බෙහෙත් වර්ග ද අවැසි අයට ලබාදීමට කටයුතු ද සළසා ඇත. තවද දරුවන් ආශා කරනා බොහෝ දෑ බෙදා හැරීම සඳහා ක්‍රම වේදයක් සළසා දී ඇත. එලෙස හැකි අයුරින් සහෝදරත්ව ක්‍රියාවෙන් ද ප්‍රකාශ කෙරුමෙන් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ සාම පණිවුඩය ද උතුරු කොරියානු දිළිඳු ජනතාවන් වෙත ප්‍රකාශ කෙරෙනා බැව් ද වාර්තා වේ.

බැසිල් ෆොන්සේකා විසිනි

මතවාද

# කුමක්ද මේ විගඩම ?

මෑත දිනකදී මා විදේශීය රටක වසන්නෙකු හට පාර්සලයක් යැවීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ මරදානේ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි විදේශීය පාර්සල් අංශයට ගියෙමි. මා එහි සිටින විට අප කතෝලික ගරු පියතුමන් අඳිනු ලබන පැවිදි ඇඳුමෙන් (සුදු ලෝගුව හා කළු පළල් බඳ පටිය) සැරසුන අයෙකු එහි පැමිණියේ ය.

පෙනුමෙන් කතෝලික පියතුමකු මෙන් පෙනුන නිසා මා එතුමාට හිස නමා ආචාර කර ඉදිරියට ඒමට ඉඩ දී පස්සට වීමි. ඊට ටික වේලාවකට පසු දිගු කලිසමකින් හා ඇමති ආරක්ෂක අංශයේ නිලධාරින් අඳිනු ලබන කමිසයට සමාන කමිසයකින් සැරසුන අයෙකු ද එහි පැමිණියේ ය. කලින් පැමිණි පූජකතුමාව දුටු ඔහු ඉදිරියට පැමිණ තමා “Father ....” යනුවෙන් තමන්ව හඳුන්වා දුන් අතර අනිකා ද තමන් “Father ....” යනුවෙන් තමන්ව හඳුන්වා දුනි.

මොවුන් දෙදෙනා ටික වේලාවක් කතා කරමින් සිටින විට පළමුව පැමිණි අය විදේශ රටක වෙසෙන තම දුවට පාර්සලයක් යැවීමට ආ බව පැවසූ අතර පසුව පැමිණි අය ද විදේශ රටක වෙසෙන තම පුතුට පාර්සලයක් යැවීමට ආ බව දැන්විය. (දෙදෙනාම එම රටවල් සඳහන් කළහ.) අප කතෝලික පියතුමන් මෙන් "Father ...." යනුවෙන් තමන්ව හඳුන්වා දුන් මෙම දෙදෙනාට දරුවන් කෙසේදැයි මම අන්දුන්කුන්දුන් වීමි.

එපමණක් නොව පළමුව පැමිණි අය ඇඳගෙන සිටියේ ද කතෝලික ගරු පියතුමකු ලෙසිනි. මොවුන්ගේ මෙම කතාව ඇසුන එහි සිටි සමහර නිලධාරින්ද පුදුමයෙන් මෙන් බලනු මා දිටිමි.

"Father ...." යනුවෙන් හඳුන්වනු ලබන්නේ කතෝලික පියතුමන් බව කවුරුත් දන්නා අතර ඔවුන් මෙසේ තම දරුවන් ගැන පැවසීම විශාල පුදුමයකට හේතුවක් විය. තවද කතෝලික පැවිදි ඇඳුමෙන් සැරසුනු අයෙකු මෙලෙස තම දරුවන් ගැන ප්‍රසිද්ධියේ පැවැසීම අකතෝලිකයන් අතර පමණක් නොව කතෝලිකයන් අතරද ඇති කරනුයේ අප පැවිදි පියවරුන් කෙරෙහි සැකයකි.

මොවුන්ගේ කථාවට සවන් දී සිටි මට පසුව වැටහී ගියේ පැවිදි ඇඳුමෙන් (කතෝලික) සැරසී සිටි අය ඇංග්ලිකාන පූජකයෙකු වූ අතර අනිකා වත්තල ප්‍රදේශයේ මූලධර්මවාදී පල්ලියක් යැයි කියනු ලබන ස්ථානයක පාස්ටර්වරයකු බවය.

මොවුන් මෙලෙස තමන්ට හිමි ඇඳුමින් හා පැවදි නාමයෙන් පෙනී නොසිට කතෝලික ගරු පියවරුන් හඳුන්වනු ලබන නාමයෙන් හා ඇඳුමින් ද පෙනී සිටිනුයේ යම් විශේෂ සැළකිල්ලක් බලාපොරොත්තුවෙන් විය හැකිය.

එම නිසා අති උතුම් කාදිනල් හිමිපාණන් ඇතුළු අනිකුත් කතෝලික නායකයන් ආගමික කටයුතු පිළිබඳව අමාත්‍යංශය හා සම්බන්ධ වී කතෝලික පියතුමන් අඳිනු ලබන පැවිදි ඇඳුමින් සැරසීම හා එතුමන්ව අමතනු ලබන "Father ...." යන නාමය අකතෝලික පැවිද්දන් පරිහරණය කිරීම වැළැක්වීමට යම් පියවරක් නොගතහොත් අප ගරු පියතුමන් පමණක් නොව ගිහි කතෝලිකයන් ද වැඩිකල් යාමට පෙර දරුණු අපහසුතාවයනට පත්වනු නොඅනුමානයි.

✍ මෙරිල් පෙරේරා
නායකකන්ද

# මීසම් ධර්ම සේවා සභාව වෙනස් විය යුත්තේය

**සාමාන්‍යයෙන් මීසමක් හෝ දේවස්ථානයක් හෝ භාරව කටයුතු කරන මීසම් සේවක ගරු පියතුමාගේ ධුර කාලය බොහෝ විට වසර පහකට සීමා වන්නේ ය. සභා මූලිකයන්ගේ තීරණය අනුව මෙම කාලය යම් ප්‍රමාණයකට අඩු වැඩි වුවත් පොදුවේ වසර පහක කාල සීමාව රීතියක් බවට ගොඩනැගෙමින් තිබීම දැකගත හැක්කේය. මෙම තත්ත්වය ඉතාම හොඳ තත්ත්වයකි. මන්ද ගරු පියතුමා නව දේවස්ථානයකට ගොස් නව ජනතාවක් සමඟ සේවය කළ යුත්තේය. එවිට ගරු පියතුමාගේත් ජනතාවගේත් දෙපාර්ශ්වයේම ගෞරවය හා භක්තිය ආරක්ෂා වීම සිදුවන්නේ ය.**

නමුත් ගැටලුව මතුවනුයේ මීසමක හෝ දේවස්ථානයක හෝ පවතින ඉතාම ඉහළම සමිතිය වන මීසම් ධර්ම සේවා සභාව පිළිබඳවය. කොට්ඨාශ මූලිකයන්ගෙන්, සමිති සමාගම්වල නිලධාරින්ගෙන් සහ ගරු පියතුමා විසින් විශේෂයෙන් පත් කළ නියෝජිතයන්ගෙන් සැදුම් ලත් මීසම් ධර්ම සේවා සභාව මීසමේ ඕනෑම කටයුත්තක දී අවසාන තීරකයා බවට පත් වන්නේ ය. කුමන සමිතියක් හෝ පුද්ගලයෙක් දේවස්ථානයට අදාළ කිනම් කටයුත්තක නියැලුනත් ඒ සඳහා අවසරය මීසම් ධර්ම සේවා සභාව මඟින් ලබාගත යුතුය. එතරම් ප්‍රබල හා නිෂේධ බලයක් හිමි මීසම් ධර්ම සේවා සභාවට අද බොහෝ විට අත් වී තිබෙනුයේ ශෝක ජනක තත්ත්වයකි.

බොහෝ විට මීසම්වල මීසම් ධර්ම සේවා සභාව යනු දෙපිරිසක් සිටින එසේත් නැතිනම් ගරු පියතුමාට පක්ෂ හා විපක්ෂ යනුවෙන් කණ්ඩායම් දෙකක් ප්‍රායෝගිකව දැකිය හැකි සමිතියකි. සමහර මීසම් ධර්ම සේවා සභාවන් තුළ කෙරෙනුයේ අදහස් උදහස් ප්‍රකාශ කිරීමකට වඩා පෞද්ගලික තරහමරහ නොහොඳ නෝක්කඩු පිරිමසා ගැනීමය. අනෙක් අතට සමහර කොට්ඨාශ මූලිකයන් අවුරුදු දහය පහළොව ධුරය අත්හරින්නට කැමති නැත. පියතුමා පත් කළා යනුවෙන් සඳහන් කරමින් ගරු පියතුමන් තුන් සතර දෙනෙකු මාරුවීම් ලබන තෙක්ම සිටින අය ද නැතිවා නොවේ. ඒ අතර මීසම් ධර්ම සේවා සභාවේ ලේකම් වුවද අවුරුදු 20 - 25 හෝ වෙනත් කෙනෙකුට සිය තනතුර භාර නොදෙමින් සිටින මීසම් ද ඕනෑ තරම්ය.

අම්මා, තාත්තා, දුව, පුතා, යන සතර දෙනාම මීසම් සභා නියෝජිතයන් ලෙසින් තේරී පත්වී සිටින අවස්ථා ද, පොදු ස්ථානයක් බවට පත් කිරීම වෙනුවට මීසම් ධර්ම සේවා සභාව පෞද්ගලික ස්ථානයක් බවට පත් කර ගන්නට උත්සාහ ගන්නා පිරිස් ද මීසම්වල සිටීම තව තවත් කණගාටු විය යුතු තත්ත්වයකි.

සත්‍යයෙන් ම මේ තත්ත්වය වෙනස් විය යුත්තේ ය. වසර තුනකට හෝ පහකට හෝ වරක් නව මීසම් ධර්ම සේවා සභාවක් පත්විය යුත්තේ ය. ඒ සඳහා නවකයින්ටත් අවස්ථාව ලබා දී පැරණි අය ඔවුන්ට උපදෙස් දෙමින් දේව සේවාවේ යෙදෙන්නේ නම් එය ඉතාම වටිනා කටයුත්තකි.

මේ අතරම ගරු පියතුමා සමඟින් එක්ව මීසම් ජනතාවගේ ද සහයෝගය තුළ ක්‍රියාත්මක වන්නා වූ මීසම් ධර්ම සේවා සභාවන් ද දැකිය හැකිය. එයට හේතුව අත්දැකීම් ඇති පරිණත පුද්ගලයින් නවකයින්ට ද අවස්ථාව ලබාදෙමින් සුහද ලෙසින් තම යුතුකම් වටහාගත් පිරිස් එම මීසම් තුළ ජීවත් වීමය. විශේෂයෙන් ම මීසම් ධර්ම සේවා සභාවේ සංයුතිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දිය නොහැකි බව අප කවුරුත් පිළිගත යුතු සත්‍යතාවයකි. මන්ද එක් එක් මීසම්වල තත්ත්වය එකිනෙකට වෙනස් ය. නමුත් අවම වශයෙන් තම දේවස්ථානයට උචිත වන අයුරින් මීසම් ධර්ම සේවා සභාවේ සංයුතිය හා පැවැත්ම තීරණය කර ගැනීම අදාළ මීසම් ජනතාව සතු වගකීමක් වන්නේය.

✍ ජයන්ත පලිහවඩන
රාගම

# පිබිදෙව්! කිතුනුවනි පිබිදෙව්!

**විශ්වාසය යනු, විශ්වාසයයි. ශ්‍රද්ධාවයි. මෙයට වෙනත් අරුතක් දීමට හෝ උදාහරණ දීමට අපහසු බව පෙනේ. එම නිසා මෙය මිනිසා උසස් තලයකට පත් කරන අතර කතෝලික අපට ඉහළින් ලැබෙන්නක් බව අපගේ පිළිගැනීමයි. අපගේ ඉල්ලීමක් නොමැතිව අපට ලැබෙන සහ සුවිශේෂී තෝරා ගැනීමක් බව අපගේ ජීවන අත්දැකීමයි.**

මේ විශ්වාසයට අප පංගුකාරියන් වී ඇත්තේ සුවිශේෂී කැඳවීමකින් අපගේ දෙමාපියන් විසින් ඒ සඳහා අපව මෙහෙයවූ නිසා බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත. අපට අයිතිකර දුන් විශ්වාසය වර්ධනය කරගැනීම සහ තහවුරු කරගැනීම සඳහා අපගේ පාර්ශවයෙන්ද ඉටු විය යුතු කරුණු කාරණා බොහෝ ය. විශ්වාසය හා ශ්‍රද්ධාව නොමැතිව ජීවිතයට ප්‍රීතිය සහ සුරක්ෂිතභාවයක් නැත. කොපමණ වස්තුව තිබුණත් ඔහුට අභ්‍යන්තර ප්‍රීතියක් නොමැත. අභ්‍යන්තර නොසන්සුන් බැවින් ඔහු නොයෙක් රෝගාබාධයන්ට ලක් වේ. එය අද වෛද්‍ය විද්‍යාවද පිළිගන්නා සත්‍යයකි. එබැවින් විශ්වාසයට හා ශ්‍රද්ධාවට අපගේ ජීවිතයේ මුලිකම තැන දිය යුතු බව අපටම වැටහෙනු ඇත. විශ්වාසය හා ශ්‍රද්ධාව නොමැත්තා ජීවත් වන්නේ බලාපොරොත්තු කඩ වූවකු ලෙසය. ඔහුගෙන් මෙලොවටවත් එලොවටවත් සේවයක් සිදුනොවනු ඇත. උපතින් විශ්වාසය හා ශ්‍රද්ධාව අයිති නොවූවත් පසුව නොයෙක් හේතු සහිතව හෝ රහිතව විශ්වාසය අයිතිකර ගත් අය ද උපතින් ලද විශ්වාසය අහිමි කරගත් අවාසනාවන්ත අයද අප සමඟ ජීවත් වන බව අප සිහි තබාගත යුතුය.

විශ්වාසය හා ශ්‍රද්ධාව ලෝකයට කිසිවිටෙක ලබා දීමට නොහැකි වන අතර නිදහස් හා ගරුත්වයේ උසස්තර මට්ටමකට අප ගෙන යන්නේ ය.

කතෝලික අපට මේ වසර ඉතා වාසනාවන්ත වසරක් වනු ඇත්තේ වසර කීපයකට ප්‍රථම සිට මේ සඳහා අපව සූදානම් කර දැනුම්වත් කර මේ සුවිශේෂී වර්ෂය සඳහා අපව කැඳවාගෙන ඒම තුළ ක්‍රියාකාරී වන ශ්‍රද්ධාත්ම සැලැස්මක් බව එයට අවදිවන විට අපගේ හදවත් තුළට කිඳා බසියි. 2010 අගෝස්තු මස සිට 2011 අගෝස්තු මස දක්වා දිව්‍ය සත්ප්‍රසාදීය වර්ෂය, 2011 නොවැම්බර් මස 27 දින සිට 2012 නොවැම්බර් දක්වා දේව වචනයේ වසර, ගත වූ වර්ෂ දෙක තුළ අනාවරණය වී ඇත්තේ විශ්වාසයේ වසරකට අපව සූදානම් කරවීමක් බව දැන් අපට වැටහේ.

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් විසින් දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන් හා ශ්‍රද්ධාත්ම ප්‍රසාදයෙන් විශ්වාසයේ වසර නිමිත්තෙන් ඉදිරිපත් කරනු ලබන චක්‍ර ලේඛය ජනවන්දනා චක්‍ර ලේඛ - 06 අප අතට පත් වී දැනට මාස 4 ක් පමණ වේ. මේ කාලය තුළ මීසම් තුළ මෙය ක්‍රියාත්මක වී ඇති ආකාරය හා සුගතිය පිළිබඳව සමාලෝචනයක් කිරීම අප කාගේත් වගකීමකි.

අපගේ ජනතාව තුළ දෙවියන් වහන්සේ පිළිබඳව ඇත්තේ ලොකු ගෞරවයකි. ඔවුන්ගේ ජීවිත තුළ පැන නඟින ප්‍රශ්නයන් සහ වේදනාවන් අරගලයන් තුළ දී සහනයක් ලබා ගත හැක්කේ දෙවියන් වහන්සේගෙන් පමණක් බවත් ඔවුන් දනිති. මේ සඳහා ජනතාව යොමු කරවීමට සහ ඒ හිඩැස සම්පූර්ණ කිරීමට යම්කිසි වැඩපිළිවෙලක් ඉතා අත්‍යවශ්‍ය වන අතර මෙය කැපවීමකින් කළ යුතු කාර්යයක් බව අප කාටත් අවබෝධ වන්නකි. මීසම් තුළ කැපවීමකින් දැනට කටයුතු කරන ගරු පියතුමන්ගේ සේවය අගය කළ යුතුය. දැනට පවතින ක්‍රියා පිළිවෙත අනුව පියතුමන් මීසමේ වැඩ කටයුතු වලට අමතරව පදවියේ වැඩකටයුතු සහ පොදු කටයුතු සඳහා ද කැපවීමකින් ක්‍රියා කිරීමට සිදුවී ඇත. පියතුමන් වෙත පැවරී ඇති කාර්යයන් ඉතා බහුල බැවින් එතුමන් ඉතා අවිවේකි තත්ත්වයකින් පසුවේ. මීසම් ජනතාව මෙය තේරුම් ගත යුතුවේ. පිලාත් ජනතාව සතුටු කරන්නට කැමතිව ඔවුන්ට බරබ්බාස් නිදහස් කර දී ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට නියම කරන ලදි.

තමන්ගේ ආශාව, කැමැත්ත, තමන්ගේ අදහස් පමණක් ප්‍රායෝගික කරගැනීමට පියතුමන්ට බලපෑම් කිරීමෙන් වැළකිය යුතුය. එතුමන් තමන්ගේ ජීවිතය කැපකර සේවය කිරීමට කැප වී ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේ ජීවමාන බැවිනි. එම නිසා පියතුමන්ගේ පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට මීසම් ජනතාව සූදානම් විය යුතුය.

මේ වන විට ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වන්නේ මීසම් ජනතාවගෙන් එක්තරා පිරිසක් පමණි. හේතුන් සහිතව හෝ රහිතව දිව්‍ය පූජාවට සහභාගි වන්නන් සංඛ්‍යාව ගැන සෑහීමකට පත්වීමට නොහැකිය.

මෙවැනි ජනතාව ඩැහැගැනීමට ක්‍රියා කරන්නෝ බොහෝ ය. ඔවුන් නොයෙක් ආශ්චර්ය දේවල් පවා කරති. ජනතාව දිනාගැනීමට දිවා රෑ වෙහෙසෙති. ඔවුන්ගේ පරමාර්ථය වී ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේව පෙන්නා ශු. සභාවෙන් ඈත් කරවීම බව පැහැදිලිව පෙනේ.

එම නිසා මීසම් ජනතාව පියතුමන් සමඟ අත්බැඳ ගත යුතුය. ගමේ සෑම අස්සක් මුල්ලක් නෑර සුභාරංචිය ගෙන යෑමට යාච්ඤා මෙහෙයන් තුළින් අත්දැකීම් බෙදාගැනීම සහ ශු. බයිබලය තුළින් අනාවරණය කරනදේ ජනතාවට පැහැදිලි කරදීමට දැනට සිදුවන සියළු ආගම් විරෝධි ක්‍රියා නවතා සහය ලබා ගත යුතු අයගෙන් සහය ලබා ගෙන විශ්වාසයේ වර්ෂය සාර්ථක කරමු.

✍ බී. ටී. ජේ. ඇල් . පෙරේරා
වැලිවේරිය

# පල්ලියේ විලාසිතාව

**අප කතෝලික ආගමේ ජීවනාලිය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ. අපේ ආගමානුකූල මෙහෙයුම් වලදී අන් හැම අබිබවා වැදගත් ස්ථානයේ ලා සැලකෙන්නේ දිව්‍ය පූජාවයි. වෙනකක් නිසා නොව දිව්‍ය සත්ප්‍රසාදය තුළ ස්වාමින් වහන්සේගේ වැඩසිටීම අප කතෝලික ප්‍රජාව ඉස්මුදුනින් පිළිගන්නා නිසාය.**

ඉතින් අප ජීවිතය ගෙන යද් දී ඇතිවන නා නා ප්‍රකාර අරගලවලට ස්වාමින් වහන්සේගේ මැදහත්කම බලාපොරොත්තු වීම සෑම දෙනාටම පොදු කටයුත්තකි මෙය.

එසේ නම් අප දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දිය යුතු ප්‍රමුඛස්ථානය, භක්තිය, ගරුත්වය, කොතෙක් ද කියා පොඩ්ඩක් සිතා බැලීමට ඔබට කරන ආරාධනාවකි මේ.

ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් දිව්‍ය පූජාව ඇසීම ණය යුක්තියකි. එසේ නම් ඒ ණය යුක්තියවත් ඔබ ඉටුකරනවාද එම ණය යුක්තිය ඉටු කිරීමට නම් ඔබ අංග සම්පූර්ණ දිව්‍ය පූජාව ඇසීම පමණක් නොව ඊට සහභාගි ද විය යුතුය. ඒ සඳහා ගත කරන කාලය, දිව්‍ය පූජාවට සහභාගි වීම සඳහා පමණක් ගත කළ යුතුමය. බාහිර දේවලින් තොරව අවධානය දිව්‍ය පූජාව කෙරෙහිම පමණක් යොමුවීම පමණයි එයින් අදහස් කරනුයේ.

එකක්, ඒ සඳහා කාලය ගත කිරීම, දිව්‍ය පූජාව පෙනෙන සුදුසු ස්ථානයක සිටීම, හා සංනිවේදනය වන හා සම්බන්ධ වන ආකාරයෙන් සිටීම වැදගත් ය.

විශේෂයෙන් වැඩිහිටි අය මේ කාර්යය හරියට කළත් තරුණ පරපුර නම් ඒ කෙරෙහි යොමු වීම ප්‍රමාණවත් නොවේ. එහෙත් දහම් පාසල් මාර්ගයෙන් නම් එම ක්‍රියාව හොඳින් සිදුවන්නේ යම් කිසි විනයක් හේතුකොටගෙන නිසාය.

මා මෙයින් අදහස් කරන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට නිගරු කරන ඇතැම් වැඩිහිටි අම්මලා ගැන එක්තරා පැත්තක් අවධාරණය කිරීමට යි.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට භක්ති ආදරය ගරුත්වය දැක්වීම දේවස්ථානයේ සිටින සෑම දෙනාගේම යුතුකම නම් නා... නා... ප්‍රකාර පාප ප්‍රස්ථා මඟින් ඔවුන්ගේ අවධානය කඩ කරනවා නම් කවුද වන්නේ වැරදිකරුවන්.

ප්‍රධාන වශයෙන් වැඩිහිටි අම්මලා, දුවලා, කානිවල් එකට යන ආකාරයෙන්, ෂෝ එකකට, සංවත්සරයකට, මඟුල් ගෙදරකට යන ආකාරයෙන් ශරීරයෙන් වැඩි කොටසක් නිරුවත් කර ඇතැම් විට අම්මලා දුවලා විලාසිතාවෙන් සැරසී දිව්‍ය පූජාවට සහභාගි වීම උචිත ද? පටිවලින් නැත්නම් කෙටි ඇඳුමකින් සැරසී, අංගෝපාංග ප්‍රදර්ශනය වන ආකාරයෙන් සැරසී පැමිණ ඉතිරි කොටස් අතින් වසා ගැනීමට උත්සාහ කිරීම දිව්‍ය පූජාවේ වැදගත් අවස්ථාවලදී කැරේ.

දිව්‍ය පූජාවේ, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවන අවස්ථාවේ දී ඒ උච්චතම ගරු ගාම්භීර අවස්ථාවේදී සියළු දෙනා දනින් වැටී එයට ගරුත්වය දක්වන මොහොතේත් අසලින් සිටගෙන හෝ දණගසාගෙන තම විලි වසා ගැනීමට උත්සාහ කරන මේ අම්මලා දූ දරු සැදැහැවත් කතෝලිකයන්ගේ අවධානය කැඩීම කොතරම් පාපතර ක්‍රියාවක් ද? මේ විෂයය සම්බන්ධව සමහර පියතුමන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දෙන අවස්ථාවලදී සිදුවන අවහිරකම් ගැන නියම සිංහල බසින් තේරුම් කරදෙන අතර අනෙක් පියතුමන් එය නොදැක්කා සේ ක්‍රියා කිරීම බලපාන්නේ කාටද?

මඳක් සිතා බලා කටයුතු කරන්නේ නම් සැදැහැවත් කතෝලික ජනතාවක් හැටියට දෙවි ස්වාමින් වහන්සේට ප්‍රසන්න දිවියක් ගත කිරීමට හැකිවනු ඇත.

✍ ක්‍රිස්ටෝපර් සිල්වා
කෝපියාවත්ත

# ඇගැයුමට පැසැසුමක්

| | |
|---|---|
| බිහි වූ “පෝරුතොට ගරු පිය දසුන | මත |
| “උඳුවප් මිහිර” තිස් හය වස ගෙවා | ඇත |
| එහි සකසුවන් කළ මෙහෙයට අපරී | මිත |
| ඇගැයීමක් කරන්නට මට වදන් | නැත |
| | |
| පසුකොට ගිරි දුර්ග හා බාධක | නොයෙක |
| කිතු දම් සුවඳ පතුරාලන්නට | මෙ-ලක |
| උර දුන් ඒ උතුම් මහතුන් පසු | දිනෙක |
| කළ මහ කිසක් පවසමි අද කවි | පිටෙක |
| | |
| දෙස බස රැසට සමයට නිති වැඩ | සැලසූ |
| යහ කිතු දනන් ගැන විරලය අය | පැවසූ |
| ඒ වැනි කලෙකැ සම්මානෙන් උන් | පැසසූ |
| මේ තුති මල් පුදමි දෙපළට එහි | සකසූ |
| | |
| කවියට කලාවට ඉස්සර රජ ගෙයි | ද |
| දොරගුළු හැරිණි පුද දී නිති ගම් වර | ද |
| අද කවියා, කලාකරුවා කොතැනක | ද |
| ඔසවා බර දිවිය ගෙන යන්නෙක් නොවෙ | ද |
| | |
| නොපතා යළි කිසිත් අප සකසුවන් | මෙසේ |
| කළ මෙහෙවරට අපි කළ ගුණ තකමු | කෙසේ |
| “උඳුවප් මිහිර” මතු “තිස් හත” පිරෙන | වසේ |
| අගයමු දෙපළ දී උපහාරයේ | තොසේ |

(“උඳුවප් මිහිර” සම සකසුවන් වන මැක්ෂිමස් රෝයි පෙරේරා හා ශිරාන් මෛත්‍රී මහතුන් දෙපළගේ අමිල මෙහෙය අගයා ලියන ලද්දකි.)

✍ කටානේ කොන්සි හපුආරච්චි

# ඔබ යක්ෂයාගේ මිතුරෙක් ? - 5

"උපවාසකාලය නිම වූ පසු උන්වහන්සේට කුසගිනි ඇති විය. එකල යක්ෂයා කතා කරමින්, ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනවැ"යි උන්වහන්සේට කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, 'මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය' කියා ලියා ඇතැයි ඔහුට වදාළ සේක.

එවිට යක්ෂයා උන්වහන්සේ උස් තැනකට පමුණුවා, ක්ෂණයකින් ලෝකයේ සියලු රට රාජ්‍යයන් උන්වහන්සේට පෙන්වා, මේවා කෙරෙහි මුළු ආධිපත්‍යයද ඒවායේ යස ඉසුරුද ඔබට දෙන්නෙමි. ඒවා මට පවරා දී ඇති හෙයින් මා කැමැති කෙනෙකුට ඒවා දෙමි. එබැවින් ඔබ මා ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම්, ඒ සියල්ලම ඔබ සන්තක වන්නේය.' යි උන්වහන්සේට කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, 'නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න කියා ලියා ඇතැ'යි ඔහුට වදාළ සේක.

ඉන්පසු ඔහු උන්වහන්සේ ජෙරුසලමට ගෙන ගොස්, දේව මාලිග ාවේ කොත මුදුනේ සිටුවා, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න.

එසේ කියන්නේ, "ඔබට රැකවරණ සලසනුවස් උන්වහන්සේ සිය දූතයන් හට අණ දෙනු ඇතැ'යි ද 'යම් ලෙසකින් ඔබේ පය ගලක නොවදින පිණිස ඔවුන් සිය දෝතින් ඔබ උසුලනු ඇතැ"යි ද කියා ලියා ඇති බැවිනැ'යි උන්වහන්සේට කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, 'නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේ පරීක්ෂා නොකරන්න, කියාද ලියා ඇතැ'යි වදාළ සේක. යක්ෂයා මෙකී පරීක්ෂා නිමවා, සුදුසු අවස්ථාවක් යළිත් එළඹෙන තුරු උන්වහන්සේ අත්හැර ගියේය (ලූක් 4:1-13).

ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය බලා යන අතීශයින් දුෂ්කර චාරිකාවේදී අඛණ්ඩව පරීක්ෂාවට ලක් වූවාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා වශයෙන් පාළුකරය තුළ දින සතළිසක් මුළුල්ලේ පරීක්ෂාවට ලක් වේ. බයිබලය තුළ දින සතළිසක් යනුවෙන් අදහස් වන්නේ සූදානම් වීමේ කාලයයි. දිවැසිවර එලියා මීට සමාන අත්දැකීමකට පාත්‍ර විය; "ඔහු නැඟිට කා බී ඒ ආහාරයේ සවි ශක්තියෙන් දවල් සතළිසක් හා රෑ සතළිසක් ගමන් කර දෙවියන් වහන්සේගේ කන්ද වන හොරොබ් ළඟට පැමිණියේය"

(1 රාජාවලිය 19:8).

මොසෙස් ද පාළුකරයේ දී එවැනි අධ්‍යාත්මිකව සූදානම් වීමේ අත්දැකීමක් සමග අරගල කරන ලදී. "සමිඳාණන් වහන්සේ ඔබ සමග පිහිටෙවූ ගිවිසුම සටහන් කළ ගල් පුවරු ලබාගැනීම සඳහා මම කන්දට නැඟ එහි දවල් සතළිසක් සහ රාත්‍රි සතළිසක් නැවතී සිටියෙමි...... තවද, දවල් සතළිසක් සහ රාත්‍රී සතළිසක් ගෙවී ගිය පසු සමිඳාණන් වහන්සේ ගිවිසුම ලියා තිබූ ගල් පුවරු දෙක මට දුන් සේක" (ද්වීතීය නීති සංග්‍රහය 9:9-11). දින සතළිසක් යන්නෙහි දීර්ඝ කාලයක් යන අදහසද ගැබ් වී ඇත; පුරාණ ගිවිසුමේ එන ජෝනා දිවැසිවරයාගේ පොතේ එවැනි අදහසක් ගැබ්වේ;" ජෝනා නගරයට ඇතුළු වී එක දවසක් ගමන් කර, "තව දින සතළිසකින් නිනීවය වැනසෙනු ඇතැ" යි මොරගසා ප්‍රකාශ කළේය" (ජෝනා 3:4).



මෙහිදී අපි තව දෙයක්ද පැහැදිලි කර ගත යුතුව ඇත. එනම් උන්වහන්සේව දුර් පරීක්ෂාවට යොමු කරන ලද්දේ ආත්මයාණන් වහන්සේ විසින් නොවන බවයි. එම දුර්පරීක්ෂාවන් සිදු වූ කාලයේදී උන්වහන්සේව ශක්තිමත් කරන ලද්දේ නඩත්තු කරන ලද්දේ, මෙහෙයවන ලද්දේ, ආත්මයාණන් වහන්සේ විසින්ය. ශුද්ධාත්මයාණන් විසින් ජේසුස් වහන්සේව වෙනත් අවස්ථාවලදීද මෙහෙයවන ලද බව නව ගිවිසුමේ ස්ථාන කිහිපයකම සඳහන් වේ.

"තවද, ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් යුක්තව ගලීලයට පෙරළා වැඩිය සේක" (ලූක් 4:14). "එම ඇසිල්ලෙහි ආත්මයාණෝ උන්වහන්සේ පාළුකරයට පැමිණෙවූ සේක" (මාක් 1:12). "ඒ පැයේදීම උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පූර්ණ වී උදන් අනමින්....... (ලූක් 10:21). ආත්මයාණන් වහන්සේ කිසිදු පුද්ගලයෙකුව කිසිදු හේතුවක් නිසා දුර්පරීක්ෂාවට භාජනය නොකරන සේක.

පුරාණ කාලයේදී කාන්තාරය සලකනු ලැබුවේ යක්ෂයන් වාසය කරන ලද ස්ථානයක් ලෙසයි. "උන්වහන්සේ ගොඩ බසිත්ම, නුවරින් ආ දුෂ්ටාත්මාවේශ වූ මිනිසෙක් උන්වහන්සේට හමුවිය.... ඒ අශුද්ධාත්මය නොයෙක්වර ඔහුට ආවේශ වූ බැවින්, යදම්වලින් ද විලංගුවලින්ද බැඳ ඔහු මුර කරන ලද්දේය. එහෙත්, ඔහු ඒ බැඳුම් කඩා දැමීය. දුෂ්ටාත්මය විසින් ඔහු පාළුකරයට පලවා හරින ලද්දේය" (ලූක් 8:27-29). "අශුද්ධාත්මය මිනිසුන්ගෙන් දුරුව ගිය කල, ඔහු දිය නැති තැන්වල සැරිසරමින්, නවාතැනක් සොයන්නේය" (ලූක් 11:24). මෙම බයිබලීය පාඨවලින් පෙනී යන්නේ යක්ෂයා සහ පාළුකරය අතර සෘජු සම්බන්ධයක් තිබූ බවයි.

මෙහිදී ලූක් තුමා යක්ෂයා හැඳින්වීම පිණිස යොදා ඇත්තේ 'ඩියාබොලොස්' (Diabolos) යන ග්‍රීක වචනයයි. දෙවියන් වහන්සේගේ පුත්‍රයා සහ සේවකයා වශයෙන් සලකනු ලැබූ ජේසුස් වහන්සේගේ අනන්‍යතාවය යක්ෂයා විසින් අභියෝගයට ලක් කරනු ලබයි. "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනැව" (ලූක් 4:3). "ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න" (ලූක් 4:9).

මෙහිදී ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ බලවත් වචනය නමැති ආයුධය භාවිත කර යක්ෂයා සමග සටන් වදින සේක. පළමු වන පරීක්ෂාවේදී ජේසුස් වහන්සේ ද්විතීය නීති සංග්‍රහයෙන් පාඨයක් උපුටා දක්වයි; "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න; උන්වහන්සේට පමණක් සේවය කරන්න" (6:13). තුන්වන පරීක්ෂාවේදී යක්ෂයාද ශුද්ධ ලියවිල්ලෙන් පාඨ දෙකක්ම උපුටා දක්වා උන්වහන්සේව පරීක්ෂාවට ලක් කරයි.

"ඔබට රැකවරණ සලසනු වස් උන්වහන්සේ සිය දූතයන් හට අණ දෙනු ඇතැ" (ගීතාවලිය 91:11), "යම් ලෙසකින් ඔබේ පය ගලක නොවදින පිණිස ඔවුන් සිය දෝතින් ඔබ උසුලනු ඇතැ" (ගීතාවලිය 91:12). මීට පිළිතුරු ලෙස ජේසුස් වහන්සේ ද්වීතීය නීති සංග්‍රහයෙන් තුන්වන වරටත් පාඨයක් උපුටා දක්වයි; "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේ පරීක්ෂා නොකරන්න" (6:16). ක්‍රිස්තුස් වහන්සේත් යක්ෂයාත් අතර ඇති වන මෙම ගැටුම ඉදිරිපත් කර ඇත්තේ පුරාණ ඊශ්‍රායලයේ ගුරුවරුන් (රබ්බිවරු) දෙදෙනෙකු අතර ඇති වන දේව ධාර්මික සංවාදයක් හෝ මත ගැටුමක් වශයෙනි.

මෙම සංවාදය තුළ නික්මයාමේ අත්දැකීමෙන් ලැබුණු දේව ධාර්මික පරිණත බවත්, පන්නරයත්, දෙවියන් වහන්සේගේ සදාකාලික පක්ෂපාතිත්වය සහ විශ්වාසනීයත්වය තුළින් ලැබුණු දේව ධාර්මික ප්‍රඥාවත් පිළිබිඹු වේ. තම පියාණන් වහන්සේ විසින් දුෂ්කරතාවයන් සහ දුර්පරීක්ෂාවන් වලදී තමාව අධ්‍යාත්මිකව නඩත්තු කරන බව සහ පෝෂණය කරන බව උන්වහන්සේ අත්දැකීමෙන් දන්නා සේක. මෙහිදී යක්ෂයාව පරාජය කරන ලද්දේ දේව වචනයේ බලයෙනි.

ජේසුස් වහන්සේගේ ක්‍රියාශීලි දූත මෙහෙවරදී යක්ෂයාගේ බලය සමග දිගින් දිගටම ගැටීමට සිදු විය; දුෂ්ටාත්මයෝද, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය" යි බෙරිහන් දෙමින් බොහො දෙනෙකුගෙන් දුරු වූහ. තමන් ක්‍රිස්තුස් වහන්සේ යයි ඔවුන් දැන සිටි නිසා උන්වහන්සේ ඔවුන්ට තරවටු කොට, කතා කිරීම තහනම් කළ සේක" (ලූක් 4:41). "උන්වහන්සේ ගොඩබසිත්ම, නුවරින් ආ දුෂ්ටාත්මාවේශ වූ මිනිසෙක් උන්වහන්සේට හමුවිය.... මෙසේ කීවේ, ඒ මිනිසාගෙන් දුරු වන්න උන්වහන්සේ අශුද්ධාත්මයට අණ කළ බැවිනි" (ලූක් 8:27-29).

ඉදිරි කලාපයට... »



මහාචාර්ය **ඇන්ටන් මීමන**

# මානව ජීවිතය අධ්‍යාත්මික චාරිකාවකි - 9

## විශ්වාසය - 6

අපි උදාහරණයක් ගනිමු. කතෝලික ඇදහිල්ල නිවැරදිව සහ ගැඹුරට තේරුම් ගත්, එය ඓතිහාසිකව හැදෑරූ පුද්ගලයන් මූලධර්මවාදී කණ්ඩායම් අතර නැත. ඔවුන් කතෝලික ඇදහිල්ල ගැන දරන බොහෝ මතයන් වැරදිය. ඔවුන්ගේ නිගමනයන් කතෝලික ඇදහිල්ල ගැන ඉතා මතුපිට සහ ඉතා අල්ප දැනීමකින් එළඹුණු දුර්මතයන්ය. ඔවුන්ගේම වැරදි නිගමන වලින් සහ දුර්මතයන් වලින් ඔවුන් කොතරම් අන්ධ වී තිබේද කියතොත් තමන් වැරදි නිගමන වල හිරවී සිටින බවක් වත් ඔවුන්ට අවබෝධ නොවේ. එයින් පෙනෙන්නේ ඔවුන් කොතරම් අන්ධ වී ඇති ද කියාය. තමන්ට කතෝලික ඇදහිල්ලේ මූලික ස්වරූපය හරියාකාරව අවබෝධ වී නොමැති බව පිළිගැනීමටවත් ඔවුන් අවංක නැත, නිහතමානි නැත.

එමෙන්ම මීට පෙර කතෝලිකයන් වී සිටි, දැනට මූලධර්මවාදී කණ්ඩායම් වලට සම්බන්ධ වී සිටින පුද්ගලයන්ට පවා කතෝලික ඇදහිල්ල පිලිබඳව නිවැරදි අවබෝධයක් තිබෙන බව නොපෙනේ. ඔවුන්ට කතෝලික ඇදහිල්ල ගැන ගැඹුරු අවබෝධයක් තිබුනා නම් කතෝලික සභාව හැර යන්නේ නැත. හැර යෑමට කිසිදු උවමනාවක්ද නැත.

වෙනත් කිතුනු සභාවන් තුළ පවතින සෑම යහපත් දෙයක්ම, සෑම නිවැරදි දෙයක්ම, කතෝලික සභාව තුළත් පවතී. එමෙන්ම එම සෑම යහපත් දෙයක්ම, නිවැරදි දෙයක්ම, අනෙක් කිතුනු සභාවන් ලබා ගෙන ඇත්තේ කතෝලික සභාවේ ඉගැන්වීම් වලිනි. සෑම කිතුනු සභාවකම නැංගුරම (Anchor) කතෝලික සභාවයි. කතෝලික සභාව නොතිබුනේ නම් අනෙකුත් කිතුනු සභාවන්ට ද කිසිදු පැවැත්මක් නැත. තමන්ගේ සභාවන් සඳහා අවශ්‍ය දේව ධාර්මික සංකල්ප සහ අදහස් සහ අධ්‍යාත්මික පෝෂණය සහ මඟපෙන්වීම ලබා ගෙන ඇත්තේ කතෝලික සම්ප්‍රදායෙන්ය. සැබෑ කිතුනුවකුගේ ලක්ෂණයක් නම් අවංකත්වය සහ නිහතමානිත්වයයි.

අපි දැන් කිතුනු විශ්වාසයේ දැක්මෙන් වර්තමාන ලෝකය සහ එහි සිදුවෙමින් පවතින දේවල් තේරුම් ගැනීමට උත්සාහ කරමු. ක්‍රිස්තුස් වහන්සේ තුළ තම සමස්ත විශ්වාසය තබන්නා ලෝකය විග්‍රහ කරන්නේ උන්වහන්සේගේ කුරුසියේ දෘෂ්ඨි කෝණයෙනි.

ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීමට සහ දරුණු මරණයට හේතු වූ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික, මනෝවිද්‍යාත්මක සහ දේවධාර්මික කරුණු සහ සිද්ධීන් වලට සමාන්තර සහ සමාන කරුණු සහ සිද්ධීන් වර්තමාන ලෝකය පුරාත් අනන්ත ලෙස අපට දැක ගත හැකිය. එසේ නම් ක්‍රිස්තුස් වහන්සේව කුරුසියේ ඇණ ගැසීමේ ක්‍රියාවලිය අදටත් අප මධ්‍යයේ සිදුවෙමින් පවතී.

නමුත් මෙම තත්ත්වය සහ සත්‍යය අප බොහෝ දෙනෙකුට පිළිගැනීමට, බාර ගැනීමට, දුෂ්කර තත්ත්වයක් සහ සත්‍යයකි. තමන් ක්‍රිස්තුස් වහන්සේට ආදරය කරන බව බොහෝ කිතුනුවන් වාචිකව ප්‍රකාශ කරන දෙයකි. නමුත් ඔවුන් එසේ ප්‍රකාශ කරන්නේ ගැඹුරට හිතාමතා හෝ ඒ ගැන මෙනෙහි කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් නොවන බව පෙනෙන කරුණකි. මෙසේ පැවසීමට හේතුව නම්, ඔවුන්ගේ හැසිරීමෙන්, ඔවුන් ජීවත් වන ආකාරයෙන්, ඔවුන් අනෙක් පුද්ගලයන්ට සලකන ආකාරයෙන්, ඔවුන් ක්‍රිස්තුස් වහන්සේට අවංකව සහ සැබවින්ම ආදරය කරන බවක් පෙනෙන්නට නොතිබීමයි. ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ගැඹුරු විශ්වාසයක් ප්‍රගුණ කර ගැනීමට, උන්වහන්සේට මුළු හදවතින්ම ආදරය කිරීමට වර්තමාන ලෝකයේ සැබෑ තත්ත්වය ගැන මෙන්ම මිනිසුන් විඳින විවිධාකාරයේ දුක් කම්කටොළු ගැනද ගැඹුරු විග්‍රහයක් සහ අවබෝධයක් අවශ්‍යය. දැනට ලෝකයේ පවතින යථාර්ථයන් ගැන අපක්ෂපාතී සහ පූර්ව නිගමන වලින් තොර විමසුමක් නොකර ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවිත තුළ ක්‍රියාත්මක වන ආකාරය තේරුම් ගත නොහැකිය. විශ්වය තේරුම් ගත හැක්කේ විශ්වාසයේ දැක්ම තුළින් පමණි.

මෙය තේරුම් ගැනීම සඳහා අප වැඩි දුර යෑමට අවශ්‍ය නැත. විසි වන ශත වර්ෂය තරම් මිනිස් ඝාතන සිදුවූ ශත වර්ෂයක් ලෝක ඉතිහාසයේ කිසිම කාලයක තිබී නැත. වර්තමාන ලෝකයේ සිදුවෙමින් පවතින තරම් යුද කෝලහාල, ලේ වැගිරවීම්, මිනිස් ඝාතන. හිංසාකාරී ක්‍රියාකාරකම් ලෝක ඉතිහාසයේ කිසිම වකවානුවක සිදු වී නොමැත. ශ්‍රී ලංකාව තුළ පවා වර්තමානයේ සිදුවෙමින් පවතින හිංසාකාරී ක්‍රියාවන් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යුගයන් වල පවා සිදු වී නොමැත.

සංසන්දනාත්මකව ගත් කළ යටත් විජිතවාදී සමයන් වර්තමාන හිංසාකාරී තත්ත්වයට වඩා බොහෝ සාමකාමී වූ බව පෙනේ. යටත් විජිතවාදය යහපත් දෙයක් බව මින් කිසිසේත්ම අදහස් නොවේ. යටත් විජිතවාදී අත්දැකීම නිසා අප වඩා මානුෂික, ප්‍රඥාවන්ත, කරුණාවන්ත, සංවේදී, ඉවසිලිවන්ත, දුරදක්නා නුවණක් සහිත, පීඩිතයන්ගේ පැත්ත ගන්න සහ මිහිතලයේ අසරණයන්ගේ දුක් කම්කටොළු හදවතින්ම හඳුනන ජාතියක් බවට පත්විය යුතුව තිබුණි. නමුත් සිදු වී ඇත්තේ යුරෝපීය අධිරාජ්‍යවාදීන් වෙනුවට, දේශීය පීඩකයන්, සූරා කන්නන් සහ ලාංකීය අධිරාජ්‍ය වාදීන් 1948 සිට අද දක්වා බලයට පත්වී තිබීමය. නිදහස ලැබුණු දා සිට ශ්‍රී ලාංකිකයන් බහුතරයකගේ දුක් පීඩාවන් වැඩි වී මිස අඩු වී නොමැත. යටත් විජිතවාදී අත්දැකීම නිසා අප උදාර, උත්තරීතර සහ ශ්‍රේෂ්ඨ ජාතියක් බවට පත් නොවීමෙන් හානියක් සිදුවූයේ අපටමය).

ඉදිරි කලාපයට... »

# වග. වැලිකන්නේ 'දයාවේ දූතිකාව' මරි මව් තුරුලට ගොස් වසරයි

වග, මීසමට අයත් වැලිකන්නේ විසූ මරියා දොඩන්ගොඩ මහත්මිය සගසුව දිනා 2013 පෙබරවාරි 01 දිනට පුරා වසරකි. ජපමාල මාතා දෙව්මැඳුරේ මංගල්‍යය දිනක උපත ලද නිසා ඇයට 'මරියා' යනුවෙන් නම් තබන ලදි.

ළමා අවධියේ පටන්ම දහමට, ලැදිව ආදර්ශවත් ජීවිතයකට අවතීර්ණ වූ ඇය තුරුණු වියේදී නත්තල් නාට්‍යයක මරියාවන්ගේ චරිතයට පණ පෙවීමට ලැබීම ඇය ලද මහඟුම භාග්‍යයක් ලෙසින් සැලකීය.

එම ආශිර්වාදයෙන් වඩාත් ජ්වලිත වූ ඇය මරිය තුමිය වෙත වඩාත් භක්තියෙන් තව තවත් ලංවිය. නිරන්තර යැදුම හා දුගී දුප්පත් ජනතාව වෙත දානය ඇයගේ ජීවිතයේ හරය වූ අතර පුබුදු වෙහිද ප්‍රබල සාමාජිකාවක් විය. වැලිකන්න දේවස්ථානයෙහි ශ්‍රී හෘදය සමිතියේ සහ මරිය හමුදාවෙහි ප්‍රබල සාමාජිකාවක් විය. වැලිකන්න ශ්‍රී හෘද සමිතියේ ආර්ථික සාමාජිකාවක් වූ ඇය මියයන තුරුම එහි සමාජිකාවක් වූවාය. සමකාලිනයනට 'නෝනෙ අක්කා' වූ ඇය ඥාතීන් අතර නෝනෙ නැන්දාද' තරුණ තරුණියන් අතර 'සුදු ආච්චී' විය.

සිය ජීවිතය මනාව දහමින් පෝෂණය කරගත් ඇය අන් අය ඉදිරියේ, විශේෂයෙන් අනාගත



මිකයින් ඉදිරියේ කිතුනුකමට සාක්ෂි දැරුවාය. දරුවකු රෝගීවූ විට විභාගයට පෙනී සිටින විට දියණියක වැඩිවියට පත්වූ විටෙක දරුවකු ලැබීමට ආසන්න ගැබ්බර මවකට ආදී ජීවිතයේ වැදගත් අවස්ථාවලදී ඇය වෙතට පැමිණි. බොහෝ දෙනා ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන ලෙස ඉල්ලා සිටීමට බොහෝ දෙනා පුරුදු වී සිටියහ. ඇය වෙතට පැමිණි බොහෝ දෙනා හිස් අතින් ආපසු ගියේ නැත.

දේව වචනය අකුරටම පිළිපැදි ඇය දකුණතින් දෙන දෙය වමතට නොදැනෙන්නට නිරන්තරයෙන්ම ප්‍රවේශම් විය. දිවියේ සැඳෑ සමයේ ඇයගේ මුවග නිතරම රැව්දුන්නේ "මා දැන් ගෙවනුයේ මොහොතේ ජීවිතය" කියාය. ඒ අනුව සිය දිවියේ අවසන් දිනට තෙදිනකට පෙර කුරුසියේ යාච්ඤා පොත සිපගත් ඇය 'අනේ දේව මැණියනි' යනුවෙන් පවසා ඇත. ඇය මීසම් වාසීනට මෙන්ම ඥාතී හිත මිතුරනට 'තෙරේසා මව්තුමියක්' විය. සැබවින්ම ඇය අසල් වැසියනට 'දයාවේ දූතිකාවක්' විය.

රජයේ සේවකයෙකු වූ ප්‍රැන්සිස් මහතා සමග විවාහවී සිටි ඇය සිය සැමියාගේ වියෝවෙන් පසු එම වැන්දඹු හා විශ්‍රාම වැටුප් මීසම් සංඝයේ දුගී දුප්පත් අසරණයින්ගේ අවැසිතාවන් සඳහා පමණක්ම විය පැහැදම් කළ වත්මන් යුගයේ නිහඬ ධර්ම දූතිකාවක් වූවාය. අපි ඇයට මොක්සුවය පතමු.

**එම්. ජෝ. පාරිස්**

# සිසු දරුවන් හට නිසිමග තැනු ගරු මේරි මැග්ඩලින් පොන්වීර සොහොයුරිය

පමුණුගම නුගපේ නික්ලස් පොන්වීර සහ මේරි මැගිලින් පෙරේරා යන දෙමාපියනට දාව මෙලොව එළිය දුටු මියුරින් බියට්‍රිස් පොන්වීර නමින් ළමා කාලය ගෙවූ ඇය ශුද්ධවූ පවුලේ නිකායේ ගරු මේරි මැග්ඩලින් පොන්වීර සොහොයුරිය ලෙසින් කැඳවීම් ලැබ කුඩා දරුවනට අමරණීය සේවාවක් ඉටුකොට දෙව්පිය සෙවන පතා 2011 අප්‍රේල් 25 දින මෙලොවින් සමුගත්තාය.

1969 දී කළුතර ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයෙන් ගුරුදිවිය අරඹා 1981 දක්වා එහි සේවය කොට 1982 දී රජයේ සේවයට පත්වීම් ලබා 1996 දක්වා අනුරාධපුර සා. ජෝශප් පිරිමි පාසලේද 1996-2006 කාලය තුළ කුරුණෑගල ශු. ප. නි. බාලිකා පාසලේ ප්‍රාථමික විදුහල්පතිනිය ලෙසද සැලසූ සේවය තුළින් කුඩා දරුවන් පූර්ණ සංවර්ධනයට යොමුකිරීමේ නිරතවූවාය.

වෙසෙසින් අනුරාධපුරයේ සේවයේ යෙදී සිටියදී සිසුදරුවන්ගේ විනය හා අධ්‍යාත්මිකය නැංවීම සඳහා පෙරමුණ ගනිමින් කටයුතු



කළ අතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට ළමුන් සූදානම් කිරීම වැනි ගරු පැවදි සොහොයුරියන්ගෙන් ඉටුවන සේවාවන් නොපිරිහෙලා ඉටු කළ මෙතුමිය දුෂ්කර ගම්මානවල දරුවන් සම්බන්ධ කරගනිමින් ඉගැන්වීමේ කඳවුරු පැවැත්වීමත් පූජා උදව්, ළමා ධර්මදූත හා තරුණ සමිතිවල දරුවන්ට මගපෙන්වීමත් දුෂ්කර පෙදෙස්වල දිව්‍ය පූජාව පැවැත්වීමත් දහම බෙදාදීමත් සංවිධානය කර ඇත. මෙතුමිය විසින් බැහැ නොදකින ලද එකම නිවසක් හෝ අනුරාධ පුරයේ නොමැති බව වෙසෙසින් සඳහන්කළ යුත්තකි.

මෙලෙසින් තමන් ලද කැඳවීමට මුළු දිවියම කැපකරමින් සිසු දරුවන්ගේ දෙමාපියන් සමග ගොඩනගාගත් සබඳතා හා සුහදතාවය අනුව පාසල් සංවර්ධනය කර ඒ තුළින් ද දරුවන්ගේ හෙට දවස ආලෝකවත් කිරීමට වෙහෙසුණු මෙම පැවිදි සොහොයුරියගේ සමුගැන්ම දුරබැහැර මෙන්ම ගම් ප්‍රදේශයේද කාගේත් ඉමහත් සංවේගයට කරුණක් විය.

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව

# දැහැමි අසරණ සරණ සේවයක් ගත කළ ස්වර්ගස්ථ වූ ශුද්ධවූ පවුලේ නිකායේ ගරු මේරි වික්ටෝරියා පැවිදි සොහොයුරිය

**වෙන්නප්පුව ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ 'ශාන්ත සමය' නිවසේ අවසන් කාලය ගත කළ ගරු මේරි වික්ටෝරියා කන්‍යා සොහොයුරිය වයස අවුරුදු 94 ක් ආයු වළඳා 2013 මාර්තු 5 වන දින ස්වර්ගස්ථ වූවාය.**

ඇය 1941 වසරේ පෙබරවාරි 8 වන දින පැවිදි දිවියට ඇතුලුව ශුද්ධවූ පවුලේ කන්‍යා සොහොයුරියක වූවාය. වසර තුනක ගුරු අභ්‍යාස විදුහලේ පුහුණුවෙන් පසු 1944 සිට 1976 දක්වා වෙන්නප්පුව, බොරලැස්ස, කඳවල, හලාවත, තුඩැල්ල, දැලතුර, කළුවාරිප්පුව, කෝන්ගොඩමුල්ල, බුරුල්ලපිටිය, රත්මලාන, බම්බලපිටිය, ලෝරිස් පාර යන විදුහල් වල ගුරුවරියක හා විදුහල්පතිනියක ලෙස සේවය කරමින් දරුවන් දැනුමින්ද, දහමින්ද පෝෂණය කළාය.

1976 මාර්තු 31 දින ඇය ගුරු සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව 1977 වසරේ



සිට ඇය මීසම් සේවයේ යෙදුනාය. කමරාගොඩ, දළුගම. අනුරාධපුරය රඹෑව, නයිනමඩම, බුරුල්ලපිටිය, දෙහියාගාත, මඩම්පැල්ල, ආඬිඅම්බලම, කඳවල, රාගම යන මීසම් වල දහම් කෙත අස්වද්දමින් සමාජ සේවයේ යෙදුනාය. ශුද්ධවූ පවුලේ ගිහි සමාජ පිහිටුවමින් ගිහි ජනතාව නව මඟකට යොමු කළාය.

ඇය එවකට දළුගම මීසම යටතේ පාලනය වූ සපුගස්කන්ද දේවස්ථානයට අයත් කැළණියේ ගෝනවල අංක 671 නිවසේ පදිංචිව සිට නැසීගිය ඩබ්. සීමොන් පෙරේරා මහතාගේත් ජී. ජුලියානා බොතේජු මහත්මියගේත් වැඩිමහල් දියණියයි.

ඉතාමත් භක්තිමත්, දැහැමි, ජීවිතයක් ගත කළ ඇයට මෝක්ෂ සම්පත්තිය අත්වේවායි ප්‍රාර්ථනය කරමු. ඇය වෙනුවෙන් ඔබගේ යාච්ඤාවන් දෙවිසමිඳාණන් වෙත යොමු කරන්න.

**ප්‍රැන්සිස් ද සේරම්**

# එකම දිනෙක දෙවිඳුන් සොයා ගිය ලයනල් වෙදමහතා සහ හෙලන් ගුරු මාතාව



**ස්වාමිපුරුෂයා හා භාර්යාව එකම දිනෙක මිය යෑමේ කලාතුරකින් සිදුවිය හැකි ඉතාමත් දුර්ලභ ගනයේ ඓතිහාසික සිදුවීමක් පමුණුගම දුන්ගාල්පිටියෙන් වාර්තාවෙයි.**

ඔහු 1922 මාර්තු මස 14 දින උපන් කැපුන්ගොඩ ගම මැද ලියනගේ මැතිව් ලයනල් පෙරේරාය. ඔහු පමුණුගම අඩදූවේ 'ලයනල් වෙදමහතා' නමින් ප්‍රසිද්ධ වු නිහඬව දිළිඳු ජනතාවට නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර පවා ලබා දුන් අති දක්ෂ ආයුර්වේද වෛද්‍යවරයෙක් ලෙස පොදු ජනතාව අතර ගෞරවය, ජනප්‍රියත්වය හා භක්ති ප්‍රණාමය දිනාගත්, ජනතාවට දහමට මිනිස් කම් වලට ගරු කළ දුර්ලභ ගනයේ නිහතමානි යුග පුරුෂයෙකි.

ඔහු සිරිලක සුප්‍රසිද්ධ පාරම්පරික සීදුව, ඇවරිවත්ත සිංහල ආයුර්වේද වෛද්‍ය පරපුරෙන් දේශීය වෛද්‍ය ශිල්පය හැදෑරූ දක්ෂ වෛද්‍ය වරයෙකි. රජයේ දේශීය ආයුර්වේද වෛද්‍ය සභාවේ පරීක්ෂණයෙන් ඉහලින්ම සමත් වී දේශීය වෛද්‍යවරයකු ලෙස රජයේ ලියා පදිංචිය ලබා ගත්තේය. ඔහු මීගමු/ පෙරියමුල්ල, කැපුන්ගොඩ, දුන්ගාල්පිටිය, පිටිපන, වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වා ගනිමින් දක්ෂ අන්දමින් රෝගීන් සුවපත් කරමින් පොදුජන සේවයේ යෙදුනේය.

මෙම ඓතිහාසික කතාවේ අනිත් පැත්තේ ඔහුගේ ආදරණීය භාර්යාව වූ දුන්ගාල්පිටියේ කිරිහෙට්ටි ලියනගේ හෙලන් මේරි නොහොත් ප්‍රදේශයෙ ජනප්‍රිය හෙලන් ස්කෝලනෝනා දරු දැරියන්ගේ නෙත් පැහැදීමට දහමින් හා විනයෙන් ඔවුන් පෝෂණය කිරිමට ඇප කැපවූ ගුරු මාතාවකි. එසේම දෙව්මැඳුරේ හා ප්‍රදේශයේ සියලු ආගමික හා සමාජ සංවිධානවල පෙරමුණ ගනිමින් දේව ජනතාවට ද මහඟු දහම් සේවාවක් ඉටු කළාය.

ඇය 1928.02.09 දින උපත ලබා පොල්ගොල්ල ගුරු අභ්‍යාස විද්‍යාලයේ පුහුණු ගුරුවරියක ලෙස දුන්ගාල්පිටිය, තලාහේන පිටිපන බසියාවත්ත යන පාසල් වල සේවය කළාය. මෙම වෙද - ගුරු යුවලගේ පුත්‍රයා මහජන සෞඛ්‍ය පරීක්ෂක ජෝශප් නෙවිල් වොල්ටර් පෙරේරාය. දියණිය මොරින් කාන්ති පෙරේරාය.

දැහැමි සරල දිවියෙන් ජන හද ජයගෙන පොදුජන සේවයට ඇපකැපවූ මෙම යුවළ දීර්ගායු ලබා සිය ජීවන යුතුකම් සියල්ල ඉටුකර දින එකම දා දෙවිඳු නියමයෙන් ස්වර්ගස්ථ වූහ. එසේම එකම දිනයේ දුන්ගාල්පිටිය ශුද්ධවූ මග්දලාහි මරියා දෙව්මැඳුර සුසාන භූමියේ එකට මිහිදන් විය. ඉතාමත් කලාතුරකින් මෙම සිදුවීම ඓතිහාසික කිතුනු ඉතිහාසයේ සටහන් විය යුතුමය.

දේව ජනතාවටත් නැතිබැරි පොදු ජනතාවටත් දැහැමින් සේවය කළ වෙදගුරු යුවලට ප්‍රදීපයේ සංවේගය හා සගපුර සැපත පතමු

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# දෙවිසමිඳුන් සොයා ගිය පුවත්පත් කලාවේදී ලෝරන්ස් ප්‍රනාන්දු සූරීන්

**ජාඇල දඬුගම් තොටුපොල, 457 හි විසූ ලෝරන්ස් ප්‍රනාන්දු මහතා උපත ලැබුවේ 1944 වසරේ මැයි 02 දිනදීය. පනස් නව විය උපන්දිනය සපුරා දින පහක් ගත වෙද්දි දිවියෙන් සමුගන්නට සිදුවූයේ හෘදයාබාධයකින් උදැසන තම නිවසේදීමය.**

දෙවිඳුන් විසින් නියමවූ කාලය හමාර කළ ලෝරන්ස් මහතා වර්තමානයේ 'දිවයින' දඬුගම වාර්තාකරු මව්බිම දඬුගම වාර්තාකරු හා ගුවන් විදුලි වැඩසටහන් මාධ්‍ය කරුවකු ලෙස තම විශ්‍රාමික ගුරු දිවියෙන් සමුගෙන විශාල සේවයක් සතට කළේය. 'ඥානාර්ථ ප්‍රදීපය' තුළින් මහත් ජනප්‍රියතාවයට ලත් ලෝරන්ස් ප්‍රනාන්දු මහතා පලකළ ලිපි අනන්ත අප්‍රමාණය. ජනතා හදවත අවදිකරවන්ට ඔහුගේ පන්හිඳ මෙහෙයවූයේ කිතුනු ජනතාවට පමණක් නොව මුළු ලංකාවේම යහපත පිණිසය. ආර්ථික, සමාජීය, වාර්තා, ලේඛන, පරික්ෂණ ලිපි සැපයූ ඔහු දූ දරුවන්ගේ ප්‍රශ්න හා අන් අයට පරෝපකාරිවීමේ ක්‍රියා පිළිබඳවද ලියා දැනුවත් කළේය. 'ජනදින' 'දවස' ආදි පුවත්පත් හරහා දසක පහකට වැඩි කලක් තම ජීවිතටය අරුත්බර ලේඛනය කරා යොමු කළ ඔහු ගුරු දිවියේ වසර 37 ක සේවයක්ද කළ අනභිබවනිය නිහතමානි, කරුණාවන්ත ගුරුවරයෙකි, හිතවතෙකි. දිවයිනේ පාසල් ගණනාවක සේවය කර විශ්‍රාම ලැබුවේ අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශකවරයකු ලෙසිනි.



ජාඇල ප්‍රදේශයේ පාරිසරික සංගම් ක්‍රියාකාරිකයකු වූ ඔහු අධ්‍යාපන කලාපය 'දියදම' පුවත්පතින් ජනතාව අවදිකළ ලේඛකයෙකි. ජාතික කතෝලික ලේඛක හවුලෙන්ද 2011 වසරේ සම්මාන ලද ඔහු, 2012 වසරේ 'උඳුවප් මිහිර' සම්මානයකින් ද පිදුම් ලැබීය. යහපත් දිවියක් ගතකළ ලෝරන්ස් ප්‍රනාන්දු නම් ලේඛක භවතාට ස්වර්ග සම්පත්තිය හිමිවේවා!

**මැක්සිමස් රෝයි පෙරේරා**
සේයා: එච්. ඒ. කල්දේරා

# සුසුමාණෙනි වඩින්න!

සුළඟේ සැලෙන පොල් රුප්පාව　　මැද
හෝ ගා හඬන සාගර රැල්ලෙ　　නද
දෙපසට ඇදෙන දුම්රිය බස් පාර　　මැද
දෙව්මැඳුරක වරුණ පවසමි සබය　　මැද

අහස් කුසට උස් දෙව්　　මැඳුරේ
සක් පිඹිනා දෙව් දූතුවන්　　අතරේ
සුපිපුන ඇහැළ මල් ගස්　　අතරේ
සිරි විසිරේ සුදතුම් දෙව්　　මැඳුරේ

ගිනි දැල්වීමට ඉටි පහන්　　වැටී
අභිනවයෙන් ඉදිවූවා පහන්　　කුටී
දෙව් මැඳුරට ඉන් එළිය　　වැටී
සුසුමාණෙනි වඩින්න වඳිනෙමු දනින්　　වැටී

කිතු බොදු දනට පොදු පින්බර　　මාසේ
නැහැ භේද නම් මෙම ගම්　　පියසේ
අඳුරින් පිරි දන වසනා　　දේසේ
වඩින්න ශුද්ධාත්මෙනි සත් වරම් රැගෙන　　බෝසේ

**පී. බර්නාඩ් විල්ෆ්‍රඩ් ප්‍රනාන්දු**
**වාද්දුව**

# සඳවත නුඹයි...

සඳවත වගේ නුඹ
එළිය දෙයි නිතර මට
ඔබ පෙවූ කිරි
සුවඳ දැනී
හඬවයි මා
අම්මේ...
මගේ ලොවම ඔබ,
ජීවිතයේ හැඩ මතුකළේ
ඔබ
සුවඳ දුන් මුළු ලොව පුරා
නුඹේ සිහිනය මම දිනුවා
අම්මේ...

ඔබ නැතිදා මා හට
තනියක් නැහැ
නුඹේ ගුණ නිතරම
මම සිහිකර
හඬනා තුරු අම්මේ....

(ප්‍රිසිලා රාජපක්ෂගේ තෙමස් පූර්ණ සිහිකිරීම සඳහායි)

**අංජු රාජපක්ෂ**



කණුවන මීසම් සේවක ගරු ලෙස්ටර් නෝනිස් පියතුමාගේ සොහොයුරු කුමාර නෝනිස් මහතාගේ අවසන් කටයුතු දිව්‍ය පූජාවෙන් පසු කැපුන්ගොඩ සා. අන්තෝනි දෙව්මැඳුරු සුසාන භූමියේදී සිදු කළහ. එම දේහය නිවසේ තැන්පත් කර තිබූ අවස්ථාව සේයාරුවෙන් දැක්වේ. **(සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**



පමුණුගම මහවත්ත ශු. ජුසේ මුනිඳුන්ගේ මණ්ඩපයේදී පැවැති දිව්‍ය යාගයේදී පමුණුගම මීසම් සහයක ගරු රසික ලෝරන්ස් පියතුමා කම්කරු මෙවලම් මෙසේ ආසිරි ගැන්විය.
**( සේයා - පමුණුගම වාර්තාකරු)**



විල්ලෝරාවත්ත මීසම් පුතකු වූ ගරු සුනිල් හර්මන් පෙරේරා පියතුමා ස්වර්ගස්ථ වී වසර 25 පිරීම නිමිතිකර එතුමාගේ සමකාලීනයකු වූ කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දිව්‍ය පූජාවක් පැවැත්විණි. එහිදී සහයක රදගුරුහිමි ගරු පියතුමන්ගේ මෑණියන්ගේ සුව දුක් විමසූ අවස්ථාව සේයාරුවෙහි දැක්වේ.
**(සටහන - ට්‍රිසිල් ඇෆ්. මැන්දිස්)**

# සාම විනිසුරු පදවි ලබයි



වෙන්නප්පුවේ ජෙරාඩ් එලියස් පෙරේරා මහතා මුළු දිවයිනටම සාම විනිසුරු ලෙස නොබෝදා දිවුරුම් දුන්නේය.

වෙන්නප්පුව සා. ජෝශප් පිරිමි විදුහලෙන් සිංහල මාධ්‍යයෙන් හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා බෝලවලාන ගුරු විදුහලින් පුහුණුව ලබා ගුරු වෘත්තියට එක්විය. විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්, කොළඹ විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධියත් ලබා ජෝශප් වාස් විද්‍යාලයේ විදුහල්පති ධුරයටත් පසුව පුත්තලම අධ්‍යාපන කොට්ඨාශ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරයටත් පත්විය.

අධ්‍යාපන පරිපාලන සේවා විශ්‍රාමිකයකු වශයෙන් සිට ඉන්පසු වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 1991 - 1998 දක්වා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ලෙස ජනතා ඡන්දයෙන් පත් වී සේවය කළේය. හලාවත කතෝලික අධ්‍යාපන මණ්ඩලයේ සේවය කරන අතර සත් මඟ සඟරාවේ සංස්කාරක ද වේ.

විශ්‍රාමික ගුරු සංගම්, වැඩිහිටි සංගම් සහ අනෙකුත් ආගමික හා සමාජීය සමිති සමාගම්වල සභාපතිධුර දරමින් ජනතා සේවයේ යෙදෙන ඒ මහතාට ප්‍රදීප සුපැතුම්.

**(ජේ. එල්. සුනෙත් පින්තු)**

# කතෝලික ලේඛකයාගේ යුග දිවියේ 40 වසර



**ප්‍රකට කතෝලික ලේඛකයකු හා වාර්තාකරුවකු වන රාගම පේරලන්දේ පදිංචි ඩික්සන් සහ අයිරාංගනී ඇන්ටනි යුවළ සිය යුග දිවියේ 40 වසර සමරති.**

"ඥානාර්ථ ප්‍රදීපය" මාධ්‍යවේදියකු වශයෙන් දශක 4 කට වැඩි කලක සිට සේවය කරන ඩික්සන් "ළමා ප්‍රදීපය"ට ද ලේඛනයෙන් දායක වෙයි. "දිවයින" රාගම විශේෂ මාධ්‍යවේදී වශයෙන් 20 වසරක කාලයක සිට සේවය කරන අතර ජාතික කතෝලික ලේඛක හවුලේ ලේකම් ධුරය ද දැරූ "ලිව්සුරු" සම්මානලාභියෙකි. ශ්‍රී ලංකා ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ වසර 6 ක් (දෙවතාවකදී) ජාතික ලේකම් ධුරය දැරූ මොවුහු පිලිපීනයේ මැනිලාහි පැවති ක්‍රි.පවුල් ව්‍යාපාරයේ ආසියානු සමුළුවේ ශ්‍රී ලංකා නියෝජිතයන් හැටියට සග සැපත් ගරු හියුබට් පීරිස් පියතුමා සමඟ සහභාගි විය. වර්තමානයේ කොළඹ අගරදගුරු පදවි ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ වැඩ බලන ලේකම් ධුරය දරයි. අනුරාධපුරය ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ නිරීක්ෂක යුවළ හැටියට වසරක කාලයක් මාස්පතා සහභාගි වූහ. විසි වසරක කාලයක් කතෝලික ධර්මය පුහුණු ගුරුවරයකු වශයෙන් ද අනතුරුව දස වසරක් කතෝලික ධර්මය ගුරු උපදේශකයකු වශයෙන් ද සේවය කළ ඩික්සන් ඇන්ටනි දැනට ඉසිඹු ලබා ඇත.

අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි. හිමි අනුස්මරණ කමිටුවේ ලේකම් ධුරය හය වසරක් දැරූ හෙතෙම එහි වත්මන් මාධ්‍ය ලේකම් වරයා වෙයි. වසර 15 කට අධික කාලයක් "සෙත් සරණ" ආයතනයේ සජීවිකාවක ලෙස සේවය කර ඉසිඹු ලබා ඇති අයිරාංගනී ඇන්ටනි පේරලන්ද මීසමේ ධර්ම සේවා සභාවේද, දිව්‍ය හෘදය සමිතියේද සාමාජිකත්වය දරයි. කොළඹ අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාවේ විවාහාපේක්ෂක සමුළු කථික යුවළක් ලෙසද මොවුහු කටයුතු කරති. සිය එකම පුතු දිලුම් මධුරංග, ලේලිය ශ්‍රියානි මධුකා, සුචිත සහ තනුජ මුණුබුරන් සමඟ මෙම යුවළ අද විශ්‍රාම සුවයෙන් දිවි ගෙවති.

ඩික්සන් සහ අයිරාංගනී ඇන්ටනි යුවළට "ඥානාර්ථ ප්‍රදීපය" ද සුබාසිංසන පිරි නමයි.



බොරලැස්ස ශා. ආනා දේවස්ථානයේ නව මීසම් සේවක ලෙස ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමා මීසම් සේවයේ වැඩ භාර ගැනීම සඳහා පැමිණි අවස්ථාවේ බොරලැස්ස මීසමේ සේවය කළ ගරු නිශාන්ත ජානක පියතුමා විසින් උණුසුම්ව එතුමාව පිළිගත් අවස්ථාවයි මේ. ( **සේයා - අජිත් ශාන්ත, බොරලැස්ස)**



මීගමුව කඩොල් කැලේ, සා. ජෝශප් විද්‍යාලයේ ගරු ශ්‍රියන්ත රත්නසේකර පියතුමාගේ හා කොළඹ සා. ජෝශප් විද්‍යාලයේ සදාසරණ නිකායේ ගරු ඉනෝකා වසන්ති පැවිදි සොයුරියගේ ආදර දෙමාපියන් වන දොමිනික් - ඇලන් රත්නසේකර යුවළගේ 40 වන විවාහ සංවත්සර තුති පිදීමේ දිව්‍ය පූජාව පමුණුගම දෙව්මැඳුරේදී සිදුකළ අතර ඉන්පසුව තම පැවිදි දරු දෙපළ සමඟ රත්නසේකර යුවළ ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු සේයාරුවෙන් දැක්වේ.



කුරුකුලාව මීසම් සේවක ගරු ප්‍රසාද් පොන්නම්පෙරුම පියතුමා මීසමෙන් සමුගැනීමත් නව මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ෆොන්සේකා පියතුමා පිළිගැනීමත් වෙනුවෙන් තුති පිදීමේ දිව්‍ය යාගයක් පැවැත්විය. මේ එහි අවස්ථාවකි. ( **සටහන - පද්මිණී නානායක්කාර, සේයා - ඇලෝසියස් කල්දේරා)**

# ගිහි දූත යුවළකගේ යුග දිවි 40 සමරුවක්

**රත්නපුර මීසම් ධර්ම සේවා සභාවේ සාමාජිකත්වය දරමින් ගිහිදූත සේවි යුවළක් ලෙස කැපවීමෙන් සේවය කළ නෙල්සන් පෙරේරා - රීටා පෙරේරා යුවළගේ 40 වන විවාහ සංවත්සරය නිමිත්තෙන් දෙවි සමිඳුන්ට තුති පිදීමේ දේව මෙහෙයක් පවත්වනු ලැබීය.**



1972 දෙසැම්බර් මස 27 දින රත්නපුර රදගුරු පදවියේ දෙහිගහපිටිය සා. තෙරේසා මුනිවරියගේ දෙව්මැඳුරේදී ගරු ඩේවිඩ් විජේරත්න පියතුමා අතින් යුග දිවි වරම් ලැබූහ.

රාජ්‍ය සංස්ථාවල මෙන්ම මැද පෙරදිග ද සේවය කළ මේ යුවළ රත්නපුර කතෝලික සේවක සංගමය අවමංගල්‍යාධාර සමිතිය, කිතුදන පුබුදුව තුළින් අගනා සේවයක් ඉටු කළහ. එසේම ප්‍රදේශයේ සාමාජික සාමයික දේශපාලනික සමිති සමාගම්වල ප්‍රමුඛත්වය දරමින් අගනා සේවයක් ඉටු කර ඇත. ඥානාර්ථ ප්‍රදීපය, භක්ති ප්‍රබෝධනය වැනි කතෝලික පොත්, සඟරා මීසම් ජනතාවට බෙදා දීමේ කාර්යයටද උරදුන් නෙල්සන් පෙරේරා මහතා තම අදහස් නොබියව ප්‍රකාශ කිරීමට ප්‍රකටය.

මේ යුවළගේ 40 වන විවාහ සංවත්සරයේ දී පුතනුවන්ගේ හා දියණියගේ විවාහ සංවත්සර දෙක ද යෙදී තිබීම කැපී පෙණින. කළුතර කලමුල්ලේ යහපත් එඬේරා කන්‍යාරාමයේ ගරු පැට්‍රිෂියා පෙරේරා සොයුරිය රීටා පෙරේරා මහත්මියගේ වැඩිමහල් සොයුරිය වෙයි. දැනට පානදුර පදිංචි මෙම යුවළට නිරෝගී සුවය සමඟින් සුබාසිංසන.

**(තියබෝල්ඩ් සමරතුංග)**

**තේමාව - දෙවිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක.**
**124 ජුබිලි ප්‍රකාශන මංගල්‍යය - 2013**
**දයානුකම්පාලා දේවමාතා දෙව්මැඳුර**
**බණ්ඩාරවත්ත, සීදුව**

**කොඩිගස එසවීම - 2013. 05. 16 සවස 5.00 ට**
**ඉන්පසු මළවුන් වෙනුවෙන් දිව්‍ය පූජාව සිදුකෙරේ.**
**17 වනදා සිට 24 දා දක්වා නුවානය සවස 6.45 ට සිදුකෙරේ.**
**දේශක - ගරු රොෂාන් තිසේරා පියතුමා (පැ.තු.නි.)**

**සන්ධ්‍යා මෙහෙය**
**25 සෙනසුරාදා සවස 7.30 ට**
*ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.*

**මංගල්‍ය දින 26 ඉරිදා - උදේ 6.00 ට දිව්‍ය පූජාව**
**මංගල්‍යය මහා ගායනා දිව්‍ය පූජාව උදේ 7.30 ට**
*කොළඹ උතුරු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරේ.*
**දිව්‍ය පූජාවෙන් පසු ග්‍රාමය වටා පෙරහර**
**27 සඳුදා දින සවස 6.30 ට ස්තුති දිව්‍ය පූජාව**
**ධර්මසේවා සභාව සමඟ මීසම් සේවක පියවරුන් වන ඇන්ටන් ප්‍රේමලාල්, විරෝන් අජිත්, ජෝන් හෙට්ටිආරච්චි පියතුමන්**

(Q13N1147)